# පාලි භාෂාව

## ගුරු මාර්ගෝපදේශය

## 13 ශ්‍රේණිය

(2018 වර්ෂයේ සිට ක්‍රියාත්මක වේ.)

සම්භාව්‍ය භාෂා හා විදේශ භාෂා අංශය

ජාතික අධ්‍යාපන ආයතනය

ශ්‍රී ලංකාව

වෙබ් අඩවිය : www.nie.lk

විද්‍යුත් තැපැල : info@nie.lk

පාලි භාෂාව

ගුරු මාර්ගෝපදේශය

13 ශ්‍රේණිය

ප්‍රථම මුද්‍රණය - 2018

© ජාතික අධ්‍යාපන ආයතනය

ISBN

සම්භාව්‍ය භාෂා හා විදේශ භාෂා අංශය

ජාතික අධ්‍යාපන ආයතනය

ශ්‍රී ලංකාව

**වෙබ් අඩවිය** : www.nie.lk

**විද්‍යුත් තැපැල** : info@nie.lk

මුද්‍රණය

ජාතික අධ්‍යාපන ආයතනය

## අධ්‍යක්ෂ ජනරාල්තුමියගේ පණිවිඩය

ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් නිර්දේශිත ජාතික අධ්‍යාපන අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ පොදු නිපුණතා සංවර්ධනය කිරීමේ මූලික අරමුණ සහිත ව එවකට පැවති අන්තර්ගතය පදනම් වූ විෂයමාලාව නවීකරණයට භාජනය කොට වර්ෂ අටකින් යුතු චක්‍රයකින් සමන්විත නව නිපුණතා පාදක විෂයමාලාවෙහි පළමු අදියර වර්ෂ 2007 දී ජාතික අධ්‍යාපන ආයතනය විසින් ශ්‍රී ලංකාවේ ප්‍රාථමික හා ද්විතීයික අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දෙන ලදි.

පර්යේෂණවලින් අනාවරණය වූ කරුණු ද අධ්‍යාපනය පිළිබඳ ව විවිධ පාර්ශ්වයන් ඉදිරිපත් කළ යෝජනා ද පදනම් කොට ගෙන සිදු කරන ලද විෂයමාලා තාර්කීකරණය කිරීමේ ක්‍රියාවලියක ප්‍රතිඵලයක් ලෙස විෂයමාලා චක්‍රයේ දෙවැනි අදියර අධ්‍යාපන ක්ෂේත්‍රයට හඳුන්වා දීම 2015 වසරේ සිට ආරම්භ කර ඇත.

මෙම තාර්කීකරණ ක්‍රියාවලියේ දී සියලු ම විෂයයන්ගේ නිපුණතා, පදනම් මට්ටමේ සිට උසස් මට්ටම දක්වා ක්‍රමානුකූල ව ගොඩනැගීම සඳහා පහළ සිට ඉහළට ගමන් කරන සිරස් සංකලනය භාවිත කර ඇති අතර විවිධ විෂයයන්හි දී එක ම විෂය කරුණු නැවත නැවත ඉදිරිපත් වීම හැකි තාක් අවම කිරීම, විෂය අන්තර්ගතය සීමා කිරීම සහ ක්‍රියාත්මක කළ හැකි ශිෂ්‍ය මිත්‍ර විෂයමාලාවක් සැකසීම සඳහා තිරස් සංකලනය ද භාවිත කර ඇත.

ගුරු භවතුන්ට පාඩම් සැලසුම් කිරීම, ඉගෙනුම්- ඉගැන්වීම් ක්‍රියාවලියෙහි සාර්ථක ව නිරතවීම, පන්ති කාමර මිනුම් හා ඇගයීම් ප්‍රයෝජනවත් පරිදි යොදා ගැනීම සඳහා අවශ්‍ය වන මාර්ගෝපදේශ ලබා දීමේ අරමුණින් නව ගුරු මාර්ගෝපදේශ හඳුන්වා දී ඇත. පන්ති කාමරය තුළ දී වඩාත් ඵලදායී ගුරුවරයෙකු ලෙස කටයුතු කිරීමට මෙම මාර්ගෝපදේශ උපකාරී වනු ඇත. සිසුන්ගේ නිපුණතා වර්ධනය කිරීම සඳහා ගුණාත්මක යෙදවුම් හා ක්‍රියාකාරකම් තෝරා ගැනීමට ගුරුවරුන්ට අවශ්‍ය නිදහස මෙමගින් ලබා දී තිබේ. එමෙන් ම නිර්දේශිත පාඨ ග්‍රන්ථවල ඇතුළත් වන විෂය කරුණු පිළිබඳ ව වැඩි බර තැබීමක් මෙම ගුරු මාර්ගෝපදේශවල අන්තර්ගත නොවේ. එම නිසා මෙම ගුරු මාර්ගෝපදේශය වඩාත් ඵලදායීවීමට නම් අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව විසින් සකසා ඇති අදාළ පාඨ ග්‍රන්ථ සමග සමගාමී ව භාවිත කිරීම අත්‍යවශ්‍ය වේ.

තාර්කීකරණය කරන ලද විෂය නිර්දේශ, නව ගුරු මාර්ගෝපදේශ හා නව පාඨ ග්‍රන්ථවල මූලික අරමුණු වන්නේ ගුරු කේන්ද්‍රීය අධ්‍යාපන රටාවෙන් මිදී ශිෂ්‍ය කේන්ද්‍රීය අධ්‍යාපන රටාවක් හා වඩාත් ක්‍රියාකාරකම් මත පදනම් වූ අධ්‍යාපන රටාවකට එළඹීම මගින් වැඩ ලෝකයට අවශ්‍ය වන්නා වූ නිපුණතා හා කුසලතාවන්ගෙන් යුක්ත මානව සම්පතක් බවට ශිෂ්‍ය ප්‍රජාව සංවර්ධනය කිරීමයි.

නව විෂය නිර්දේශ සහ ගුරු මාර්ගෝපදේශ සම්පාදනය කිරීමේ දී ජාතික අධ්‍යාපන ආයතනයේ ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලයේ ද ආයතන සභාවේ ද රචනයේ දී දායකත්වය ලබා දුන් සියලු ම සම්පත් දායකයින් හා වෙනත් පාර්ශවයන්ගේ ද ඉමහත් කැපවීම ඇගයීමට ද මෙය අවස්ථාවක් කරගනු කැමැත්තෙමි.

**ආචාර්ය ජයන්ති ගුණසේකර,**
**අධ්‍යක්ෂ ජනරාල්,**
**ජාතික අධ්‍යාපන ආයතනය,**
**මහරගම.**

## නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය

මිනිසා විධිමත් අධ්‍යාපන ක්‍රියාවලියට යොමු වූයේ අනාදිමත් කලක සිට ය. අධ්‍යාපන පරමාර්ථ, ඉගෙනුම් ක්‍රමශිල්ප පිළිබඳ එදා මෙදා තුර විවිධ ප්‍රවේශ ඔස්සේ කර ඇති අනාවරණ ද අතිමහත් ය. කෙසේ වුව ද අධ්‍යාපනයේ පොදු අපේක්ෂාව පූර්ණ පෞරුෂයකින් හෙබි පුද්ගලයකු තැනීමයි. මේ සඳහා අවශ්‍ය දැනුම, ආකල්ප, කුසලතා, සමාජමය දක්ෂතාවන්ගෙන් පිරිපුන් සිය විභව ශක්ති මතු කරගත් පුද්ගලයකු නිර්මාණයට උචිත අධ්‍යාපන පුරෝගාමී මෙහෙවර ඉටු කිරීමට අප ආයතනය දායක වේ.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ නිරත ගුරුවරුන් අධ්‍යාපන අරමුණු, ඉගෙනුම් ක්‍රියාවලිය, ඇගයීම යන අවස්ථා ත්‍රිත්වය කෙරෙහි ම එක සේ අවධානය යොමු කළ යුතු ය. ඒ සඳහා අවශ්‍ය මග පෙන්වීම මෙම ගුරු මාර්ගෝපදේශයෙන් සැපයේ. එය ආදර්ශයට ගෙන ඔබට අනන්‍ය, සාර්ථක ශිෂ්‍ය කේන්ද්‍රීය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියක් සැලසුම් කර ගැනීමට ඔබට හැකියාව ඇත.

ශිෂ්‍ය සංවර්ධනය, ගුරු සංවර්ධනය, පද්ධතියට නව දැනුම සම්පාදනය ආදී විවිධ අපේක්ෂණ පෙරදැරි ව ගුරුවරයා පර්යේෂණ කාර්යයට යොමු වීම ද අත්‍යවශ්‍ය වේ. සෑම සාර්ථක ගුරුවරයෙක් ම සාර්ථක පර්යේෂකයෙක් ද වේ. ඔබ දැනටමත් සිදුකරනු ලබන පර්යේෂණ කාර්යය වඩාත් විධිමත් ව සිදු කිරීමට යොමු වීම කාලීන අවශ්‍යතාවකි. එහි දී අවශ්‍ය මගපෙන්වීම් සඳහා අපගේ දායකත්වය ද ලබාගත හැකි ය.

ගුරුවරයා ඍෂිවරයෙකි. සිසුවා පිළිබඳ තුන්කල් දැක්මක් ගුරුවරයා සතු වේ. ගුරුවරයා විටෙක පෙරගමන්කරුවෙකි. විටෙක පසුගමන්කරුවෙකු වන අතර තවත් විටෙක එක් ව පියනගන්නෙකි. මේ මනා වැටහීමෙන් හා ආකල්පමය ගුණ වගාවෙන් යුතු ව කටයුතු කරන නිපුණ ගුරුවරයෙකු ලෙස; සිසු විවිධතා සැලකිල්ලට ගෙන සිසු නිපුණතා සංවර්ධනයට අවශ්‍ය උසස් ඉගෙනුම් ක්‍රමශිල්ප භාවිතයට ගනු ලබන, වගකීමෙන් හා වගවීමෙන් කටයුතු කරන ගුරුවරයෙකු වීමට ඔබට තව තවත් ශක්තිය ලැබේවා !

සංගීත විශාරද, ශාස්ත්‍රපති සුදත් සමරසිංහ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්,
ගුරු අධ්‍යාපන හා විකල්ප අධ්‍යාපන පීඨය

## විෂයමාලා කමිටුව

**උපදේශකත්වය හා අනුමැතිය** - ශාස්ත්‍රීය කටයුතු මණ්ඩලය, ජාතික අධ්‍යාපන ආයතනය.

**විෂය විශේෂඥ උපදේශනය** - **මහාචාර්ය නාබිරිත්තන්කඩවර ඤාණරතන හිමි.** පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය.

**විෂය සම්බන්ධීකරණය** - **පූජ්‍ය තෙරිපැහැ මේධංකර හිමි** (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය), (අධ්‍යයන අංශප්‍රධාන) ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම.

**ලේඛක මණ්ඩලය** -

**අභ්‍යන්තර ලේඛක මණ්ඩලය**

01 **පූජ්‍ය තෙරිපැහැ මේධංකර හිමි** (ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය), රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති (විශිෂ්ට පන්ති) පශ්චාද් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා (විශිෂ්ට පන්ති), පශ්චාද් උපාධි උපදේශන ඩිප්ලෝමා, අධ්‍යාපනපති, ජාතික අධ්‍යාපන ආයතනය, මහරගම.

**බාහිර ලේඛක මණ්ඩලය**

(1) **මහාචාර්ය පූජ්‍ය නාබිරිත්තන්කඩවර ඤාණරතන හිමි**, රාජකීය පණ්ඩිත, බී. ඒ. (ගෞරව), එම්. ඒ, පී.එච්.ඩී. (දිල්ලි), පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය.

(2) **මහාචාර්ය පූජ්‍ය මකුරුප්පේ ධම්මානන්ද හිමි**, රාජකීය පණ්ඩිත, බී. ඒ. (ගෞරව), එම්. ඒ, (කැලණිය) එම්. ඒ. (බෞ.පා) පී.එච්.ඩී. (දිල්ලි), පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, කැලණිය.

(3) **පූජ්‍ය බණ්ඩාරවෙල රතනසාර හිමි** (පාලි විෂය උපදේශක - පිරිවෙන්) රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති, පිරිවෙන් ශාඛාව, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය.

(4) **ආර්.ඒ. විමල් ප්‍රේමතිලක මයා** (කථිකාචාර්ය), ශාස්ත්‍රවේදී (ගෞරව), ශාස්ත්‍රපති, පශ්චාද් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා, සීතාවකපුර පිරිවෙන් ගුරු අභ්‍යාස ආයතනය, අවිස්සාවේල්ල.

(5) **කේ.ඒ. සුමිත් ධර්මශ්‍රී මයා** (පරිවේණාචාර්ය), රාජකීය පණ්ඩිත, ශාස්ත්‍රපති, පශ්චාද් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා, කෑ/ මාව/ කීර්ති ශ්‍රී රාජසිංහ විද්‍යායතන පිරිවෙණ, දියසුන්නත, රඹුක්කන.

(7) **ඩී.එම්.එස්. දිසානායක මයා** (පරිවේණාචාර්ය), ශාස්ත්‍රවේදී (ගෞරව), ශාස්ත්‍රපති, අ/ශ්‍රී විද්‍යාධාර මහ පිරිවෙණ, කලාකරඹෑව.

**පරිගණක වදන් සැකසුම**

**ආර්.ඒ. විමල් ප්‍රේමතිලක මයා** (කථිකාචාර්ය), ශාස්ත්‍රවේදී (ගෞරව), ශාස්ත්‍රපති, පශ්චාද් උපාධි අධ්‍යාපන ඩිප්ලෝමා, සීතාවකපුර පිරිවෙන් ගුරු අභ්‍යාස ආයතනය, අවිස්සාවේල්ල.

**කවර නිර්මාණය**

පූජ්‍ය ඇගල්ලේ ධම්මානන්ද හිමි, ශ්‍රී ජිනවංශ අනුස්මරණ භාවනා මධ්‍යස්ථානය, නවගහ ඇල, නුවරගල, පොලොන්නරුව.

## ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස්

මෙම ගුරු මාර්ගෝපදේශය, අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ 13 ශ්‍රේණියට අදාළ පාලි විෂය, නිපුණතා පාදක ව පාසල් හා පිරිවෙන් තුළ ක්‍රියාත්මක කිරීම සඳහා ඔබට මඟ පෙන්වයි. පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ගුරුවරයා තුළ ධනාත්මක වූත් ප්‍රබෝධාත්මක වූත් සිතුවිලි හා ක්‍රියාකාරකම් නොමැති නම් 'උල්පතට ඉහළින් ගඟ නො ගලන්නාක් මෙන් ' අධ්‍යාපන ප්‍රතිසංස්කරණවලින් අපේක්ෂිත ප්‍රතිඵල ලබා ගත නොහැක. ඒ අනුව අධ්‍යාපන ක්ෂේත්‍රයේ වටිනාම සම්පත වූ ගුරු සම්පතට අයත් ඔබගේ උද්‍යෝගය මත මෙම ගුරු මාර්ගෝපදේශයේ උපදෙස් ප්‍රායෝගික වනු ඇත. ඒ අනුව මෙම ගුරු මාර්ගෝපදේශය මුල සිට (අධ්‍යක්ෂ ජනරාල්ගේ පණිවිඩයේ සිට) සැලකිල්ලෙන් කියවා හොඳින් අවබෝධ කර ගැනීම අත්‍යවශ්‍ය වේ.

2007 වර්ෂයේ සිට ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන නිපුණතා පාදක ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය පිළිබඳ ගුරුවරයෙකු ලෙස ඔබ ඇතැම්විට හොඳ අවබෝධයක් ලබා ඇත. යම් විෂයයක් පිළිබඳ සිසුන් නිපුණයින් වීමට නම් ඇසීම, දැකීම හා කිරීම යන අංශ තුනෙහි ම ක්‍රියාකාරී ව යෙදිය යුතු ය. උගත් දේවල් ප්‍රායෝගික ජීවිතයේ දී සුසංයෝගී ව යොදා ගැනීමේ හැකියාව ඇත්නම් ඔහු නිපුණයෙකි.

2018 වර්ෂයේ සිට ක්‍රියාත්මක කිරීම සඳහා ඔබ අතට ලබා දෙන මෙම ගුරු මාර්ගෝපදේශය පරිශීලනය කර, දරුවන් විභාගයෙන් සමත් කරවීම ම පමණක් එක ම අරමුණ නොවිය යුතු ය. ඔබගේ ඉගෙනුම් ඉගැන්වීම් කාර්යයෙන් ශ්‍රේෂ්ඨ ගණයේ පුරවැසියෙකු බිහි කිරීම ප්‍රධාන අරමුණ විය යුතු අතර විශිෂ්ට ලෙස විභාග සමත් වීම සිසුන් ලබන අතිරේක ප්‍රතිලාභයක් වනු ඇත. අධ්‍යාපනයෙන් විභාග සමත් වීමේ නිපුණතාව නොව ධාර්මික ජීවිතයක් ගත කිරීමේ නිපුණතාව ඇති කළ යුතු ය.

පාලි විෂය නිර්දේශය තුළ 13 ශ්‍රේණිය සඳහා නිපුණතා 10ක් දක්වා ඇති අතර පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ පහසුව සඳහා ඒවා නිපුණතා මට්ටම් (පියවර) 26කට බෙදා ඇත. මෙම මට්ටම් 26 සඳහා ගුරු මාර්ගෝපදේශයේ පාඩම් ඒකක 27ක් දක්වා ඇත. සෑම ආදර්ශ පාඩම් ඒකකයක් ම ඉගෙනුම් පල ගණනාවකින් සමන්විත වන අතර එම ඉගෙනුම් පල අත් කර ගත හැකි ආකාරයට ඉගෙනුම් ඉගැන්වීම් කාර්යය පන්ති කාමරය තුළ සිදු කළ යුතු ය. ගුණාත්මක යෙදවුම් භාවිත කරමින් යෝජිත කාලය තුළ අදාළ විෂය කරුණු ග්‍රහණය කරගැනීමෙන් පසු සිසුන්ට ඉගෙනුම් පල අත් කර ගැනීමට හැකි වූ ප්‍රමාණය තක්සේරුකර බැලීම ද පාඩම් ඒකකය අවසානයේ සිදු විය යුතු ය.

පන්ති කාමර ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දි සිසුන්ට හා පන්තියට උචිත පරිදි වඩාත් නිර්මාණශීලී ක්‍රමයක් භාවිත කිරීමට ගුරුභවතාට නිදහස ඇති අතර සිසුන්ගේ නිපුණතා තව දුරටත් සංවර්ධනය වීම සඳහා වැඩි දුර ගවේෂණයට යොමු කළ යුතු ය. මෙම ගුරු මාර්ගෝපදේශය තුළ කාලච්ඡේද ගණනය කර ඇත්තේ විෂය අන්තර්ගතය පිළිබඳ සැලකිලිමත් වෙමිනි. වර්ෂයට නියමිත කාලච්ඡේද සංඛ්‍යාව නොයික්මවන පරිදි පාඩම් ඒකකවලට යොදා ඇති කාලච්ඡේද සංශෝධනය කර ගැනීමට හා පන්ති කාලසටහනට අනුව පාඩම් ඒකක කළමනාකරණය කර ගැනීමට ඔබට අවකාශ ඇත. ගුරු මාර්ගෝපදේශය අවසානයේ දක්වා ඇති තක්සේරු හා ඇගයීම් ක්‍රියාවලියට අදාළ නිදර්ශක ආධාරකය ගුරු කොට නිපුණතා 10 ආවරණය වන පරිදි 13 ශ්‍රේණියේ දී ඇගයීම් 06ක් සිදු කළ යුතු ය. ඒ සඳහා විස්තර පාසල පදනම් කර ගත් තක්සේරුකරණය කොටසේ දක්වා ඇත.

රාජකීය පණ්ඩිත, අධ්‍යාපනපති පූජ්‍ය තෙරිපැහැ මේධංකර හිමි.
(ව්‍යාපෘති ප්‍රධාන හා අධ්‍යයන අංශ ප්‍රධාන)

# පටුන


| | | පිටු අංකය |
|---|---|---|
| 01 | අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | iii |
| 02 | නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල්තුමාගේ පණිවිඩය | iv |
| 03 | විෂයමාලා කමිටුව | v |
| 04 | ගුරු මාර්ගෝපදේශය පරිශීලනය සඳහා උපදෙස් | vi |
| 05 | පටුන | vii |
| 06 | විෂය හැඳින්වීම | ix |
| 07 | ජාතික අරමුණු | x |
| 08 | මූලික නිපුණතා | xi |
| 09 | විෂය අධ්‍යයනයේ අරමුණු | xiii |
| 10 | විෂය නිර්දේශය පාසල් වාර වශයෙන් බෙදාගැනීමට යෝජිත සැලැස්ම | xiv |
| 11 | විෂය නිර්දේශය | xv |
| 12 | පාසල් ප්‍රතිපත්ති හා වැඩසටහන් සංවිධානය | xxii |
| 13 | තක්සේරුව හා ඇගයීම | xxiii |
| 14 | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය | xxiv |
| 15 | 1. ඒකකය - සුවිශේෂී නාම වරනැගීම | 01 |
| 16 | 2. ඒකකය - සංඛ්‍යා නාම වරනැගීම | 03 |
| 17 | 3. ඒකකය - සර්වනාම වරනැගීම | 05 |
| 18 | 4. ඒකකය - තද්ධිත පද සාධනය | 07 |
| 19 | 5. ඒකකය - කිතක පද සාධනය | 09 |
| 20 | 6. ඒකකය - ධාතු ගණ හා ආඛ්‍යාත වරනැගීම | 11 |
| 21 | 7. ඒකකය - ප්‍රයෝජ්‍ය ක්‍රියා භාවිතය | 13 |
| 22 | 8. ඒකකය - අතිරේක පද භාවිතය | 15 |
| 23 | 9. ඒකකය - රචනා ලිවීම | 17 |
| 24 | 10. ඒකකය - සාම්ප්‍රදායික භාෂා ප්‍රයෝග භාවිතය | 19 |
| 25 | 11. ඒකකය - සාමීචි කථා | 21 |
| 26 | 12. ඒකකය - සමිති කථා | 24 |
| 27 | 13. ඒකකය - උච්චාරණය හා ස්මරණය | 26 |
| 28 | 14. ඒකකය - මහාවග්ගය (මහාඛන්ධක) | 28 |
| 29 | 15. ඒකකය - අපදානපාළි (වක්කලිත්ථෙරාපදාන) | 30 |
| 30 | 16. ඒකකය - මහාවංසය | 32 |
| 31 | 17. ඒකකය - අනිර්දිෂ්ට පරිවර්තන | 34 |
| 32 | 18. ඒකකය - අර්ථාවබෝධය | 36 |
| 33 | 19. ඒකකය - හරධර්ම චරිතායනය | 38 |
| 34 | 20. ඒකකය - රසවින්දනය හැඳින්වීම | 40 |
| 35 | 21. ඒකකය - කාව්‍යෝක්ති | 41 |
| 36 | 22. ඒකකය - සාහිත්‍යාත්මක වාක්‍ය රචනය | 42 |
| 37 | 23. ඒකකය - බෞද්ධ සංස්කෘතිය | 43 |
| 38 | 24. ඒකකය - වංසකථා | 45 |
| 39 | 25. ඒකකය - බුද්ධචරිත කාව්‍යය | 46 |
| 40 | 26. ඒකකය - ධර්මාර්ථ විවරණය | 47 |
| 41 | 27. ඒකකය - ව්‍යාකරණ විවරණය | 49 |
| 42 | තක්සේරුව හා ඇගයීම - හැඳින්වීම | 52 |
| 43 | ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමේ නිදර්ශක ආධාරකය | 54 |

# 13 ශ්‍රේණිය

# පාලි

## විෂය නිර්දේශය

# විෂය හැඳින්වීම

පාලි භාෂාව බුදුසමයත් සමඟ ශ්‍රී ලංකාවට ලැබුණු දායාදයකි. ශ්‍රී ලාංකේය අනන්‍යතාව ගොඩනැගීමට බුදු සමයෙන් සැලසී ඇත්තේ මාහැඟි සේවයකි. ශ්‍රී ලංකාව අදටත් ලෝකයේ සම්භාවනාවට පාත්‍ර වන්නේ මුල් බුදුසමය යැයි සැලකෙන පාලි ත්‍රිපිටකය සුරක්ෂිත ව පවත්නා දේශයක් වශයෙනි. ලෝකයේ අන් රටකට නොදෙවැනි අපගේ ඉතිහාසයත්, සම්භාව්‍ය සාහිත්‍යයත් ලියවී ඇත්තේ ද පාලි භාෂාවෙනි. යමෙකුට පාලි භාෂාඥානය නො අඩුව තිබේ නම් ඔහු හෝ ඇය බුදුසමය පිළිබඳ හසල දැනුමක් ඇත්තෙකැයි නො අනුමාන ව ම ගෞරවාදරයට පාත්‍ර වෙයි.

පාලි භාෂාවෙන් ලියැවී ඇති ප්‍රධානතම ලේඛන සමුදාය වන්නේ පාලි ත්‍රිපිටකයයි. එය ආගමික සාහිත්‍යයක් පමණක් ම නොව සාමකාමී සදාචාර සම්පන්න ජීවන මාර්ගයක් ද වෙයි. බුදුන් වහන්සේ ඇතුළු ආර්යයන් වහන්සේලාගේ ජීවන චරිත හා අභිසමාචාරයන් තත් වූ පරිද්දෙන් ජනවහරින් ම ලියැවුණු පාලි ත්‍රිපිටකය තරම් අන් කිසිදු ලේඛනයක් වෙතැයි සිතිය නොහැක.

ක්‍රිස්තු පූර්ව යුගය තරම් ඈතට දිවෙන පාලි අට්ඨකථා සාහිත්‍යය ලංකා ඉතිහාසයේ දීර්ඝ කාලපරිච්ඡේදයක් ආවරණය කරන්නකි. ධර්මයත් ඉතිහාසයත් සංස්කෘතියත් මේවායෙහි කදිමට සනිටුහන් ව ඇත. කෙනෙකුට බුදුසමය මැනවින් තේරුම් ගැනීමට හැකි වන්නේ මෙකී පාලි අට්ඨකථා කියවා අවබෝධ කර ගත හැකි නම් පමණි. ලංකා ඉතිහාසය පෝෂණය කළ පාලි අට්ඨකථා ලියා ඇත්තේ විවිධ භාෂා හා සමය සම්ප්‍රදායයන් පිළිබඳ ප්‍රවීණත්වයක් දැරූ මහාප්‍රාඥයන් විසින් වන බැවින් ඔවුන්ගේ දැනුම් සම්භාරය ඉස්මතු කර ගත හැකි වන්නේ ද පාලි භාෂාව දන්නේ නම් පමණි.

සිංහල භාෂාවේ මව්බසක් ලෙස පාලිය හඳුන්වනු ලබයි. පුරාතන ලංකා ඉතිහාසයේ යමක් ලේඛනගත වී නම් එය බොහෝ විට සිදු වී ඇත්තේ පාලි හෝ ප්‍රාකෘත භාෂාවලිනි. පැරණි ඉන්දු ආර්ය භාෂාවක් වන සංස්කෘත භාෂාව හා නූතන ආර්ය භාෂාවක් වන සිංහල අතර සම්බන්ධීකාරක භාෂාව වන්නේ පාලියයි. අද අප ව්‍යවහාර කරන බොහොමයක් වචන පාලි හෝ ඊට ආසන්න ඒවා ය. එබැවින් පාලි ඉගෙනීමෙන් පහසුවෙන් ම සිංහල භාෂාව පිළිබඳ ප්‍රවීණත්වයක් ලබා ගත හැකි බව නොරහසකි. පාලි භාෂාව අපගේ සංස්කෘතික උරුමයක් ද වෙයි. ජාතික අනන්‍යතාව පමණක් නොව දේශමාමකත්වය ගොඩ නැගූ මෙරට වංසකථා ලියා තිබෙන්නේ ද පාලි භාෂාවෙනි. ඒවා හුදු ඉතිහාසයක් දක්වන ග්‍රන්ථ පමණක් නොව සම්භාව්‍ය සාහිත්‍යයක් ලෙස ද වැදගත් වෙයි. ශෘංගාර ආදි ලෞකික සාහිත්‍ය රස ජනනයෙහි ලා වැඩි සැලකිල්ලක් නොදක්වා යථාර්ථවාදී ලෙස ජීවිතය දෙස බලන්නට පාලි රචනා උත්සාහ කොට ඇත. ලෝකයේ මෙතෙක් ව්‍යවහාරයට පත් ගීතවත් භාෂා අතර පාලියට හිමිවන්නේ ප්‍රමුඛස්ථානයකි. පාලි පිරිත් හා ගාථා සජ්ඣායනාවන්ට සවන් දීමෙන් ඒ බව වටහා ගත හැකි ය. පාලි භාෂාවට ව්‍යාකරණ සාහිත්‍යයක් ද ඇත. සංස්කෘත ශබ්ද ශාස්ත්‍ර පරිශීලනයෙන් පාලි ව්‍යාකරණය ගොඩනගා ඇතත් පාලියට ම ආවේණික වූ අනන්‍යතාවක් ද ඇත. එහි බුද්ධදේශනා පදනම් කොට ගෙන සැකසී ඇති පාලි ව්‍යාකරණය වෙනත් ව්‍යාකරණ සම්ප්‍රදායන් මෙන් නොව භාවිත ව්‍යවහාරයට ඉතාමත් සමීප වෙයි. මීට අතිරේක වශයෙන් වන ඡන්දෝලංකාර ක්ෂේත්‍රය ද සලකා බලන විට අවශ්‍ය කරන අංග ලක්ෂණ සියල්ලකින් සමන්විත වූවක් ලෙස පාලි භාෂාව හැඳින්විය හැකි ය.

# ජාතික අරමුණු

පුද්ගලයාට හා සමාජයට අදාළ වන ප්‍රධාන ජාතික අරමුණු කරා ළඟා වීම සඳහා පුද්ගලයන්ට සහ කණ්ඩායම්වලට ජාතික අධ්‍යාපන පද්ධතියට සහාය විය යුතු ය.

වසර ගණනාවක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ ප්‍රධාන අධ්‍යාපන වාර්තා සහ ලේඛන මගින් පුද්ගල හා ජාතික අවශ්‍යතාවන් සපුරාලීම සඳහා අරමුණු නියම කරනු ලැබී ය. සමකාලීන අධ්‍යාපන ව්‍යුහයන් හා ක්‍රියාවලීන් තුළ දැකිය හැකි දුර්වලතා නිසා ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව ඇතුළත අධ්‍යාපනය තුළින් ළඟා කරගත යුතු පහත දැක්වෙන අරමුණු ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් හඳුනාගෙන ඇත. මෙම අරමුණු සපුරාගැනීම, අධ්‍යාපන පද්ධතිය සඳහා වූ තම ඉදිරි දැක්ම ලෙසට ජාතික අධ්‍යාපන කොමිෂන් සභාව විසින් ප්‍රත්‍යක්ෂ කොට ගෙන ඇත.

I මානව අභිමානයට ගරු කිරීමේ සංකල්පයක් මත පිහිටා ශ්‍රී ලාංකික බහුවිධ සමාජයේ සංස්කෘතික විවිධත්වය අවබෝධ කරගනිමින් ජාතික ඒකාබද්ධතාව, ජාතික සෘජු ගුණය, ජාතික සමගිය, එකමුතුකම සහ සාමය ප්‍රවර්ධනය කිරීම තුළින් ජාතිය ගොඩනැගීම සහ ශ්‍රී ලාංකේය අනන්‍යතාව තහවුරු කිරීම

II වෙනස් වන ලෝකයක අභියෝගයන්ට ප්‍රතිචාර දක්වන අතර ජාතික උරුමයේ මාහැඟි දායාදයන් හඳුනාගැනීම සහ සංරක්ෂණය කිරීම

III මානව අයිතිවාසිකම් ගරු කිරීම, යුතුකම් හා වගකීම් පිළිබඳ දැනුවත් වීම, හෘදයංගම බැඳීමකින් යුතු ව එකිනෙකා කෙරෙහි සැලකිලිමත් වීම යන ගුණාංග ප්‍රවර්ධනය කිරීමට ඉවහල් වන සමාජ සාධාරණත්ව සම්මතයන් සහ ප්‍රජාතන්ත්‍රික ජීවන රටාවක් ගැබ් වූ පරිසරයක් නිර්මාණ කිරීම සහ පවත්වා ගෙන යාමට සහාය වීම

IV පුද්ගලයන්ගේ මානසික හා ශාරීරික සුව සම්පත් සහ මානව අගයයන්ට ගරු කිරීම මත පදනම් වූ තිරසාර ජීවන ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම

V සුසමාහිත වූ සමබර පෞරුෂයක් සඳහා නිර්මාණ හැකියාව, ආරම්භක ශක්තිය, විචාරශීලී චින්තනය, වගකීම හා වගවීම ඇතුළු වෙනත් ධනාත්මක අංගලක්ෂණ සංවර්ධනය කිරීම

VI පුද්ගලයාගේ සහ ජාතියේ ජීවගුණය වැඩිදියුණු කෙරෙන සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා දායක වන ඵලදායි කාර්යයන් සඳහා අධ්‍යාපනය තුළින් මානව සම්පත් සංවර්ධනය කිරීමය

VII ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයක් තුළ සිදු වන වෙනස්කම් අනුව හැඩගැසීමට හා ඒවා පාලනය කරගැනීමට පුද්ගලයින් සූදානම් කිරීම සහ සංකීර්ණ හා අනපේක්ෂිත අවස්ථාවන්ට සාර්ථකව මුහුණ දීමේ හැකියාව වර්ධනය කිරීම

VIII ජාත්‍යන්තර ප්‍රජාව අතර ගෞරවණීය ස්ථානයක් හිමි කරගැනීමට දායක වන යුක්තිය, සමානත්වය සහ අන්‍යෝන්‍ය ගරුත්වය මත පදනම් වූ ආකල්ප හා කුසලතා පෝෂණය කිරීම

( උපුටා ගැනීම 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව )

# මූලික නිපුණතා

අධ්‍යාපනය තුළින් වර්ධනය කෙරෙන පහත දැක්වෙන මූලික නිපුණතා ඉහත සඳහන් ජාතික අරමුණු මුදුන්පත් කරගැනීමට දායක වනු ඇත.

**(I) සන්නිවේදන නිපුණතා**

සාක්ෂරතාව, සංඛ්‍යා පිළිබඳ දැනුම, රූපක භාවිතය සහ තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය යන අනුකාණ්ඩ 4ක් මත සන්නිවේදන නිපුණතා පදනම් වේ.

| | |
|---|---|
| සාක්ෂරතාව | : සාවධාන ව ඇහුම්කන් දීම, පැහැදිලි ව කථා කිරීම, තේරුම් ගැනීම සඳහා කියවීම, නිවැරදි ව සහ නිරවුල් ව ලිවීම, ඵලදායි අයුරින් අදහස් හුවමාරු කරගැනීම |
| සංඛ්‍යා පිළිබඳ දැනුම | : භාණ්ඩ, අවකාශය හා කාලය, ගණන් කිරීම, ගණනය සහ මිනුම් සඳහා ක්‍රමානුකූල ඉලක්කම් භාවිතය |
| රූපක භාවිතය | : රේඛා සහ ආකෘති භාවිතයෙන් අදහස් පිළිබිඹු කිරීම සහ රේඛා, ආකෘති සහ වර්ණ ගළපමින් විස්තර, උපදෙස් හා අදහස් ප්‍රකාශනය හා වාර්තා කිරීම |
| තොරතුරු තාක්ෂණ ප්‍රවීණත්වය | : පරිගණක දැනුම සහ ඉගෙනීමේදී ද සේවා පරිශ්‍රයක් තුළ දී ද පෞද්ගලික ජීවිතයේ දී ද තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය උපයෝගී කර ගැනීම |

**(II) පෞරුෂත්ව වර්ධනයට අදාළ නිපුණතා**

- නිර්මාණශීලී බව, අපසාරී චින්තනය, ආරම්භක ශක්තීන්, තීරණ ගැනීම, ගැටලු නිරාකරණය කිරීම, විචාරශීලී හා විග්‍රහාත්මක චින්තනය, කණ්ඩායම් හැඟීමෙන් කටයුතු කිරීම, පුද්ගලාන්තර සබඳතා, නව සොයාගැනීම් සහ ගවේෂණය වැනි වර්ගීය කුශලතා:
- සෘජු ගුණය, ඉවසා දරා සිටීමේ ශක්තිය සහ මානව අභිමානයට ගරු කිරීම වැනි අගයයන්
- චිත්තවේගී බුද්ධිය.

**(III) පරිසරයට අදාළ නිපුණතා**

මෙම නිපුණතා සාමාජික, ජෛව සහ භෞතික පරිසරයට අදාළ වේ.

| | |
|---|---|
| සමාජ පරිසරය | : ජාතික උරුමයන් පිළිබඳ අවබෝධය, බහුවාර්ගික සමාජයක සාමාජිකයන් වීම හා සම්බන්ධ සංවේදීතාව හා කුශලතා, සාධාරණ යුක්තිය පිළිබඳ හැඟීම, සමාජ සම්බන්ධතා, පුද්ගලික චර්යාව, සාමාන්‍ය හා නෛතික සම්ප්‍රදායන්, අයිතිවාසිකම්, වගකීම්, යුතුකම් සහ බැඳීම් |
| ජෛව පරිසරය | : සජීවී ලෝකයක, ජනතාව සහ ජෛව පද්ධතිය, ගස් වැල්, වනාන්තර, මුහුදු, ජලය, වාතය සහ ජීවය - ශාක, සත්ත්ව හා මිනිස් ජීවිතයට සම්බන්ධ වූ අවබෝධය, සංවේදී බව හා කුශලතා |
| භෞතික පරිසරය | : අවකාශය, ශක්තිය, ඉන්ධන, ද්‍රව්‍ය, භාණ්ඩ සහ මිනිස් ජීවිතයට ඒවායේ ඇති සම්බන්ධතාව, ආහාර, ඇඳුම්, නිවාස, සෞඛ්‍ය, සුව පහසුව, ශ්වසනය, නින්ද, නිස්කලංකය, විවේකය, අපද්‍රව්‍ය සහ මලපහ කිරීම යනාදිය හා සම්බන්ධ |

වූ අවබෝධය, සංවේදිතාව හා කුශලතාව ඉගැනීම, වැඩ කිරීම සහ ජීවත් වීම සඳහා මෙවලම් සහ තාක්ෂණය ප්‍රයෝජනයට ගැනීමේ කුශලතා මෙහි අඩංගු වේ.

(IV) වැඩ ලෝකයට සූදානම් වීමේ නිපුණතා

ආර්ථික සංවර්ධනයට දායක වීම,
තම වෘත්තීය ලැදියා සහ අභියෝග්‍යතා හඳුනාගැනීම
හැකියාවන්ට සරිලන අයුරින් රැකියාවක් තෝරාගැනීම, සහ
වාසිදායක හා තිරසාර ජීවනෝපායක නිරත වීම
යන හැකියාවන් උපරිම කිරීමට හා ධාරිතාව වැඩි කිරීමට අදාළ සේවා නියුක්තිය හා සම්බන්ධ කුශලතා

(V) ආගම සහ සදාචාර ධර්මයන්ට අදාළ නිපුණතා

පුද්ගලයන්ට තම දෛනික ජීවිතයේ දී ආචාර ධර්ම, සදාචාරාත්මක හා ආගමානුකූල හැසිරීම් රටාවන්ට අනුගත වෙමින් වඩාත් උචිත දේ තෝරා එයට සරිලන සේ කටයුතු කිරීම සඳහා අගයයන් උකහාගැනීම හා ස්වීයකරණය

(VI) ක්‍රීඩාව සහ විවේකය ප්‍රයෝජනයට ගැනීමේ නිපුණතා

සෞන්දර්යය, සාහිත්‍යය, සෙල්ලම් කිරීම, ක්‍රීඩා හා මලල ක්‍රීඩා, විනෝදාංශ හා වෙනත් නිර්මාණාත්මක ජීවන රටාවන් තුළින් ප්‍රකාශ වන විනෝදය, සතුට, ආවේග සහ එවන් මානුෂික අත්දැකීම්

(VII) ඉගෙනීමට ඉගෙනුම පිළිබඳ නිපුණතා

ශීඝ්‍රයෙන් වෙනස් වන සංකීර්ණ හා එකිනෙකා මත යැපෙන ලෝකයක පරිවර්තන ක්‍රියාවලියක් හරහා වෙනස් වීම් හසුරුවා ගැනීමේ දී හා ඊට සංවේදී ව හා සාර්ථක ව ප්‍රතිචාර දැක්වීමත් ස්වාධීන ව ඉගැනගැනීමත් සඳහා පුද්ගලයන් හට ශක්තිය ලබා දීම.

(උපුටා ගැනීම 2003 අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව)

# පාලි විෂය අධ්‍යයනයේ අරමුණු

- පාලි භාෂාව හා තදනුබද්ධ භාෂා සාහිත්‍යය හඳුනා ගැනීම
- පාලි භාෂාවේ ව්‍යාකරණාංග පිළිබඳ දැනුමක් ලබා ගැනීම
- ත්‍රිපිටක සාහිත්‍යයේ සංවර්ධනය සහ විකාසය පිළිබඳ අවබෝධය ලබා ගැනීම
- භාෂා සාහිත්‍යය හැදෑරීමෙන් ලබන අත්දැකීම් පදනම් කරගෙන සමාජයට අවශ්‍ය යහපත් පෞරුෂයක් ගොඩනගා ගැනීම
- කරුණාව, මෛත්‍රිය, දයාව, පරිත්‍යාගශීලීත්වය, අල්පේච්ඡතාව වැනි සත්පුරුෂ ගුණාංග දියුණු කර ගැනීම
- ජාතික හා ආගමික වටිනාකම් පිළිබඳ ධනාත්මක ආකල්ප ජනනය කිරීම
- බෞද්ධ ආගමික හා සංස්කෘතික චාරිත්‍රවාරිත්‍ර විධි පාලි භාෂා මාධ්‍යයෙන් සිදුවන බැවින් ඒ පිළිබඳ කුසලතා වර්ධනය කර ගැනීම
- ජාතික ඉතිහාසය හා අනන්‍යතාව තහවුරු කර ගැනීමට අවශ්‍ය පාලි මූලාශ්‍රය කියවා තේරුම් ගැනීම
- නිර්මාණකරණයට හා ශාස්ත්‍රීය රචනාකරණයට අවශ්‍ය ව්‍යාකරණ ඥානය හා වාඞ්මාලාව පෝෂණය කර ගැනීම
- අර්ථකථා, ටීකා හා ප්‍රකරණ කියවා ධර්මාර්ථ විවරණය කිරීමේ හැකියාව ලබා ගැනීම
- පාලි සාහිත්‍ය රසාස්වාදයට මඟ පෙන්වීම
- ශ්‍රවණය, කථනය, භාෂණය, ලේඛනය හා අවබෝධය යන භාෂා කුසලතා සංවර්ධනය කර ගැනීම

## අ.පො.ස (උසස් පෙළ) පාලි විෂය
## විෂය නිර්දේශය පාසල් වාර වශයෙන් බෙදාගැනීමට යෝජිත සැලැස්ම

| ශ්‍රේණිය | වාරය | නිපුණතා මට්ටම් | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|
| 13 | I | 1.1, 1.2, 1.3, 2.1, 2.2, 2.3, 3.1, 3.2, 3.3, 4.1, 4.2 | 100 |
| | II | 4.3, 4.4, 5.1, 5.2, 6.1, 6.2, 7.1, 7.2, 7.3 | 100 |
| | III | 8.1, 8.2, 9.1, 9.2, 10.1, 10.2 | 100 |
| | | එකතුව | 300 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 1.0 පාලි භාෂාවේ මූලික වියරණ හා භාෂා ප්‍රයෝග නිවැරදිව භාවිත කරයි. | 1.1 මූලික ව්‍යාකරණ විධිවලට අනුකූල ව ලේඛන කාර්යයේ යෙදෙයි.<br>1.2 සාම්ප්‍රදායික යෙදුම් හා වාඞ්මාලාව පිළිබඳ අවධානය යොමු කරමින් භාෂාව භාවිත කරයි.<br>1.3 පාලි භාෂා ව්‍යවහාරයට අනුකූල ව රචනය හුරු කර ලියයි. | • සුවිශේෂ නාම වරනැගීම<br>• සංඛ්‍යා නාම වරනැගීම<br>• සර්වනාම වරනැගීම<br>• තද්ධිත පද සාධනය<br>• කෘදන්ත පද සාධනය<br>• ධාතුගණ හා ආඛ්‍යාත වරනැගීම<br>• ප්‍රයෝජ්‍ය ක්‍රියා<br>• ප්‍රශ්නවාචක නිපාත<br>• විධි ක්‍රියා<br>• ආමන්ත්‍රණ පද<br>• විස්මයවාචී යෙදුම්<br>• යුගල පද<br>• භේදාර්ථවාචී පද<br>• පාලි භාෂාවේ උපයුක්ත වාක්‍ය රටා අවබෝධ කර ගෙන රචනා ලිවීම | • සුවිශේෂී නාම වරනගයි, අර්ථ ගන්වයි.<br>• තද්ධිත හා කෘදන්ත නාම වරනගයි.<br>• සංඛ්‍යා ශබ්ද වරනගා විවිධ සංඛ්‍යා පාලියෙන් ලියා දක්වයි.<br>• සර්වනාම වරනගා අර්ථ ගන්වයි.<br>• තද්ධිත හා සමාස පද හඳුනාගෙන වෙනස්කම් දක්වයි.<br>• කෘදන්ත පද භාවිත කරයි.<br>• ධාතුගණ හා විකරණ ප්‍රත්‍ය ගෙනහැර දක්වයි.<br>• ධාතුවක් ආඛ්‍යාත විභක්තිවල වරනගා දක්වයි.<br>• ප්‍රයෝජ්‍ය ක්‍රියාව හඳුනාගෙන භාවිත කරයි.<br>• සාම්ප්‍රදායික පාලි යෙදුම් භාවිත කරයි.<br>• විවිධ මාතෘකා අනුව පාලි භාෂාවෙන් රචනා ලියයි. | 40 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 2.0 නිවැරදි වාචික සංනිවේදනයේ යෙදෙයි. | 2.1 නිවැරදි ව බස හසුරුවමින් සන්නිවේදන කාර්යයේ යෙදේ.<br><br>2.2 පාලි භාෂා මාධ්‍යයෙන් දැනගත් භාෂණ ප්‍රයෝග වාචික සන්නිවේදනයෙහි උචිත පරිදි භාවිත කරයි.<br><br>2.3 නිවැරදි ව බස හසුරුවමින් සන්නිවේදන කාර්යයේ යෙදෙයි. | • මාතෘකානුකූල ව කරුණු රැස්කිරීම හා ගොනු කිරීම<br>• සූත්‍ර පාඨ උපයෝගී කර ගෙන දේශන පැවැත්වීම<br>• ජාතක කථාවක් ඇසුරෙන් සංවාදයක් ගොඩනැගීම<br>• උද්ධෘත පාඨ ගෙනහැර දක්වමින් භාෂාව හා ධර්මය පිළිබඳ අදහස් පළ කිරීම<br>• පාලි භාෂා මාධ්‍යයෙන් සමිතියක් පැවැත්වීම<br>• පාලි භාෂා දින සැමරුමේදී පාලි භාෂා මාධ්‍යයෙන් අදහස් හුවමාරු කර ගැනීම | • මාතෘකා යටතේ සාම්ප්‍රදායික භාෂා භාවිතයට අදාළ නිර්දිෂ්ට ග්‍රන්ථාගත යෙදුම් එක් රැස් කරයි.<br>• භාෂා ප්‍රයෝග හා මාතෘකාවට අදාළ විශේෂ පද වෙන් කරයි.<br>• එම ප්‍රයෝග හා පද යොදා මාතෘකාවට අදාළ කරුණු වාක්‍ය හා ඡේද වශයෙන් ප්‍රතිනිර්මාණය කරයි.<br>• කථා ශෛලියට සමීප සූත්‍ර පාඨ හා ජාතක කථාවල කොටස් තෝරයි.<br>• තෝරාගත් එම සූත්‍ර පාඨ හා ජාතක කථා කොටස් සංවාද වශයෙන් ඉදිරිපත් කරයි.<br>• විශේෂ පදවලට හා යෙදුම්වලට අදාළ සමානාර්ථ හා විරුද්ධාර්ථ පද ඉදිරිපත් කරයි.<br>• එම වාක්‍ය උච්චාරණය කරමින් වාචික සන්නිවේදනයේ යෙදෙයි.<br>• ධර්ම කරුණු විස්තර කෙරෙන පෙළ හා අටුවා පාඨ සොයා ලියයි.<br>• එම පාඨ ස්මරණයෙන් උච්චාරණය කරයි. | 30 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 3.0 නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට ගද්‍ය පද්‍ය පාඨ කියවා භාවිතයට හුරු වෙයි. | 3.1 පද්‍යයක් නිවැරදි විරිතට හා යතියට අනුව ළයාන්විත ව ගායනා කරයි.<br>3.2 සූත්‍ර පාඨ ශ්‍රැති ගෝචර රටාවෙන් හඬ නගා සජ්ඣායනා කරයි.<br>3.3 උපයෝගිතාවෙන් යුතු පාලි ගද්‍ය පද්‍ය පාඨ වනපොත් කරයි. | • නමස්කාරය, තිසරණ සහිත පඤ්චසීලය, දේවාරාධනය ආදිය රිද්මයානුකූල ව ඉදිරිපත් කිරීම<br>• පිරිත් සජ්ඣායනා කිරීම<br>• සුවිශේෂී පාඨ වාචෝද්ගත කිරීම | • නමස්කාර ගාථා ළයාන්විත ව හඬනගා කියවයි.<br>• අල්පප්‍රාණ, මහාප්‍රාණ හා සංයුක්තාක්ෂර පැහැදිලි ව උච්චාරණය කරයි.<br>• ගාථාවල විවිධ වෘත්ත හා යතිය කෙරෙහි සැලකිලිමත් ව සජ්ඣායනා කරයි.<br>• නියමිත ගද්‍ය හා පද්‍ය වගන්ති මතකයෙන් කියවයි.<br>• නියමිත ගද්‍ය හා පද්‍ය වගන්ති මතකයෙන් නිවැරදි ව ලියයි.<br>• පද බෙදීම් පිළිබඳ අවබෝධයෙන් යුතුව සජ්ඣායනා කරයි. | 10 |
| 4.0 නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට ගද්‍ය පද්‍ය පාඨ පරිවර්තනය කිරීමේ කුශලතාව ප්‍රදර්ශනය කරයි. | 4.1 අන්වය හා ක්‍රියාකාරක පද සම්බන්ධතාව නිවැරදි ව සකස් කිරීමේ පරිචය ලබයි.<br>4.2 පාලි උද්ධෘත සඳහා පදගතාර්ථ සපයයි.<br>4.3 පාලි උද්ධෘත පාඨ මාධ්‍ය භාෂාවට පරිවර්තනය කරයි.<br>4.4 මාධ්‍ය භාෂාගත ඡේද පාලි රීතියට අනුව පරිවර්තනය කරයි. | • අදාළ පාඨයන්හි පදගතාර්ථ ලිවීම<br>• සරල වාක්‍ය පාලියට හා මාධ්‍ය භාෂාවට නැගීම | • නිවැරදි වාක්‍ය රචනයේ පරිචය ලබයි.<br>• පාලි ගද්‍ය පද්‍ය පාඨ නිවැරදි ව අර්ථ ගන්වයි.<br>• මාධ්‍ය භාෂාගත ඡේද නිවැරදි ව පාලියට නගයි. | 55 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 5.0 පාලි ගද්‍ය පද්‍ය පාඨ කියවා අර්ථය අවබෝධ කර ගනියි. | 5.1 පාලි ගද්‍ය පද්‍ය පාඨ කියවා අසන ලද ප්‍රශ්නවලට මාධ්‍ය භාෂාවෙන් පිළිතුරු සපයයි.<br><br>5.2 පාලි උද්ධෘත කියවා ඒවායේ සාරාංශය මාධ්‍ය භාෂාවෙන් දක්වයි. | • උද්ධෘත පාඨයන්හි අරුත් අවබෝධ කර ගැනීම<br>• ප්‍රායෝගික වටිනාකමක් ඇති පාලි භාෂාමය යෙදුම් භාවිත කිරීම | • පාලි ගද්‍ය පද්‍ය පාඨ නිවැරදි ව කියවා ගැනීමට සමත් වෙයි.<br>• එම පාඨවල දළ අදහස වටහා ගනියි.<br>• එහි ඇති සන්ධි, සමාස, තද්ධිත ආදී සංකීර්ණ පද විශ්ලේෂණය කර ගනියි.<br>• අටුවාව ආශ්‍රයෙන් ධර්ම කරුණු විමර්ශනය කරයි.<br>• භාෂා ශෛලිය සෙසු පාලි ග්‍රන්ථවල භාෂා ශෛලිය සමඟ සංසන්දනය කරයි.<br>• කාව්‍ය ලක්ෂණ හඳුන්වා දෙයි.<br>• අදාළ ඡේදයක් ආශ්‍රයෙන් අසන ප්‍රශ්නවලට පිළිතුරු දෙයි.<br>• පාලි පාඨ ස්මරණයෙන් පිටපත් කරයි.<br>• අදාළ ඡේදයේ ධ්වනිතාර්ථ මාධ්‍ය භාෂාවෙන් ඉදිරිපත් කරයි. | 25 |
| 6.0 පාලි භාෂා සාහිත්‍යයෙහි අන්තර්ගත සාරධර්ම චර්යාවෙන් ප්‍රදර්ශනය කරයි. | 6.1 පාලි සාහිත්‍යාගත සාරධර්ම හැඳිනගෙන ඒවා චර්යාවෙන් ප්‍රකට කරයි.<br><br>6.2 සාරධර්ම සමාජගත කිරීමට කටයුතු කරයි. | • ආගමාලය, ජාතිකාභිමානය ආදිය තම ජීවිතයට යොදා ගැනීම<br>• ආරාමීය වත් පිළිවෙත්වල යෙදීම<br>• ශාසනිකවත්, භික්ෂු ආකල්ප, ප්‍රත්‍යය පරිභෝජනය, ආරාමිකවත් ආදිය දැන ගැනීම සඳහා කෘති කියවීම<br>• ආර්යගුණ, වත්, පිළිවෙත්, ශ්‍රද්ධාව, කාමාදීනව හා කුශල ධර්ම පිළිබඳ අවබෝධය ලබා ගැනීම<br>• ධර්ම දේශනා පැවැත්වීම භාවනා පුහුණුව ආදි කටයුතුවල නියලීම | • නිර්දිෂ්ට ග්‍රන්ථ කියවා ඒවායේ සාරධර්ම හැසිරීමෙන් ප්‍රකට කරයි.<br>• යුතුකම් හා වගකීම් හඳුනාගෙන ඉදිරිපත් කරයි.<br>• යහපත් සමාජ සම්බන්ධතා පවත්වා ගනියි.<br>• සදාචාර සම්පන්න සමාජයක් ගොඩනැගීමට අවශ්‍ය ජීවන රටාව සකසා ගනියි.<br>• පුද්ගල පරිහානියට තුඩු දෙන හේතුවලින් වළකියි.<br>• ධනාත්මක චරිත ලක්ෂණ ප්‍රකට කරයි.<br>• ආර්ය ගුණ අගයයි.<br>• පරිසර හිතකාමී ව හැසිරෙයි. | 15 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 7.0 පාලි සාහිත්‍ය රසාස්වාදයේ යෙදෙයි. | 7.2 ගද්‍ය පද්‍ය පාඨ කියවා රස විඳියි.<br><br>7.2 ගද්‍ය පද්‍ය පාඨයන්හි අන්තර්ගත කාව්‍යෝක්ති පිළිබඳ ඇගයීමක යෙදෙයි.<br><br>7.3 සාහිත්‍යාත්මක ඡේද හා වාක්‍ය පාලියෙන් ලියා දක්වයි. | • අදාළ උද්ධෘත කියවීම<br><br>• උද්ධෘතයන්හි කාව්‍ය ලක්ෂණ, සාහිත්‍යමය පසුබිම හැදෑරීම<br><br>• සාහිත්‍යාත්මක ඡේද හා වාක්‍ය පාලියෙන් ලියා දක්වයි | • නිර්දිෂ්ට සාහිත්‍ය කොටස්වල අර්ථ අවබෝධ කර ගනියි.<br>• ධම්මපදයේ නිර්දිෂ්ට ගාථා ස්මරණයෙන් කියයි.<br>• කාව්‍යමය ප්‍රකාශන හඳුනාගෙන ප්‍රකාශ කරයි.<br>• සාහිත්‍යමය රසයෙන් යුතු ප්‍රයෝග ඉස්මතු කොට දක්වයි.<br>• සාහිත්‍යමය රචනා, භාෂණයන් එළිදක්වයි.<br>• ආස්වාදජනක ජීවිතයක් ගොඩනගා ගනියි.<br>• ලත් දැනුම පදනම් කොටගෙන කාව්‍යෝක්ති අගයයි. | 25 |
| 8.0 පාලි භාෂා සාහිත්‍යාගත බෞද්ධ සංස්කෘතිය වටහාගෙන ක්‍රියා කරයි. | 8.1 බෞද්ධ සංකල්පයන්හි සංස්කෘතික වැදගත්කම හදාරයි.<br><br>8.2 පාලි සාහිත්‍යාගත බෞද්ධ සංකල්ප වෙනත් ආගමික සංකල්ප හා තුලනය කරයි. | • පූජාර්හ පුද්ගලයන් හා වස්තු පිළිබඳ ක්‍රියා කළ යුතු ආකාරය<br><br>• ආචාර සමාචාර විධි, සහජීවනය, ආරාම පූජා ආදි සංස්කෘතිකාංග | • පාලි සාහිත්‍යාගත බෞද්ධ සංකල්ප හඳුන්වයි.<br><br>• බෞද්ධ සංකල්පයන්හි සංස්කෘතික වැදගත්කම හඳුනාගෙන ක්‍රියා කරයි.<br><br>• බෞද්ධ සංකල්ප වෙනත් ඉගැන්වීම් හා තුලනය කරයි.<br><br>• චරිතය තුළින් ජාතිකාභිමානය ප්‍රකට කරයි.<br><br>• දේශපාලනික හා සාමාජික කටයුතුවල දී සංයමයෙන් ක්‍රියා කරයි. | 55 |

| නිපුණතාව | නිපුණතා මට්ටම | විෂය අන්තර්ගතය | ඉගෙනුම් පල | කාලච්ඡේද සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 9.0 පාලි වංසකථා හා ප්‍රකරණ සාහිත්‍යයේ ව්‍යුහය පිළිබඳ අවබෝධය ලබා ගැනීම සඳහා පාලි සාහිත්‍ය ග්‍රන්ථ පරිශීලනය කරයි. | 9.1 පාලි වංසකථා ග්‍රන්ථවල සංඥාදි පඤ්චකය පිළිබඳ අවබෝධය ලබා ගැනීමට කියවයි.<br>9.2 පාලි ප්‍රකරණ සාහිත්‍යය හඳුනාගැනීම සඳහා කියවයි. | • පාලි වංසකථා පිළිබඳ දැනුම<br>• ප්‍රකරණ ග්‍රන්ථ පිළිබඳ දැනුම | • දීපවංස, මහාවංස, බොධිවංස, ථූපවංස, දාඨාවංස,රසවාහිනී, සමන්තකූටවණ්ණනා, සාසනවංසදීප වැනි ග්‍රන්ථවල සංඥාදී පංචකය ලියා දක්වයි.<br>• පාලි වංසකථා හා ප්‍රකරණ ග්‍රන්ථ සැකෙවින් හඳුන්වයි. | 25 |
| 10.0 අර්ථ විවරණ හැකියාව වර්ධනය කර ගනියි. | 10.1 නිර්දිෂ්ට කෘතිවල ඇතුළත් සුවිශේෂ පදවල ධර්මාර්ථ විවරණය කරයි.<br>10.2 නිර්දිෂ්ට කෘතිවල උද්ධෘතයන්හි ව්‍යාකරණ විභාග (පද විග්‍රහ) දක්වයි. | • ධර්ම කරුණු අටුවා ඇසුරින් විග්‍රහ කිරීම<br>• තෝරාගත් පදවල ව්‍යාකරණ විභාග දැක්වීම | • නියමිත කොටස් ඇසුරෙන් වාග් කෝෂය පුළුල් කර ගනියි.<br>• විවිධ වචන යෙදෙන සන්දර්භය හඳුනාගෙන භාවිතයේ යෙදෙයි.<br>• ව්‍යාකරණ විභාග ආශ්‍රයෙන් පදගතාර්ථ විවරණය කරයි.<br>• පදවල අර්ථය හා ධර්මානුකූල විග්‍රහය පැහැදිලි කරයි.<br>• ධර්මය පිළිබඳ වැරදි අර්ථකථනවලට නිවැරදි පිළිතුරු සපයයි.<br>• මූලාශ්‍රය මගින් දැනුම තහවුරු කර ගනියි.<br>• පෙළ, අටුවා කියවීමෙන් ලැබෙන ධර්මමය හා විවිධ ප්‍රායෝගික ප්‍රතිලාභ පෙන්වා දෙයි. | 20 |

# නිර්දිෂ්ට ග්‍රන්ථ

**(අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගයට නියමිත)**

**(2018 සිට)**

**13 ශ්‍රේණිය**

1. චුල්ලවග්ගපාළි - උපජ්ඣාය, සද්ධිවිහාරිකවත්ත
2. අපදානපාළි - වක්කලිත්ථෙරාපදාන
3. මහාවංස - 11 පරිච්ඡේදය
4. පාලි සාහිත්‍යය - 8 සහ 9 පරිච්ඡේද (පොල්වත්තේ බුද්ධදත්ත නාහිමි)

**අතිරේක කියවීම්**

1. ධම්මපදට්ඨකථා - පණ්ඩිතවග්ග
2. පොල්වත්තේ බුද්ධදත්ත නාහිමි, පාලි සාහිත්‍යය, රත්න පොත් ප්‍රකාශකයෝ, කොළඹ, 2012
3. පැණිහෙළ සිරිසම්බෝධි හිමි, පාලි භාෂාව හා රචනය, සමයවර්ධන, කොළඹ, 1999
4. පොල්වත්තේ බුද්ධදත්ත නාහිමි, පාලි භාෂාවතරණය, පළමු වන සහ දෙවන පොත්, සමයවර්ධන, කොළඹ, 1999
6. අසෝක කරුණාරත්න, පාලි සංග්‍රහය, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම, කොළඹ, 1964 (2015)
7. Ven. Polwatte Buddhadatta , New Pali Course 1 & 2, Buddhist Cultural Centre, Colombo

## පාසල් ප්‍රතිපත්ති හා වැඩ සටහන්

පංති කාමරයේ ඒකාකාරී ක්‍රියාවලියෙන් බැහැර නිපුණතා සංවර්ධනය සඳහා ශිෂ්‍යයා දැනුම ගවේෂණය කරන්නෙකු බවට පත් කළ යුතු ය. ඒ සඳහා පාලි භාෂාව නම් විෂය ශිෂ්‍යයා තුළ ආත්මගත කිරීමට වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු ය. පංති කාමරයෙන් බැහැර පහත සඳහන් වැඩ සටහන් සංවිධානය කිරීම පාලි භාෂාව පිළිබඳ නිපුණතා වර්ධනයට උපයුක්ත වෙතැයි සිතමු.

- පාලි බිත්ති පුවත්පතක් ක්‍රියාත්මක කිරීම
- පාලි භාෂා දිනයක් නම් කර කටයුතු සංවිධානය කිරීම
- ගාථා හා සූත්‍ර ගායනා තරග සංවිධානය කිරීම
- පාලි කථික තරග සංවිධානය කිරීම
- පාලි භාෂා සාහිත්‍යය පිළිබඳ ගවේෂණාත්මක ව්‍යාපෘති කරවීම
- පාලි සමිතියක් පැවැත්වීම

පාසලේ හෝ පිරිවෙනෙහි හෝ පසුබිමට හා සංස්කෘතියට අදාළ වන පරිදි විද්‍යාස්ථානයේ මානව හා භෞතික සම්පත්වලට අනුකූල ලෙස මෙම වැඩසටහන් සංවිධානය කර ගැනීම යෝග්‍ය වේ.

## තක්සේරුව හා ඇගයීම

පාසල පදනම් කරගත් ඇගයීම් වැඩ පිළිවෙළ යටතේ එක් එක් වාරය සඳහා නියමිත නිපුණතා හා නිපුණතා මට්ටම් ආවරණය වන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් උපකරණ නිර්මාණාත්මක ව පිළියෙල කොට ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ය.

ඉගෙනුම් කාර්යයේදී අපේක්ෂිත නිපුණතා මට්ටමට පැමිණ අත්පත් කරගෙන ඇති ඉගෙනුම් පලවල ගුණාත්මක බව සොයා බැලීමට තක්සේරුව හා ඇගයීම අවශ්‍ය වේ.

නිපුණතා මට්ටම් ඔස්සේ අපේක්ෂිත ඉගෙනුම් පලවලට ළඟා වන ආකාරය හඳුනා ගැනීම තක්සේරුවේ දී සිදුවේ. මුල දී තීරණය කරගත් නිර්ණායක සමඟ සසඳා බලමින් අදාළ නිපුණතා කවර මට්ටමකින් ළමයා සාක්ෂාත් කරගෙන තිබේ දැයි පරීක්ෂා කළ යුතු වේ. ඒ අනුව ප්‍රබලතා, දුබලතා හඳුනාගෙන ප්‍රතිපෝෂණ වැඩ සටහන් සංවිධානය කළ යුතු ය. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය අතරතුර දී කණ්ඩායම් ගවේෂණය, ශිෂ්‍ය ක්‍රියාකාරකම් ඉදිරිපත් කිරීම යන අවස්ථාවල තක්සේරු කාර්යය මැනවින් කළ හැකි ය.

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමවේදය

# ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමෝපාය

පාලි භාෂාව පිළිබඳ අ.පො.ස. (උ. පෙ) නව විෂය නිර්දේශය සකස් කොට ඇත්තේ නිපුණතා පාදක කර ගෙනය. නිපුණතා පාදක අධ්‍යාපනයේ දී ශිෂ්‍ය කාර්යය ප්‍රමුඛස්ථානයක් ගනී. අද වන විට විශේෂයෙන් අ.පො.ස. (උ. පෙ) අධ්‍යාපන ක්‍රමය සකස් වී ඇත්තේ දේශන ක්‍රමය කේන්ද්‍ර කරගත් සම්ප්‍රේෂණ භූමිකාවක ගුරුවරයා සිටින ආකාරයෙනි. එහෙත් නව නිපුණතා පාදක අධ්‍යාපනයේ දී පැරණි සම්ප්‍රේෂණ භූමිකාව හැරදමා ගුරුවරයා සිසුන් ගවේෂණයට යොමුකරන මාර්ගොපදේශකයෙකු විය යුතු ය. මෙහි දී පාලි භාෂාවේ සුවිශේෂී අධ්‍යාපන ක්‍රම හා නවීන ක්‍රම ශිල්ප කිහිපයකුත් යොදාගත හැකි ආකාරය පිළිබඳ කෙටියෙන් සඳහන් කරමු.

බුදුරජාණන් වහන්සේ මාර්ග දර්ශකයාණෝ ය. ගුරුවරයා විසින් පාලි භාෂාව ඉගැන්වීමේ දී බුදුරදුන් අනුගමනය කළ ක්‍රමවේදය උපයෝගී කර ගැනීම වඩාත් සුදුසු ය. එබැවින් නූතන ගුරුවරයා මනෝ මූලික හා විෂය මූලික සාධක ඔස්සේ පූර්ව විනිශ්චයන්ට නො එළඹ ශිෂ්‍යයා ගවේෂකයෙකු හා නවෝත්පාදකයෙකු කිරීමට මර්ගෝපදේශ සැපයීම මැනවි.

## 1 ක්‍රමය

"සො ධම්මං දෙසෙති ආදිකල්‍යාණං මජ්ඣෙ කල්‍යාණං පරියොසානකල්‍යාණං සාත්‍ථං සබ්‍යඤ්ජනං කෙවලපරිපුණ්ණං පරිසුද්ධං" (මහාවග්ගපාලි)

ආදිකල්‍යාණං - පාඩමක ආරම්භය ශිෂ්‍යයා පොළඹවන, සිත්ගන්නා සුලු චමත්කාර ජනක අත්දැකීම් ඇසුරින් ඉදිරිපත් විය යුතු ය.

මජ්ඣෙ කල්‍යාණං - පාඩමෙහි මැද සාරවත් කරුණු අන්තර්ගත විය යුතු අතර පැහැදිලි හා නිරවුල් විය යුතු ය. තව දුරටත් ශිෂ්‍යයා මාතෘකාවට පොළඹවන, ගවේෂකයෙකු කරවන ක්‍රියාවලියක් විය යුතු ය.

පරියොසානකල්‍යාණං - පාඩමේ අවසානය ශිෂ්‍යයා ප්‍රාප්ති මට්ටමකට පමුණුවා ශිෂ්‍යයාගේ චර්යාත්මක වෙනසක් ඇති කිරීමට සමත් විය යුතු ය.

සාත්ථං - පාඩම සරල සුගම හා අර්ථවත් කරුණුවලින් සමන්විත විය යුතු ය.

සබ්‍යඤ්ජනං - යොදාගන්නා වාඞ්මාලාව අරුත් ප්‍රකට කරවන අදහස් නිවැරදි ව සන්නිවේදනය කරවන්නක් විය යුතු ය.

පරිසුද්ධං - පාඩම අසභ්‍ය හා ග්‍රාම්‍ය ව්‍යවහාරයෙන් තොර විය යුතුය.

කෙවලපරිපුණ්ණං - පාඩම ඌනතාවලින් තොර ව භාෂණය, ලේඛනය, චින්තනය, චරිතායනය කර ගැනීමට හැකි වන අංගයන්ගෙන් සමුපලක්ෂිත විය යුතු ය.

මෙම ලක්ෂණවලින් යුතු ව පාඩමක් මෙහෙයවීමෙන් ශිෂ්‍යයා නිපුණතාවට ළං වන අතර ශිෂ්‍යයාගේ චර්යාත්මක වෙනසක් ද ඇති කළ හැකි ය.

## 2 ක්‍රමය

''ආචික්ඛනා දෙසනා පඤ්ඤපනා පට්ඨපනා විවරණා විභජනා උත්තානිකම්මං ''
(සච්චවිභංග සුත්ත - මජ්ඣිමනිකාය)

ශිෂ්‍ය සාධනය ඔප් නැංවීමට උචිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමයක් සච්චවිභංග සූත්‍රයේ අන්තර්ගතය.

ආචික්ඛනා - පාඩමට අදාළ ව අපේක්ෂිත කරුණු කෙටියෙන් කීම

| | |
|---|---|
| දෙසනා | - උචිත භාෂාව යොදා ගනිමින් කෙටියෙන් කී කරුණු ගුරුවරයා කෙරෙහි ප්‍රාමාණික විශ්වාසයක් ඇතිවන පරිදි ධර්මානුකූලව විස්තර කිරීම |
| පඤ්ඤපනා | - ශිෂ්‍යයාගේ බුද්ධියට හා ප්‍රඥාවට යෝග්‍ය ලෙස කරුණු පෙළ ගැස්වීම |
| පට්ඨපනා | - අපේක්ෂිත අරමුණෙහි ශිෂ්‍යයා පිහිටුවීම |
| විවරණා | - වසා තිබූවක් විවෘත කරන්නාක් සේ හේතුඵලවාදී ව කරුණු විවරණය කිරීම |
| විභජනා | - කරුණු විශ්ලේෂණය කොට කුඩා අනුකුඩා කොටස්වලට බෙදා විග්‍රහ කිරීම |
| උත්තානිකම්මං | - සංයුක්ත සංකල්ප නිදසුන් වශයෙන් ගෙනහැර දක්වමින් ශ්‍රාවක බුද්ධියට ගෝචර වන ලෙස මතුකර දැක්වීම හා ශිෂ්‍යයා ගැටලුවෙන් නිදහස් කිරීම |

මෙම ක්‍රම අනුගමනය කිරීමෙන් ද ශිෂ්‍ය නිපුණතාව ඉහළ නැංවිය හැකි ය.

3 ක්‍රමය

ශිෂ්‍යයාගේ අවබෝධය දියුණු කිරීම සඳහා අනුගමනය කළ හැකි ක්‍රමය අනුපූර්ව ප්‍රතිපදාවයි. ශිෂ්‍යයාට අලුත් අත්දැකීම් ලබා දෙන විට එය ඔහුගේ අතීත අත්දැකීම්වලට සම්බන්ධ දෙයක් වීම වැදගත් වේ. ශිෂ්‍යයා ආස්වාදිත දෙයෙහි සිට නොදන්නා සත්‍යය කරා යොමුකරවීම මෙම අධ්‍යාපන ක්‍රමයේ පිළිවෙළයි. (පහත දැක්වෙන්නේ මජ්ඣිම නිකායේ කීටාගිරි සූත්‍රය ඇසුරෙන් යොදා ගන්නා ලද්දකි.)

| | |
|---|---|
| සද්ධාජාතො උපසංකමති | - ශ්‍රද්ධාව ඇතිකර ගැනීමයි. ගුරුවරයා කෙරේ ශිෂ්‍යයාගේ විශ්වාසය ගොඩනගා ගැනීමයි. එසේ විශ්වාසය ගොඩනැගීම නිසා ශිෂ්‍යයා ගුරුවරයා වෙත එළඹෙයි. |
| පයිරුපාසති | - විශ්වාසය ගොඩනැගීම නිසා ශිෂ්‍යයා ගුරු ඇසුර ලැබීමට ප්‍රියකරයි. |
| සොතං ඔදහති | - පාඩමට සාවධාන ව හා අවික්ෂිප්ත ව ඇහුම්කන් දෙයි. |
| සුත්වා ධාරෙති | - ඇසූ පාඩම සිතේ දරා ගනියි. |
| අත්ථං උපපරික්ඛති | - දරාගත් කරුණුවල අර්ථය නුවණින් පරීක්ෂා කර බලයි. |
| ධම්මා නිජ්ඣානං ඛමන්ති | - කරුණු නුවණින් සලකා බලා වටහා ගනියි. |
| ඡන්දො ජායති | - කරුණු වටහා ගැනීම නිසා ගුරුවරයාගේ පාඩමට රුචියක් ඇති වෙයි. |
| උස්සහති | - පාඩමේ කරුණුවල ප්‍රාප්ති මට්ටමට ළඟාවීමට උත්සාහ කරයි. |
| තුලෙති | - වෙනත් කරුණු හා තුලනය කර බලයි. |
| පදහති | - සන්සන්දනය කොට නිපුණතා මට්ටමට යාමට වීර්ය කරයි. |
| සච්චං සච්ඡිකරොති | - සත්‍ය වූ තත්ත්වය අවබෝධ කර ගනියි. |

සරල අවස්ථාවේ සිට අනුක්‍රමයෙන් ගැඹුරට යන ආකාරයේ පිළිවෙළක් මෙහි දක්නට ඇත. පාලි භාෂාව විෂයයෙහි ශිෂ්‍ය නිපුණතාව ඇති කිරීමේ දී මෙම ඉගැන්වීම් ක්‍රම උපයෝගී කර ගත හැකි ය. මෙබඳු ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රම රාශියක් පාලි සාහිත්‍යයේ අඩංගු ය.

පාලි භාෂාවේ නව විෂය නිර්දේශය ඉගැන්වීමට සරල සුගම ක්‍රමවේදයක් මෙහිලා දක්වමු.

(ආශ්‍රය; පාලි භාෂාව 9 - 10 අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, 1984)

| | |
|---|---|
| i පියවර | - නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට පාලි පාඨ හා ඡේද උස් හඬින් ගුරුවරයා විසින් කියවනු ලැබීම, පාලි විෂයේ ආරම්භක ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට එම භාෂාව කනට හුරු කරවීම |

මෙයින් අපේක්ෂා කෙරේ. පාලි භාෂා ව්‍යවහාරය දරුවන්ගේ ඇසට, කනට හුරු කරවීමට මෙම ක්‍රමය යෝග්‍ය වේ.

ii පියවර - අනතුරුව ගුරුවරයා විසින් කළ යුත්තේ එකී කොටස අර්ථවත් ලෙස භාවාර්ථ පැහැදිලි වන පරිදි ඉදිරිපත් කිරීම යි. එමඟින් පාලි භාෂා ව්‍යවහාරය හා රීතිය ශිෂ්‍යයාගේ ඉන්ද්‍රියයන්ට හුරුවනු ඇත.

iii පියවර - කාලවේලාව අනුව පාලි උද්ධෘතය ශිෂ්‍යයන් ලවා සාමූහික ව හෝ වෙන් වෙන් හෝ නිවැරදි උච්චාරණය කරවීම ප්‍රයෝජනවත් ය.

iv පියවර - පාලි උද්ධෘතයන්හි අර්ථය අවබෝධ කර ගැනීමට ගුරුවරයා සිසුන්ට උදවු කළ යුතු ය.

v පියවර - උද්ධෘත ඡේදවල වාක්‍ය හා වාක්‍යාංශ කලුලැල්ලේ ලියා එම යෙදුම් රටාව ශිෂ්‍යයාට පැහැදිලි කළ යුතු ය.

vi පියවර -උද්ධෘත ඡේදවල ඇතුළත් පද හා වාක්‍යවල ව්‍යාකරණ ලක්ෂණ පැහැදිලි කළ යුතු ය. මෙය සරල ක්‍රමවේදවලින් පටන් ගෙන සංකීර්ණ ක්‍රම දක්වා වැඩි කිරීම සුදුසු ය.

vii පියවර - වැදගත් ගාථා හා ඡේද වනපොත් කිරීමේ අවශ්‍යතාව ශිෂ්‍යයන්ට ඒත්තු ගැන්වීම අවශ්‍ය වෙයි.

මෙම ක්‍රමවේදය අනුගමනය කිරීම මගින් අපේක්ෂිත නිපුණතා මට්ටමට ශිෂ්‍යයන් ළඟාවනු ඇත. සිසුන් කරුණු හා තොරතුරු ගවේෂණයට යොමු කළ යුතු ය. ගවේෂිත කරුණු අධීක්ෂණය ගුරුවරයා විසින් කළ යුතු ය. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය පන්ති කාමරයට පමණක් සීමා නොකොට බාහිර ක්‍රියාකාරකම් කෙරෙහි ද යොමු කිරීම ගුරුවරයාගේ යුතුකමකි. සිසු දරුවන්ගේ ක්‍රියාකාරකම් පිළිබඳ නිරතුරු අවධානයෙන් සිටීමෙන් ඇගයීම හා තක්සේරුව ද විනිවිද භාවයකින් යුතු ව කිරීමට ගුරුවරයාට ඉඩකඩ සැලසේ. මෙම නව විෂයමාලා සංශෝධනයේ අපේක්ෂාව ගුරුවරයාත් ශිෂ්‍යයාත් අතර වූ සම්ප්‍රේෂණ අධ්‍යාපන ක්‍රමය සංවර්ධනය කර ක්‍රියාකාරී ගවේෂණාත්මක අධ්‍යාපන ක්‍රමවේදයකට යොමු කිරීම හා එමගින් සිසුන්ගේ නිපුණතාව ඉහළ නංවා සමාජයට, රටට යෝග්‍ය පුරවැසියන් බිහි කිරීමයි.

# 01. ඒකකය - සුවිශේෂී නාම වරනැගීම

**නිපුණතාව**

1.0 පාලි භාෂාවේ මූලික ව්‍යාකරණ හා භාෂා ප්‍රයෝග නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම**

1.1 මූලික ව්‍යාකරණ විධිවලට අනුකූල ව ලේඛන කාර්යයේ යෙදෙයි.

**කාලච්ඡේද** 04 යි

**ඉගෙනුම් පල**

- වෙනස් ව වරනැගෙන සුවිශේෂ නාම හඳුනාගෙන නම් කරයි.
- අකාරාන්ත පුල්ලිංග සුවිශේෂ නාමපද වරනැගීම වගුගත කරයි.
- සාමාන්‍ය ආකාරාන්ත පුල්ලිංග නාමයකට වඩා සුවිශේෂ පුල්ලිංග නාම වරනැගීමේ වෙනස පැහැදිලි කරමින් ලියයි.
- නිර්දිෂ්ට කෘති ඇසුරින් සුවිශේෂ නාමපද උද්ධෘත කර දක්වයි
- අකාරන්ත පුල්ලිංග නාම වරනැගීම ඉදිරිපත් කරයි.
- සුවිශේෂ නාම පදයන්හි නිවැරදි භාවිතය හැඳිනගෙන ඒවායේ ප්‍රකෘති, විභක්ති හා වචන නම් කරයි.
- සන්ත, භවන්ත, ගො, සා වැනි නාම වරනැගෙන අයුරු පෙන්වා දෙයි.
- තද්ධිත හා කෘදන්ත නාම වරනගා දක්වයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය යටතේ දී ඇති උපදෙස් අනුගමනය කරමින් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත් කරගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- බුද්ධ ශබ්දය හා සමාන ව වරනැගෙන දෙව, යක්ඛ වැනි ශබ්ද ඇති බව
- අත්ත, රාජ, බ්‍රහ්ම ආදි ශබ්ද සුවිශේෂ නාම ලෙස හැඳින්වෙන බව
- සාමාන්‍ය අකාරාන්ත ශබ්දවලට වඩා සුවිශේෂ අකාරාන්ත නාම වරනැගීමේ දී දක්නට ලැබෙන වෙනස්කම් හඳුනාගත යුතු බව
- සුවිශේෂී අකාරාන්ත නාම නිර්දිෂ්ට කෘතිවලින් උපුටා දැක්වීම යුතු බව
- සා, පච්චක්ඛධම්මා, දළ්හධම්මා වැනි ආකාරාන්ත ශබ්ද වරනගා අර්ථ ගැන්විය යුතු බව
- සුවිශේෂී නාම පදයන්හි ප්‍රකෘතිය, ප්‍රත්‍යය, විභක්තිය හා වචනය වෙන්කර දැක්විය යුතු බව
- සන්ත, භවන්ත, ගො වැනි ශබ්ද වරනගා දැක්විය යුතු බව
- තද්ධිත හා කෘදන්ත නාම වරනැගෙන ආකාරය නිර්දිෂ්ට කෘතිවලින් උපුටා දැක්විය යුතු බව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- පාලි අකාරාන්ත පුල්ලිංග සුවිශේෂ නාමයන්හි ලේඛනයක් පුවරුවේ ලියා දැක්වීම
- සාමාන්‍ය අකාරාන්ත ශබ්දයක් සුවිශේෂ අකාරාන්ත ශබ්දයක් සමග සියලු විභක්තිවල වරනගා වෙනස්කම් පෙන්වා දීම
- සුවිශේෂ නාම පදයන්හි ප්‍රකෘතිය, ප්‍රත්‍යය, විභක්තිය හා වචනය වෙන්කර දැක්වීම
- නිර්දිෂ්ට ග්‍රන්ථවල එන තෝරාගත් නාමපදවල ප්‍රකෘති, ප්‍රත්‍යය, විභක්ති හා වචන වෙන් කොට වගුගත කිරීමට සිසුන් යොමු කිරීම
- සන්ත, භවන්ත, ගො වැනි ශබ්ද නිර්දිෂ්ට ග්‍රන්ථවල යෙදී ඇත්නම් ඒ බව පෙන්වා දීම
- තද්ධිත හා කෘදන්ත නාම නිර්දිෂ්ට ග්‍රන්ථවලින් උපුටා දැක්වීමට සිසුන් යොමු කිරීම

**තක්සේරුව හා ඇගයීම**

- සුවිශේෂ අකාරාන්ත නාම ලියා දක්වයි.
- සාමාන්‍ය නාම පද හා සුවිශේෂ නාම පද සංසන්දනය කර වෙනස්කම් පෙන්වා දෙයි.
- සුවිශේෂ අකාරාන්ත නාම පද නිර්දිෂ්ට කෘතිවලින් උපුටා දක්වයි.
- අකාරාන්ත පුල්ලිංග නාම පද සොයා ලියයි.
- නාම පදයන්හි ප්‍රකෘතිය ප්‍රත්‍යය, විභක්තිය හා වචනය ලියා දක්වයි.
- සන්ත, භවන්ත, ගො වැනි ශබ්ද යෙදී ඇති තැන් පෙන්වා දෙයි.
- තද්ධිත නාම හා කෘදන්ත නාම සොයා වගුගත කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- පාලි ව්‍යාකරණ විවරණය, සිරිනිවාස හිමි, මයිලැවේ; සමයවර්ධන, කොළඹ, 1966.

**වැඩි දුර ගවේෂණය**

- පාලි භාෂාවතරණය 1. 2. 3. බුද්ධදත්ත නාහිමි, පොල්වත්තේ; සමයවර්ධන, කොළඹ, 1999.

## 02. ඒකකය - සංඛ්‍යා නාම වරනැඟීම

**නිපුණතාව**

1.0 පාලි භාෂාවේ මූලික වියරණ හා භාෂා ප්‍රයෝග නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම**

1.1 මූලික ව්‍යාකරණ විධිවලට අනුකූල ව ලේඛන කාර්යයේ යෙදෙයි.

**කාලච්ඡේද** 04 යි

**ඉගෙනුම් පල**

- සංඛ්‍යා නාම හඳුන්වයි.
- සංඛ්‍යා නාම වරනගා දක්වයි.
- සංඛ්‍යා නාම වරනැඟීමේ දී ලිංග භේදය හා වචන භේදය හඳුනාගෙන වගුගත කරයි.
- නිර්දිෂ්ට අනිර්දිෂ්ට කෘති කියවා සංඛ්‍යා නාම පද උපුටා දක්වයි.
- සංඛ්‍යා නාම භාවිතයේ සුවිශේෂ ලක්‍ෂණ හඳුන්වා දෙයි.
- සංඛ්‍යා නාම යොදා වාක්‍ය නිර්මාණය කරයි.
- විවිධ සංඛ්‍යා පාලියෙන් ලියා දක්වයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය යටතේ දී ඇති උපදෙස් අනුගමනය කරමින් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත් කරගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- නාම වශයෙන් සංඛ්‍යා භාවිත වන බව
- එක, ද්වි, ති, චතු, සහස්ස, කොටි ආදිය සංඛ්‍යානාම වශයෙන් යෙදෙන බව
- එක, එකූනවීසති, කොටි ආදි සංඛ්‍යා ඒක වචනයේ පමණක් වරනැගෙන බව
- ති, චතු, පඤ්ච ආදි සංඛ්‍යා බහුවචනයේ පමණක් වරනැගෙන බව
- එක, ති, චතු සංඛ්‍යා ත්‍රිලිංගයේ වෙනස්ව වරනැගෙන බව
- ද්වි, පඤ්ච, ඡ ආදි සංඛ්‍යා ත්‍රිලිංගයේ සමානව වරනැගෙන බව
- එකූනවීසති සිට අට්ඨනවුති දක්වා සංඛ්‍යා ස්ත්‍රීලිංගයේ පමණක් වරනැගෙන බව
- එකූනසත සිට ලක්ඛ දක්වා සංඛ්‍යා නපුංසකලිංගයේ පමණක් වරනැගෙන බව
- නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට කෘතිවල සංඛ්‍යාවාචී පද උපුටා දැක්විය යුතු බව
- සංඛ්‍යා නාම වරනැඟීමේ සුවිශේෂ ලක්‍ෂණ හඳුනාගත යුතු බව
- පාලියෙන් සංඛ්‍යා ලිවිය යුතු බව
- සංඛ්‍යා නාම යොදා වාක්‍ය නිර්මාණය කළ යුතු බව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- සංඛ්‍යා නාම ලියා දැක්වීම
- ඒ ඒ සංඛ්‍යා නාම ලිංග හා වචන වශයෙන් වගුගත කිරීම
- නිර්දිෂ්ට කෘතීන්හි එන සංඛ්‍යා ශබ්ද උපුටා දැක්වීම
- සංඛ්‍යා නාම භාවිතයේ සුවිශේෂ ලක්‍ෂණ පෙන්වා දීම
- සංඛ්‍යා නාම යොදා වාක්‍ය නිර්මාණය කිරීම
- පාලියෙන් සංඛ්‍යා ලියා දැක්වීම
- සංඛ්‍යා නාම විශේෂණ වශයෙන් යෙදී ඇති තැන් පෙන්වා දීම

**තක්සේරුව හා ඇගයීම**

- සංඛ්‍යා නාම හඳුන්වයි.
- සංඛ්‍යා ලියා දක්වයි.
- ඒ ඒ සංඛ්‍යා නාම යෙදෙන ලිංග හා වචන ලියා දක්වයි.
- නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට කෘතිවල සංඛ්‍යාවාචී නාමපද උපුටා දක්වයි.

- සංඛ්‍යා ශබ්ද වරනැගීමේ සුවිශේෂ ලක්‍ෂණ පෙන්වා දෙයි.
- සංඛ්‍යා ශබ්ද යොදා වාක්‍ය නිර්මාණය කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- පාලි ව්‍යාකරණ විවරණය, සිරිනිවාස හිමි, මයිලැවේ; සමයවර්ධන, කොළඹ, 1966.

**වැඩිදුර ගවේෂණය**

- පාලි භාෂාවතරණය 1, බුද්ධදත්ත නාහිමි, පොල්වත්තේ; සමයවර්ධන, කොළඹ, 1999.

# 03. ඒකකය - සර්වනාම වරනැඟීම

**නිපුණතාව**

1.0 පාලි භාෂාවේ මූලික වියරණ හා භාෂා ප්‍රයෝග නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම**

1.1 මූලික ව්‍යාකරණ විධිවලට අනුකූල ව ලේඛන කාර්යයේ යෙදෙයි.

**කාලච්ඡේද** 03 යි

**ඉගෙනුම් පල**

- පාලි භාෂාවේ සර්වනාම නම් කරයි.
- සර්වනාම හඳුන්වයි.
- සර්වනාම වරනැඟීම ප්‍රගුණ කරයි.
- සර්වනාම වරනැඟීමේ දී ලිංග හා වචන භේදය හඳුනාගෙන ලියා දක්වයි.
- සර්වනාම විශේෂණ පද ලෙස යෙදෙන අයුරු හඳුනාගෙන වාක්‍ය ලියයි.
- නිර්දිෂ්ට කෘති කියවා සර්වනාම පද සහිත වාක්‍ය උද්ධෘත කර ලියයි.
- සර්වනාම පද යෙදෙන සුවිශේෂී ප්‍රයෝග හඳුනාගැනීම සඳහා කියවයි.
- සර්වනාම වෙනත් නාම පද සමග වරනගා දක්වයි.
- අම්හ, තුම්හ ශබ්දයන්ගෙන් ආදේශ රූප හඳුනාගෙන භාවිත කරයි.
- සර්වනාම පද උපයෝගී කරගෙන පාලියෙන් අදහස් ප්‍රකාශ කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය යටතේ, දී ඇති උපදෙස් අනුගමනය කරමින් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත් කරගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- සර්වනාම යනු පුද්ගල, ස්ථාන ආදී වෙනත් නාමයක් වෙනුවට යොදා ගන්නා නාම බව
- විශේෂණ පද වශයෙන් භාවිත වන බව
- ලිංගත්‍රයෙහි වරනැගෙන බව
- සබ්බ, කතර, කතම, උභය, ඉතර, අඤ්ඤ, අඤ්ඤතර, අඤ්ඤතම, පුබ්බ, පර, අපර, දක්ඛිණ, උත්තර, ය, ත, එත, ඉම, අමු, කිං, තුම්හ, අම්හ යනාදිය සර්වනාම වන බව
- සර්වනාම, විශේෂණ ලෙස යෙදෙන විට ලිංගයෙන්, විභක්තියෙන්, වචනයෙන් සමාන වන බව
- සර්වනාම වාක්‍යවල තනි ව යෙදෙන බව
- අම්හ, තුම්හ ශබ්දවල විශේෂ රූප ඇති බව
- ප්‍රශ්න වාචක සර්වනාම ලිංගත්‍රයේ වරනැගිය යුතු බව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- නිර්දිෂ්ට කෘතියකින් උපුටාගත් ඡේදයක් සිසුන්ට ලබා දී එහි ඇති සර්වනාම පද උපුටා දැක්වීම
- සර්වනාම ශබ්ද 27ක් ඇති බව පෙන්වා දීම
- සර්වනාම පද නාම පද ලෙස ද විශේෂණ පද ලෙස ද යෙදෙන ආකාරය පැහැදිලි කිරීම
- සර්වනාම පදයක් ලිංගත්‍රයෙහි වරනගා අර්ථ ගැන්වීම
- අම්හ, තුම්හ, ශබ්දයන්ගේ භාවිතය පැහැදිලි කර දීම
- සර්වනාම පද වෙනත් නාමයක් හා වරනගා දැක්වීම
- නිර්දිෂ්ට පාඨයන්හි එන සර්වනාම පද උපුටා දැක්වීම
- ප්‍රශ්න වාචක සර්වනාම පද යොදා වාක්‍ය සැකසීම

**තක්සේරුව හා ඇගයීම**

- සර්වනාම හඳුන්වයි.
- සර්වනාම, නාමයක් වෙනුවට භාවිත කරයි.

- සර්වනාම යොදා වාක්‍ය තනයි.
- සර්වනාම, විශේෂණ ලෙස නිවැරදි ව භාවිත කරයි.
- නිර්දිෂ්ට කෘතිවල සර්වනාම පද උපුටා දක්වයි.
- සර්වනාම ලිංගත්‍රයේ වරනගයි.
- අම්හ, තුම්හ ශබ්දයන්ගේ භාවිතය පැහැදිලි කරයි.
- සර්වනාම පද යොදා වාක්‍ය තනයි.
- ප්‍රශ්න වාචක සර්වනාම යොදා වාක්‍ය සකසයි.

**ගුණාත්මක යෙදවුම්**

- පාලි ව්‍යාකරණ විවරණය, සිරිනිවාස හිමි, මයිලැවේ.: සමයවර්ධන, කොළඹ, 1966.
- අ.පො.ස. උසස් පෙළ - 13 ශ්‍රේණියට නියමිත ග්‍රන්ථ

**වැඩි දුර ගවේෂණයට**

- පාලි භාෂාවතරණය 1, 2, බුද්ධදත්ත නා හිමි, පොල්වත්තේ.: සමයවර්ධන, කොළඹ, 1999.
- පාලි භාෂාව හා රචනය, සිරි සම්බෝධි හිමි, පැණිහෙළ.: සමයවර්ධන, කොළඹ, 1999.

# 04. ඒකකය - තද්ධිත පද සාධනය

**නිපුණතාවය**

1.0 පාලි භාෂාවේ මූලික වියරණ හා භාෂා ප්‍රයෝග නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම**

1.1 මූලික ව්‍යාකරණ විධිවලට අනුකූල ව ලේඛන කාර්යයේ යෙදෙයි.

**කාලච්ඡේද** 05යි

**ඉගෙනුම් පල**

- තද්ධිත යන්න හඳුන්වයි.
- තද්ධිතවල ප්‍රයෝජන නම් කරයි.
- තද්ධිත පදයන්හි පද සිද්ධි ක්‍රම පැහැදිලි කරයි.
- තද්ධිත ප්‍රභේද නම් කර නිදසුන් දක්වයි.
- තද්ධිත පද විශේෂණ පද වශයෙන් ද නාම පද වශයෙන් ද භාවිත වන බව පෙන්වා දෙයි.
- නිර්දිෂ්ට කෘතිවල එන තද්ධිත පද උපුටා දක්වයි.
- සමාස හා තද්ධිත පදයන්හි සම විෂමතා පෙන්වා දෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය යටතේ, දී ඇති උපදෙස් අනුගමනය කරමින් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත් කරගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- තද්ධිත යනු කවරේ දැයි හැඳින්විය යුතු බව
- තද්ධිත ප්‍රත්‍යයාර්ථ නාම විශේෂයක් බව
- තද්ධිතයන්හි ප්‍රයෝජන ලියා දැක්විය යුතු බව
- තද්ධිත පද සාධනයේ දී බොහෝ විට ආදි ස්වරය වෘද්ධි වන බව
- තද්ධිත ප්‍රභේද තුනක් ඇති බව
- සාමඤ්ඤ තද්ධිතය තවත් ප්‍රභේද හතරකට බෙදෙන බව
- නාමවලට තද්ධිත ප්‍රත්‍යය යොදා තද්ධිත පද සැකසිය යුතු බව
- තද්ධිත නාම, විශේෂණ හා නිපාත වශයෙන් යෙදෙන බව
- නිර්දිෂ්ට කෘතිවල එන තද්ධිත පද උපුටා දැක්විය යුතු බව
- සමාස හා තද්ධිත අතර ඇති සම විෂමතා දැක්විය යුතු බව
- තද්ධිත පද යොදා වාක්‍ය සැකසිය යුතු බව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය**

- නිර්දිෂ්ට කෘතිවල එන තද්ධිත පද කිහිපයක් උපුටා දක්වා නාමය හා තද්ධිත ප්‍රත්‍ය වෙන්කොට දැක්වීම
- පද සාධනය කරමින් තද්ධිත පද සකසා තද්ධිතවල ප්‍රයෝජන පෙන්වා දීම
- තද්ධිත ප්‍රභේද නම් කොට ඒ ඒ ප්‍රභේදයට නිදසුන් දැක්වීම
- තද්ධිතයක් නාම, විශේෂණ හා නිපාත වශයෙන් වාක්‍යයන්හි යෙදී ඇති අයුරු පෙන්වා දීම
- නිර්දිෂ්ට කෘතිවල එන තද්ධිත පද උපුටා දැක්වීම
- සමාස හා තද්ධිත අතර සම විෂමතා දැක්වීම
- තද්ධිත පද යොදා වාක්‍ය සැකසීම

**තක්සේරුව හා ඇගයීම**

- තද්ධිත හඳුන්වා නිදසුන් දෙයි.
- තද්ධිතවල ප්‍රයෝජන ලියා දක්වයි.

- තද්ධිතයන්හි නාමය හා ප්‍රත්‍ය වෙන් කොට දක්වයි.
- තද්ධිත ප්‍රභේද නම් කරයි.
- තද්ධිත ප්‍රභේද හඳුන්වා නිදසුන් දෙයි.
- නිර්දිෂ්ට කෘතිවල තද්ධිත පද උපුටා දක්වයි.
- තද්ධිතයක් නාම, විශේෂණ හා නිපාත වශයෙන් යෙදෙන බවට නිදසුන් සපයයි.
- සමාස හා තද්ධිත අතර වෙනස පැහැදිලි කරයි.
- තද්ධිත පද යොදා වාක්‍ය තනයි.

**ගුණාත්මක යෙදවුම්**

- පාලි ව්‍යාකරණ විවරණය, සිරිනිවාස හිමි, මයිලෑවේ.: සමයවර්ධන, කොළඹ, 1966.
- නිර්දිෂ්ට කෘති - 13 ශ්‍රේණියට අදාළ

**වැඩිදුර ගවේෂණය**

- පාලි භාෂාව 5 මූලික පිරිවෙන, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, සමයවර්ධන, 2013.

# 05. ඒකකය - කිතක පද සාධනය

**නිපුණතාව**

1.0 පාලි භාෂාවේ මූලික වියරණ හා භාෂා ප්‍රයෝග නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම**

1.1 මූලික ව්‍යාකරණ විධිවලට අනුකූල ව ලේඛන කාර්යයේ යෙදෙයි.

**කාලච්ඡේද** 05යි

**ඉගෙනුම්පල**

- කිතක හඳුන්වයි.
- කිතකවල පද සාධනය පැහැදිලි කරයි.
- කිතක පද නාම, ක්‍රියා හා අව්‍ය වශයෙන් යෙදෙන අයුරු පැහැදිලි කරයි.
- කිතක ප්‍රභේද ලියා දක්වයි.
- කිතකවල ප්‍රයෝජන ලියා දක්වයි.
- නිර්දිෂ්ට කෘතිවල කිතක පද උපුටා දක්වයි.
- කිතක පද යොදා වාක්‍ය ලියා දක්වයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය යටතේ, දී ඇති උපදෙස් අනුගමනය කරමින් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත් කරගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂප්තය**

- කිතක පද හැඳින්විය යුතු බව
- කිතක පද සාධනයේ දී ධාතුවකට ප්‍රත්‍යයක් යොදා ගන්නා බව
- කිතක, කිච්ච හා කිත් වශයෙන් ප්‍රභේද වන බව
- කිච්ච කිතක ත්‍රෛකාලික වන බව
- කිත් ප්‍රත්‍යාන්ත කිතක ප්‍රභේද 5 ක් වන බව
- කිතක පද භාෂාවේ බහුල ව යෙදෙන බව
- කිතක පද වාක්‍යවල නාම, ක්‍රියා හා අව්‍ය වශයෙන් යෙදෙන බව
- කිතක ක්‍රියා වශයෙන් යෙදෙන විට පුරුෂභේදයක් නොමැති බව හා ලිංගභේදයක් ඇති බව
- නිර්දිෂ්ට කෘතිවලින් කිතක පද උපුටා දැක්විය යුතු බව
- කිතක පද යොදා වාක්‍ය නිර්මාණය කළ යුතු බව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- කිතක පද සහිත ඡේදයක් පුවරුවේ ලියා කිතක පද පෙන්වා දීම
- කිතක පද සාධනය පැහැදිලි කිරීම
- කිතක පද නාම, ක්‍රියා හා අව්‍ය වශයෙන් යෙදී ඇති අයුරු පෙන්වා දීම
- කිතක ප්‍රභේද කොට දැක්වීම
- කිත් හා කිච්ච ප්‍රභේද පැහැදිලි කිරීම
- කිත් ප්‍රත්‍යය ප්‍රභේද දක්වා නිදසුන් දැක්වීම
- කිතකවල ප්‍රයෝජන ලියා දැක්වීම
- නිර්දිෂ්ට කෘතිවල එන කිතක පද උපුටා දැක්වීම
- කිතක පද යොදා වාක්‍ය සැකසීම

**තක්සේරුව හා ඇගයීම**

- කිතක යනු මොනවාදැයි හඳුන්වා දෙයි.
- කිතක පද උපුටා දක්වයි.

- කිතකවල පද සාධනය පෙන්වා දෙයි.
- කිතක ප්‍රභේද කොට දක්වයි.
- ඒ ඒ ප්‍රභේදයට අයත් ප්‍රත්‍යය දක්වා නිදසුන් දෙයි.
- කිතක පද භාවිත වන විවිධ ආකාර සඳහා නිදසුන් සපයයි.
- කිතක පද යොදා වාක්‍ය ලියයි.

**ගුණාත්මක යෙදවුම්**

- පාලි ව්‍යාකරණ විවරණය, සිරිනිවාස හිමි, මයිලැවේ.: සමයවර්ධන, කොළඹ, 1966.
- 13 ශ්‍රේණියට නියමිත නිර්දිෂ්ට ග්‍රන්ථ

**වැඩි දුර ගවේෂණය**

- පාලි භාෂාවතරණය 1, 2, බුද්ධදත්ත නා හිමි, පොල්වත්තේ.: සමයවර්ධන, කොළඹ, 1999.
- පාලි භාෂාව හා රචනය, සිරි සම්බෝධි හිමි, පැණිහෙළ.: සමයවර්ධන, කොළඹ, 1999.

## 06. ඒකකය - ධාතු ගණ හා ආඛ්‍යාත වරනැඟීම

**නිපුණතාව**

1.0 පාලි භාෂාවේ මූලික වියරණ හා භාෂා ප්‍රයෝග නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම**

1.1 මූලික ව්‍යාකරණ විධිවලට අනුකූල ව ලේඛන කාර්යයේ යෙදෙයි.

**කාලච්ඡේද** 06 යි

**ඉගෙනුම් පල**

- ධාතු ගණ නම් කරයි.
- ධාතු ගණවලට අයත් විකරණ ප්‍රත්‍යය ලියයි.
- ආඛ්‍යාත පදයන්හි පදසිද්ධිය දක්වයි.
- ධාතු ගණ, විකරණ ප්‍රත්‍යය, ක්‍රියාංගය හා ආඛ්‍යාත පදය ප්‍රකට වන පරිදි වගුවක් පිළියෙල කරයි.
- ආඛ්‍යාත විභක්ති 8 නම් කරයි.
- ආඛ්‍යාත විභක්තිවලට අයත් ප්‍රත්‍යය ලියා දක්වයි.
- ආඛ්‍යාත පදයක විභක්තිය, ධාතු මූලය, ධාතු ගණය, පදය, පුරුෂය හා වචනය වෙන් කර දක්වයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය යටතේ, දී ඇති උපදෙස් අනුගමනය කරමින් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත් කරගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- ධාතු ගණ 7ක් වන බව
- ධාතු ගණවලට අයත් විකරණ ප්‍රත්‍යය ඇති බව
- ධාතුවට අදාළ විකරණ ප්‍රත්‍ය යොදා ක්‍රියාංගය සකසා ගත යුතු බව
- ආඛ්‍යාත ප්‍රත්‍යයක් යොදා ආඛ්‍යාත පදයක් සකසා ගත යුතු බව
- ආඛ්‍යාත විභක්ති 8ක් ඇති බව
- ආඛ්‍යාත විභක්තිවලට අයත් ප්‍රත්‍යය ඇති බව
- ආඛ්‍යාත පදයක විභක්තිය, ධාතු මූලය, ධාතු ගණය, පදය, පුරුෂය හා වචනය ලියා දැක්විය යුතු බව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- ධාතු ගණ 07 නම් කිරීම
- ධාතු ගණවලට අයත් විකරණ ප්‍රත්‍යය දැක්වීම
- වර්තමාන ක්‍රියාංගය සකසා ගැනීම
- ප්‍රත්‍යය යොදා ආඛ්‍යාත පද සැකසීම
- ඡේදයක ඇති ආඛ්‍යාත පද උපුටා දැක්වීම
- ආඛ්‍යාත විභක්ති ලියා දක්වා ඒවාට අයත් ප්‍රත්‍යය මාලාව ලිවීම
- ආඛ්‍යාතවල විශේෂ ප්‍රයෝග දැක්වීම
- ආඛ්‍යාත පදයන්හි ආඛ්‍යාතය, ධාතුව, විකරණය, ධාතු ගණය, පදය, පුරුෂය හා වචනය දැක්වීම

**තක්සේරුව හා ඇගයීම**

- ධාතු ගණ 7 ලියා දක්වයි.
- ධාතු ගණවලට අයත් විකරණ ප්‍රත්‍යය ලියයි.
- ආඛ්‍යාත පදයන්හි පදසිද්ධිය දක්වයි.
- ආඛ්‍යාත විභක්ති නම් කරයි.

- ආඛ්‍යාත වරනගා දක්වයි.
- ඡේදයක ඇති ආඛ්‍යාත පද උපුටා දක්වා විභක්ති නම් කරයි.
- ධාතු ගණ හා විකරණ ප්‍රත්‍යය වගුගත කර දක්වයි.

**ගුණාත්මක යෙදවුම්**

- පාලි ව්‍යාකරණ විවරණය, සිරිනිවාස හිමි, මයිලැවේ.: සමයවර්ධන, කොළඹ, 1966.

**වැඩි දුර ගවේෂණය**

- පාලි භාෂාවතරණය 1, 2, බුද්ධදත්ත නා හිමි, පොල්වත්තේ.: සමයවර්ධන, කොළඹ, 1999.

# 07. ඒකකය - ප්‍රයෝජ්‍ය ක්‍රියා භාවිතය

**නිපුණතාව**

1.0 පාලි භාෂාවේ මූලික ව්‍යාකරණ හා භාෂා ප්‍රයෝග නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම**

1.2 සාම්ප්‍රදායික යෙදුම් හා වාඞ්මාලාව පිළිබඳ අවධානය යොමු කරමින් භාෂාව භාවිත කරයි.

**කාලච්ඡේද** 04 යි

**ඉගෙනුම් පල**

- ප්‍රයෝජ්‍ය ක්‍රියාව හඳුන්වයි.
- ප්‍රයෝජ්‍ය ක්‍රියා ප්‍රත්‍යය නම් කරයි.
- ප්‍රයෝජ්‍ය ක්‍රියාවන්හි පද සිද්ධිය පැහැදිලි කරයි.
- අකර්මක වාක්‍ය සකර්මක වන ආකාරය පෙන්වා දෙයි.
- සකර්මක වාක්‍ය ද්විකර්මක වන ආකාරය පෙන්වා දෙයි.
- ද්විකර්මක වාක්‍ය බහුකර්මක වන ආකාරය පෙන්වා දෙයි.
- පූර්වක්‍රියා හා තුමන්ත ක්‍රියාවන්හි ප්‍රයෝජ්‍ය රූප ලියා දක්වයි.
- නිර්දිෂ්ට කෘතිවල එන ප්‍රයෝජ්‍ය ක්‍රියා උපුටා දක්වයි.
- ප්‍රයෝජ්‍ය ක්‍රියා යොදා වාක්‍ය ලියයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය යටතේ, දී ඇති උපදෙස් අනුගමනය කරමින් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත් කරගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- කෙනෙකු ලවා, කරවන ක්‍රියා ප්‍රයෝජ්‍ය ක්‍රියා බව
- ප්‍රයෝජ්‍ය ක්‍රියා (කාරිත) ප්‍රත්‍යය 4ක් ඇති බව
- පූර්වක්‍රියා හා තුමන්ත ක්‍රියාවන්හි ද කාරිත ප්‍රත්‍යය යෙදෙන බව
- ප්‍රයෝජ්‍ය ක්‍රියා භාවිතයේ දී අකර්මක වාක්‍ය සකර්මක වන බව ද සකර්මක වාක්‍ය ද්විකර්මක වාක්‍ය වන බව සහ ද්විකර්මක වාක්‍ය බහුකර්මක වාක්‍ය වන බව
- නිර්දිෂ්ට කෘතිවල එන ප්‍රයෝජ්‍ය ක්‍රියා උපුටා දැක්විය යුතු බව
- ප්‍රයෝජ්‍ය ක්‍රියා යොදා කෙටි වාක්‍ය දිගු කළ හැකි බව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- ප්‍රයෝජ්‍ය ක්‍රියා ප්‍රත්‍යය 4 ලියා දැක්වීම
- ප්‍රයෝජ්‍ය ක්‍රියා ප්‍රත්‍යය යොදා ප්‍රයෝජ්‍ය ක්‍රියා පද සකසා ගැනීම
- පූර්වක්‍රියා හා තුමන්ත ක්‍රියා සමග කාරිත ප්‍රත්‍යය යෙදෙන බව
- අනුබන්ධ "ණ" කාරය හේතුවෙන් ආදි ස්වරය වෘද්ධි වන බව
- ප්‍රයෝජ්‍ය ක්‍රියා යෝගයේ දී අකර්මක වාක්‍ය සකර්මක වන බව
- සකර්මක වාක්‍ය ද්විකර්මක වන බව හා ද්විකර්මක වාක්‍ය බහුකර්මක වන බව
- නිර්දිෂ්ට කෘතීන්හි එන ප්‍රයෝජ්‍ය ක්‍රියාපද උපුටා දැක්විය යුතු බව
- ප්‍රයෝජ්‍ය ක්‍රියාපද යොදා වාක්‍ය දිගුකොට ලිවිය යුතු බව

**තක්සේරුව හා ඇගයීම**

- ප්‍රයෝජ්‍ය ක්‍රියාව හඳුන්වා දෙයි.
- ප්‍රයෝජ්‍ය ක්‍රියා ප්‍රත්‍යය (කාරිත ප්‍රත්‍යය) ලියා දක්වයි.
- කාරිත ප්‍රත්‍යය යොදා ප්‍රයෝජ්‍ය ක්‍රියා පද සාදයි.
- අකර්මක වාක්‍ය සකර්මක වීම, සකර්මක වාක්‍ය ද්විකර්මක වාක්‍ය වීම හා ද්විකර්මක වාක්‍ය බහුකර්මක වාක්‍ය වීම පෙන්වා දෙයි.

- පූර්වක්‍රියා හා තුමන්ත ක්‍රියාවන්හි කාරිත ප්‍රත්‍යය යොදා ප්‍රයෝජ්‍ය ක්‍රියා පද සකසයි.
- නිර්දිෂ්ට කෘතිවල ප්‍රයෝජ්‍ය පද උපුටා දක්වයි.
- ප්‍රයෝජ්‍ය ක්‍රියා පද යොදා වාක්‍ය නිර්මාණය කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- පාලි ව්‍යාකරණ විවරණය, සිරිනිවාස හිමි, මයිලෑවේ.: සමයවර්ධන, කොළඹ, 1966.

**වැඩි දුර ගවේෂණය**

- පාලි භාෂාව 5 මූලික පිරිවෙන, අධ්‍යාපන ප්‍රකාශන දෙපාර්තමේන්තුව, සමයවර්ධන, 2013.

## 08. ඒකකය - අතිරේක පද භාවිතය

**නිපුණතාව**

1.0 පාලි භාෂාවේ මූලික වියරණ හා භාෂා ප්‍රයෝග නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම**

1.2 සාම්ප්‍රදායික යෙදුම් හා වාඞ්මාලාව පිළිබඳ අවධානය යොමු කරමින් භාෂාව භාවිත කරයි.

**කාලච්ඡේද** 06 යි

**ඉගෙනුම් පල**

- අණ කිරීම, විධානයක් කිරීම විධි ක්‍රියාව බව ප්‍රකාශ කරයි.
- විධි ක්‍රියාව සඳහා පඤ්චමී ආඛ්‍යාත විභක්තිය යොදා ගනියි.
- වාක්‍යයන්හි ඇති විධි ක්‍රියා පද උපුටා දක්වා මාධ්‍ය භාෂාවට නගයි.
- විධි ක්‍රියා පද යොදා වාක්‍ය ලියා දක්වයි.
- ආමන්ත්‍රණය සඳහා ආලපන විභක්තිය භාවිත කරයි.
- ආමන්ත්‍රණ වාචී පද, වාක්‍යවල මුල, මැද, අග යන කවර තැනක හෝ යෙදෙන බව පෙන්වා දෙයි.
- ආමන්ත්‍රණාර්ථයේ හෙ, හො, රෙ, භණෙ, භොති, භවන්තො යන ආමන්ත්‍රණ වාචී පද භාවිත කරයි.
- ආමන්ත්‍රණ වාචී පද සහිත වාක්‍ය මාධ්‍ය භාෂාවට නගයි.
- ආමන්ත්‍රණ වාචී පද යොදා වාක්‍ය නිර්මාණය කරයි.
- විස්මයාර්ථ වාචී නිපාත හා යෙදුම් ගෙන හැර දක්වයි.
- විස්මයාර්ථ වාචී පද යොදා වාක්‍ය නිර්මාණය කරයි.
- විස්මයාර්ථ වාචී පද සහිත වාක්‍ය මාධ්‍ය භාෂාවට නගයි.
- පාලියේ යුගල පද හඳුන්වයි.
- සජීවී බව රැක ගැනීමට යුගල පද භාවිත කරන බව පෙන්වා දෙයි.
- නිර්දිෂ්ට ග්‍රන්ථවල යුගල පද යෙදී ඇති තැන් උපුටා දක්වයි.
- යුගල පද රැස් කරයි.
- යුගල පද සහිත වාක්‍ය නිර්මාණය කර මාධ්‍ය භාෂාවට නගයි.
- ඛේදාර්ථ වාචී පද උපුටා දක්වයි.
- ඛේදාර්ථ වාචී පද සහිත වාක්‍ය මාධ්‍ය භාෂාවට නගයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය යටතේ, දී ඇති උපදෙස් අනුගමනය කරමින් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත් කරගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- විධි ක්‍රියා යනු විධානයක් හෝ නියෝගයක් බව
- විධි ක්‍රියා සඳහා පඤ්චමී ආඛ්‍යාතය යෙදෙන බව (ආණත්‍යාසිට්ඨෙනුත්තකාලෙ පඤ්චමී)
- විධි ක්‍රියා සඳහා සත්තමී ආඛ්‍යාතය ද විකල්පයෙන් යෙදෙන බව
- විධි ක්‍රියාර්ථයෙහි ඒකවචන උක්ත සඳහා බහුවචන ආඛ්‍යාත ද යෙදී ඇති බව (ගණ්හථාවුසො පත්තචීවරං)
- විධානාර්ථයේ නිපාත පද යෙදෙන බව
- ආලපන විභක්තිය හා ආමන්ත්‍රණ පද හඳුනාගත යුතු බව
- ආමන්ත්‍රණ වාචී පද වර්තමාන කාල මධ්‍යම පුරුෂයෙන් යෙදෙන බව
- ආමන්ත්‍රණාර්ථයේ හෙ, රෙ, ජෙ, හො, භොති, භණෙ, අරෙ වැනි නිපාත පද යෙදෙන බව

- විස්මයාර්ථ වාචී අහො, අච්ඡරියං, අබ්භුතං වැනි පද හඳුනාගෙන භාවිත කළ යුතු බව
- යුගල වශයෙන් යෙදෙන පත්තචීවර, යුගනංගල, පුත්තදාර, පසාදසංවේග වැනි පද යුගල පද වන බව
- ඛේදාර්ථ පද යනු සංවේගය, කනගාටුව දනවන අහෝ, හා, වැනි පද බව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- විධි ක්‍රියා, ආමන්ත්‍රණ පද, විස්මය වාචී යෙදුම්, යුගල පද හා ඛේදාර්ථ පද වෙන වෙනම පෙන්වා දීම
- ඒ ඒ යෙදුම් සඳහා උදාහරණ සැපයීම
- නිර්දිෂ්ට කෘතිවලින් උපුටා ගත් යෙදුම් ලියා දැක්වීම
- ඒ ඒ යෙදුම් සහිත වාක්‍ය මාධ්‍ය භාෂාවට නැඟීම
- විධි ක්‍රියා, ආමන්ත්‍රණවාචී පද, විස්මය වාචි යෙදුම්, යුගල පද හා ඛේදාර්ථ පද යොදා ගනිමින් සන්නිවේදනයේ යෙදීම
- ඉහත කී පද සහිත වාක්‍ය තැනීම

**තක්සේරුව හා ඇගයීම**

- විධි ක්‍රියා, ආමන්ත්‍රණ පද, විස්මය වාචී යෙදුම්, යුගල පද හා ඛේදාර්ථ පද, වෙන වෙන ම
  පැහැදිලි කරයි.
- ඒ ඒ යෙදුම් සඳහා නිදසුන් සපයයි.
- නිර්දිෂ්ට කෘතිවලින් උපුටා ගත් විධි ක්‍රියා, ආමන්ත්‍රණ වාචී පද, විස්මය වාචී යෙදුම්, යුගල පද හා ඛේදාර්ථ පද ලියා දක්වයි.
- ඉහත කී පද සහිත වාක්‍ය නිර්මාණය කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- නිර්දිෂ්ට කෘති (13 ශ්‍රේණියට අදාළ)
- පාලි ව්‍යාකරණ විවරණය, සිරිනිවාස හිමි, මයිලෑවේ.: සමයවර්ධන, කොළඹ, 1966.

**වැඩි දුර ගවේෂණය**

- පාලි ගද්‍ය පද්‍ය රචනා, බුද්ධදත්ත නාහිමි, පොල්වත්තේ.: අම්බලන්ගොඩ, 1960.
- පාලි භාෂාවතරණය 3, බුද්ධදත්ත නාහිමි, පොල්වත්තේ.: සමයවර්ධන, කොළඹ, 1999.

# 09. ඒකකය - රචනා ලිවීම

**නිපුණතාව**

1.0 පාලි භාෂාවේ මූලික ව්‍යාකරණ හා භාෂා ප්‍රයෝග නිවැරදි ව භාවිත කරයි.

**නිපුණතා මට්ටම**

1.3 පාලි භාෂා ව්‍යවහාරයට අනුකූල ව රචනය හුරු කර ලියයි.

**කාලච්ඡේද** 03 යි

**ඉගෙනුම් පල**

- ක්‍රියාකාරක පද සම්බන්ධය හඳුනාගෙන වාක්‍ය ලියයි.
- කෙටි වාක්‍ය දිගු වාක්‍ය බවට පත් කරයි.
- දිගු වාක්‍ය කෙටි වාක්‍ය බවට හරවයි.
- නිපාත, උපසර්ග මෙන් ම උපමා, රූපක ආදිය යොදා අලංකාරාත්මක වාක්‍ය ලියයි.
- පාලි භෂා රීත්‍යනුකූල ව වාක්‍ය ගොඩනගයි.
- පෙළ සාහිත්‍යයේ භාෂා ශෛලිය මෙන් ම ප්‍රයෝග ද අදාළ කරගනිමින් වාක්‍ය සාදයි.
- පාලි භාෂාවෙන් ලියැවී ඇති විවිධ ගද්‍ය කොටස් කියවයි.
- විවිධ මාතෘකා අනුව ගද්‍ය රචනා කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය යටතේ, දී ඇති උපදෙස් අනුගමනය කරමින් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත් කර ගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- කෙටි වාක්‍ය ලිවිය යුතු බව
- කෙටි වාක්‍යවලට විශේෂණ, පූර්ව ක්‍රියා, තුමන්ත ක්‍රියා, නිපාත හා උපසර්ග යොදා වාක්‍ය දිගු කොට ලිවිය යුතු බව
- දිගු වාක්‍ය සමාස, තද්ධිත ආදිය යොදා කෙටි කළ යුතු බව
- පාලි රීත්‍යනුකූල ව වාක්‍ය ලිවිය යුතු බව
- පාලි භාෂා ප්‍රයෝග භාවිත කළ යුතු බව
- ශෛලිගත හා අලංකාරාත්මක වාක්‍ය ලිවිය යුතු බව
- මාතෘකානුකූල ව ගද්‍ය රචනා ලිවිය යුතු බව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- උක්තය කර්මය හා ක්‍රියාවෙන් යුතු වාක්‍ය ලියවීම
- එම වාක්‍යවලට විශේෂණ පද එක් කිරීම
- සමාස, තද්ධිත ආදි පද යොදා වාක්‍ය කෙටි කිරීම
- පූර්ව ක්‍රියා, තුමන්ත ක්‍රියා, නිපාත හා උපසර්ග යොදා වාක්‍ය දිගු කිරීම
- නිපාත, උපසර්ග, උපමා, රූපක ආදිය යොදා ගනිමින් වාක්‍ය අලංකාර කිරීම
- පෙළ ග්‍රන්ථවල ඇති වාක්‍ය උපුටාගෙන ඒවායේ රීතිය තේරුම් ගැනීම
- වාක්‍ය රචනයේ දී පාලි භාෂා ප්‍රයෝග භාවිත කිරීම
- මාතෘකානුකූල ව කෙටි රචනා ලිවීම

**තක්සේරුව හා ඇගයීම**

- නිවැරදි ව වාක්‍ය ලියයි.
- කෙටි වාක්‍ය දිගු වාක්‍ය බවට හරවයි.
- දිගු වාක්‍ය කෙටි වාක්‍ය බවට පත් කරයි.

- පෙළ සාහිත්‍යයේ රීතිය තේරුම් ගනිමින් වාක්‍ය ලියා දක්වයි.

- විවිධ මාතෘකා යටතේ සරල රචනා ලියයි.
- පාලි ඡේද සාරාංශ කර ලියයි.

**ගුණාත්මක යෙදවුම්**

- නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට කෘති

**වැඩි දුර ගවේෂණය**


- පාලි රචනා I,  විමලවංස හිමි, බද්දේගම.ඃ ගොඩගේ, 1989.
- පාලිපාඨමඤ්ජරී I,II, පියරතන හිමි, කහඳමෝදර.ඃ සමයවර්ධන, කොළඹ, 2016.
- පාලි ගද්‍ය පද්‍ය රචනා, බුද්ධදත්ත නාහිමි, පොල්වත්තේ.ඃ අම්බලන්ගොඩ, 1960.

# 10. ඒකකය - සාම්ප්‍රදායික භාෂා ප්‍රයෝග භාවිතය

**නිපුණතාව**

2.0 නිවැරදි වාචික සන්නිවේදනයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම**

2.1 නිවැරදි ව බස හසුරුවමින් සන්නිවේදන කාර්යයේ යෙදෙයි.

**කාලච්ඡේද** 10 යි

**ඉගෙනුම් පල**

- කථා ව්‍යවහාරයට අවශ්‍ය වචන මාලාවක් යොදා ගනියි.
- එදිනෙදා අදහස් හුවමාරු කර ගැනීමට සරල පාලි භාෂා ප්‍රයෝග අවබෝධයෙන් භාවිත කරයි.
- නිර්දිෂ්ට ග්‍රන්ථාගත ඡේද හා ගාථා ආශ්‍රයෙන් ප්‍රශ්නෝත්තර සකසා ලියයි.
- ඔවුනොවුන් චකිතයකින් තොර ව සංවාදයේ යෙදෙයි.
- තෝරා ගත් ජාතක කථා හා කොටස් සංවාද වශයෙන් ඉදිරිපත් කරයි.
- වාචික සන්නිවේදනයට අවශ්‍ය යෙදුම් නිර්දිෂ්ට ග්‍රන්ථවලින් උපුටා දක්වයි.
- පන්ති කාමරය තුළ දී සාම්ප්‍රදායික පාලි භාෂා ප්‍රයෝග යොදා ගනිමින් අදහස් ප්‍රකාශ කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය යටතේ, දී ඇති උපදෙස් අනුගමනය කරමින් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත් කර ගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- පාලි භාෂා මාධ්‍යයෙන් අදහස් ප්‍රකාශ කළ හැකි බව
- සංවාදයට සුදුසු යෙදුම් හා වාක්‍ය තෝරා ගත යුතු බව
- එකී යෙදුම් හා වාක්‍ය මාධ්‍ය භාෂාවට නැගිය යුතු බව
- නිර්දිෂ්ට කෘතිවලින් තෝරා ගත් තේමා යටතේ අදහස් ගොනු කර ඉදිරිපත් කළ යුතු බව
- දීර්ඝ වාක්‍ය කෙටි වාක්‍ය ලෙස සාම්ප්‍රදායික භාෂා ප්‍රයෝග යටතේ සම්පාදනය කළ හැකි බව
- සංවාදයට සුදුසු යෙදුම් හා වාක්‍ය, නිර්දිෂ්ට කෘතිවලින් උපුටා දැක්විය යුතු බව
- පන්ති කාමරය තුළ පාලියෙන් අදහස් ප්‍රකාශ කළ යුතු බව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- සංවාදය මගින් භාෂාවේ ජීවගුණය ආරක්ෂා වන බව පෙන්වා දීම
- සංවාද ස්වරූපයේ ඡේද හඳුන්වා දීම
- සාම්ප්‍රදායික පාලි දෙබස් උපුටා ගෙන ප්‍රදර්ශනය කිරීම
- නිර්දිෂ්ට ග්‍රන්ථාගත ඡේද ප්‍රශ්නෝත්තර ලෙස ගොනු කර ලීම
- කෙටි වාක්‍ය දීර්ඝ වාක්‍ය ලෙස සකස් කර දීම.
- දීර්ඝ වාක්‍ය කෙටි වාක්‍ය ලෙස සකස් කර දීම
- පන්ති කාමරය තුළ දී පාලි භාෂා මාධ්‍යයෙන් සංවාදාත්මක වදන් භාවිතයෙන් සිසුන් ප්‍රබෝධවත් කිරීම
- පන්ති කාමරය තුළ දී සිසුන් දෙදෙනා බැගින් සංවාද කිරීමට යොමු කිරීම
- වාචික සන්නිවේදනයට සුදුසු ලෙස සාම්ප්‍රදායික වාක්‍ය තැනවීම
- සමිති සම්භාෂණ ආදියට යෝග්‍ය සාම්ප්‍රදායික දෙබස් සම්පාදනය කරවීම

**තක්සේරුව හා ඇගයීම**

- සංවාද ස්වරූපයේ ඡේද හඳුන්වා දෙයි.

- දීර්ඝ වාක්‍ය කෙටි වාක්‍ය ලෙස සකස් කරයි.
- නිර්දිෂ්ට ග්‍රන්ථාගත ඡේද ප්‍රශ්නෝත්තර ලෙස ගොනුකර ලියයි.
- වාචික සන්නිවේදනයට සුදුසු සාම්ප්‍රදායික වාක්‍ය තනයි.
- සමිති සම්භාෂණ ආදියට යෝග්‍ය සාම්ප්‍රදායික දෙබස් සම්පාදනය කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- නිර්දිෂ්ට පාඨ ග්‍රන්ථ
- පාලි වරනැගිල්ල, පියරතන හිමි, වෑගම.: ගොඩගේ, කොළඹ, 2008.
- පාලි භාෂාව හා රචනය, සිරි සම්බෝධි හිමි, පැණිහෙළ.: සමයවර්ධන, කොළඹ, 1999.

**වැඩි දුර ගවේෂණය**

- පාලි ගද්‍ය පද්‍ය රචනා, බුද්ධදත්ත හිමි, පොල්වත්තේ.: අම්බලන්ගොඩ, 1960.

## 11. ඒකකය - සාමීචිකථා

**නිපුණතාව**

2.0 නිවැරදි වාචික සන්නිවේදනයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම**

2.2 පාලි භාෂා මාධ්‍යයෙන් දැනගත් භාෂණ ප්‍රයෝග වාචික සන්නිවේදනයෙහි උචිත පරිදි භාවිත කරයි.

**කාලච්ඡේද** 10 යි

**ඉගෙනුම් පල**

- සංවාද ස්වරූපයේ පාලි ගද්‍ය පද්‍ය පාඨ කියවයි.
- ගද්‍ය හා පද්‍ය සංවාද කොටස් එක්රැස් කරයි.
- එදිනෙදා ව්‍යවහාරයට අදාළ ව සංවාද ගොඩනගයි.
- ප්‍රශ්නවාචක සර්වනාම හා නිපාත යොදා ගනිමින් ප්‍රශ්න අසයි.
- ප්‍රශ්න කිරීම හා උත්තර දීම පිළිබඳ ව පාලි සම්ප්‍රදාය අනුගමනය කරමින් සංවාද කරයි.
- පාලි සංවාදවල සරල හා රසවත් බව අගයමින් තම මිතුරන් සමග සාකච්ඡා කරයි. අදහස් පළ කරයි.
- එදිනෙදා තොරතුරු දැනගැනීමට ප්‍රශ්න අසයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය යටතේ, දී ඇති උපදෙස් අනුගමනය කරමින් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත් කර ගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- සරල හා රසවත් සංවාදාත්මක වාක්‍ය නිර්මාණය කළ යුතු බව
- ප්‍රශ්න ඇසීම සඳහා ප්‍රශ්නවාචක සර්වනාම හා නිපාත භාවිත වන බව
- නිදර්ශන සංවාද ඇසුරින් සංවාද ගොඩනැගිය යුතු බව
- ඒවා අනුව සාමීචිකථා පැවැත්විය යුතු බව
- සංවාද ස්වරූපී බුද්ධ දේශනා එක්රැස් කළ යුතු බව
- පහත සඳහන් ආකාරයේ සංවාද නිදර්ශන කර ගත යුතු බව

**<u>කථා සල්ලාපො I</u>**

- **චිත්‍රො** :- සම්ම, මහානාග, ත්වං කුහිං ගච්ඡසි?
- **මහානාගො** :- භො, මිත්ත අහං කොළම්බනගරං ගච්ඡාමි.
- **චිත්‍රො** :- කිමත්ථාය තත්‍ර ගච්ඡසි?
- **මහානාගො** :- මම ජෙට්ඨභාතා තහිං වසති. අහං තස්ස සුඛදුක්ඛං ජානිතුං ගච්ඡාමි.
- **චිත්‍රො** :- තව භාතා කොළම්බනගරෙ කිං කරොති?
- **මහානාගො** :- සො එකස්මිං විජ්ජාලයෙ උග්ගණ්හාපෙති.
- **චිත්‍රො** :- සම්ම, තෙන අහමපි ත්වයා සද්ධිං ආගච්ඡාමි.
- **මහානාගො** :- එවං! එවං! ආගච්ඡතු.
- **චිත්‍රො** :- කදා ත්වං පුනරාගච්ඡිස්සසි?
- **මහානාගො** :- තං වත්තුං න සක්කො. සචෙ ඔකාසං ලභෙය්‍ය අහං පඤ්චදිවසාබ්භන්තරෙ පුනරාගච්ඡිස්සාමි.
- **චිත්‍රො** :- සම්ම, මහානාග, කො හෙතු තව ගමනස්ස?
- **මහානාගො** :- මයා කොළම්බනගරං න දිට්ඨපුබ්බං. තස්මා අහං තස්ස නගරස්ස විභූතිං පස්සිතුං ඉච්ඡාමි. තදත්ථාය ගච්ඡිස්සාමි. නාඤ්ඤකාරණං.
- **චිත්‍රො** :- නනු කොළම්බ නගරං සම්පති ලංකායං පධානං නගරං අග්ග

නගරං? තස්මා තං නගරං දස්සනීයං ච මනොහරං ච භවති. තථෙව තස්මිං නගරෙ දස්සනීයට්ඨානානි බහූනි හොන්ති.

- **මහානාගො** :- කිං සම්ම, තානි සබ්බානි ඨානානි ත්‍වයා ඔලොකිතපුබ්බානීති මඤ්ඤෙ?
- **චිත්‍රො** :- නහි, නහි, අහං කතිපයට්ඨානානි අපස්සිං, තෙනහි ආගච්ඡතු! ඉදානි ගමනකාලො.
- **මහානාගො** :- අහං මම මාතාපිතුන්නං ඔකාසං න ලභිං, තස්මා ගෙහං ගන්ත්‍වා අචිරෙන ධූමරට්ඨානං ආගමිස්සාමි, තාව ත්‍වං ගච්ඡාහි.
- **චිත්‍රො** :- මා චිරායතු.
- **මහානාගො** :- හොතු අහං දස විනාළිකාය පුනරාගමිස්සාමි.

## කථා සල්ලාපො II

- **මිත්තො** :- ස්වාගතං පාල, කථං සුඛදුක්ඛං?
- **පාලො** :- සුන්දරං න දුක්ඛරං.
- **මිත්තො** :- භො පාල, කුහිං තව සහායකො?
- **පාලො** :- සො අජ්ජ ගාමං අගමාසි.
- **මිත්තො** :- කිං ත්‍වං එකකො'ව ආගතො'සි?
- **පාලො** :- නහි, නහි, එකො මම සහායකොපි මයා සද්ධිං ආගමි. සො'දානි අංගණෙ තිට්ඨති.
- **මිත්තො** :- එසො මහාසයො තව මිත්තො'ති මඤ්ඤෙ.
- **පාලො** :- ආම.
- **මිත්තො** :- කො නාමො'සි ත්‍වං?
- **ආගන්තුකො** :- අහං කොසලො'ස්මි.
- **මිත්තො** :- සුන්දරං, ආගන්ත්‍වා අස්මිං පීඨෙ නිසීදාහි.
- **මිත්තො** :- චිරදිට්ඨො'සි ත්‍වං පාල.
- **පාලො** :- එවං, අහං ගතමාසෙ මරම්මරට්ඨං අගමාසිං.
- **මිත්තො** :- කිමත්ථාය?
- **පාලො** :- මම කනිට්ඨභාතා තස්මිං රට්ඨෙ වාණිජො. සො'දානි බාළ්හගිලානො, ආතුරාලයෙ භෙසජ්ජත්ථාය චිරායති.
- **මිත්තො** :- ත්‍වං නාවාය ගතොසී'ති මඤ්ඤෙ.
- **පාලො** :- නහි අහං ආකාසයානෙන අගමිං.
- **මිත්තො** :- අත්‍ථි නුඛො තස්මිං රට්ඨෙ දස්සනීයානි ඨානානි?
- **පාලො** :- අත්‍ථි එව, ඡට්ඨසංගායනාභූමි අතිරමණීයා දස්සනීයා ච භවති.
- **මිත්තො** :- කතිදිවසානි ත්‍වං තත්‍ථ චිරායිත්‍ථ?
- **පාලො** :- න දීඝකාලො, සත්තදිවසමත්තං තස්මිං විචරිං.

(පාලි රචනා)

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- නිදර්ශක සංවාදයක් ඉදිරිපත් කිරීම
- සංවාද ගොඩනැගීම
- සංවාද ඉදිරිපත් කිරීම
- ප්‍රශ්නවාචක සර්වනාම පද හා නිපාත යොදා ගනිමින් සංවාද ඇති කිරීම
- සූත්‍රාගත සංවාද ස්වරූපී කොටස් එක්රැස් කොට සංවාද ගොඩ නැගීම

**තක්සේරුව හා ඇගයීම**

- විශේෂ භාෂණ රීතීන් ලියා දක්වයි.
- සරල හා රසවත් බව පිළිබඳ අගය කරමින් සංවාද කරයි.
- ප්‍රශ්න කිරීමමේ දී හා උත්තර දීමේ දී පාලි සම්ප්‍රදාය අනුගමනය කරයි.
- සංවාදාත්මක වාක්‍ය ඛණ්ඩ සොයා ඒ අනුව සාර්ථක ව කථනයේ යෙදෙයි.
- පාලි භාෂා මාධ්‍ය සමිතියේ දී රසවත් ව සංවාදයක් ඉදිරිපත් කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- නිර්දිෂ්ට පාඨ ග්‍රන්ථ
- පාලි රචනා I, II, විමලවංස හිමි, බද්දේගම.: ගොඩගේ, 1989.

**වැඩි දුර ගවේෂණය**

- පාලි භාෂාව හා රචනය, සිරි සම්බෝධි හිමි, පැණිහෙළ.: සමයවර්ධන, කොළඹ, 1999.
- පාලිපාඨ මඤ්ජරී I, පියරතන හිමි, කහදාමෝදර.: සමයවර්ධන, කොළඹ, 2016.

# 12. ඒකකය - සමිති කථා

**නිපුණතාව**

2.0 නිවැරදි වාචික සන්නිවේදනයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම**

2.3 නිවැරදි ව බස හසුරුවමින් සන්නිවේදන කාර්යයේ යෙදෙයි.

**කාලච්ඡේද 10 යි.**

**ඉගෙනුම් පල**

- පාලි කථාවක් ගොඩනගන ආකාරය පිළිබඳ මිත්‍රයන් සමග සාකච්ඡා කරයි.
- පාලි කථා පුහුණුව සඳහා අන්‍යයන් සමග සහයෝගයෙන් ක්‍රියා කරයි.
- නිවැරදි කථාවක් ගොඩනගයි.
- සබකෝලයෙන් තොර ව පාලි භාෂා මාධ්‍යයෙන් සාර්ථක කථාවක් පවත්වයි.
- පාලි භාෂා මාධ්‍ය සමිතිය සාර්ථක කර ගැනීමට තම හැකියාව උපරිමයෙන් ලබා දෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය යටතේ දී ඇති උපදෙස් අනුගමනය කරමින් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත් කර ගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- පාලි භාෂා මාධ්‍යයෙන් කතා පැවැත්වීම අවශ්‍ය බවත් එය සරල බවත් අවබෝධ කරවීම
- පාලි කථාවක සන්දර්භය
    - සුබපැතීම්
    - ආමන්ත්‍රණ විධි
    - කරුණු පෙළ ගැස්වීම
    - කථාව ගොඩනැගීම
    - මුල මැද අග මනා ව සම්බන්ධ කිරීම
    - සාරාංශය
    - අවසන් කිරීම ආදි වශයෙන් අවශ්‍ය දෑ
    - ස්වනිර්මාණ කථා ඉදිරිපත් කිරීම

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- පාලි භාෂා මාධ්‍ය සමිතියක් සංවිධානය කිරීම
- ඉදිරිපත් කිරීම් සැකසීම
- යෝජනා හා සාකච්ඡා සැකසීම හා ඉදිරිපත් කිරීම
- වාර්තා ලිවීම, ඉදිරිපත් කිරීම හා සභා සම්මත කිරීම
- අය වැය වාර්තාව සැකසීම හා ඉදිරිපත් කිරීම
- ගාථා හා කථා ඉදිරිපත් කිරීම

**තක්සේරුව හා ඇගයීම**

- පාලි භාෂා මාධ්‍යයෙන් කථාවක් ගොඩනැගීමට අවශ්‍ය මූලික කරුණු නම් කරයි.
- නිවැරදි ව සම්ප්‍රදායානුකූල ව භාෂා රීති සහිත ව කථාවක් ගොඩනගයි.
- පාලි භාෂා මාධ්‍යයෙන් කථාවක් ඉදිරිපත් කරයි.
- පාලි භාෂා මාධ්‍ය වැඩසටහන්වලට නොපැකිල ව ඉදිරිපත් වෙයි.

**ගුණාත්මක යෙදවුම්**

- නිර්දිෂ්ට පාඨ ග්‍රන්ථ
- පාලි රචනා I, II, විමලවංස හිමි, බද්දේගම.: ගොඩගේ, 1989.
- ස්ව නිර්මාණ

**වැඩි දුර ගවේෂණය**

- පාලි භාෂාව හා රචනය, සිරි සම්බෝධි හිමි, පැණිහෙළ.: සමයවර්ධන, කොළඹ, 1999.
- පාලිපාඨ මඤ්ජරී I/II, පියරතන හිමි, කහඳාමෝදර.: සමයවර්ධන, කොළඹ, 2016.

## 13. ඒකකය - උච්චාරණය හා ස්මරණය

**නිපුණතාව**

3.0 නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට ගද්‍ය පද්‍ය පාඨ කියවා භාවිතයට හුරු වෙයි.

**නිපුණතා මට්ටම**

3.1 පද්‍යයක් නිවැරදි වීරිතට හා යතියට අනුව ලයාන්විතව ගායනා කරයි.
3.2 සූත්‍රපාඨ ශ්‍රැතිගෝචර රටාවෙන් හඬ නගා ගායනා කරයි
3.3 උපයෝගීතාවෙන් යුතු පාලි ගද්‍ය පද්‍ය පාඨ වනපොත් කරයි.

**කාලච්ඡේද** 10යි
**ඉගෙනුම් පල**

- නමස්කාර ගාථා ලයාන්විත ව ගායනා කරයි.
- නිර්දිෂ්ට පද්‍ය කොටස් නිවැරදි ව උච්චාරණය කරමින් ගායනා කරයි.
- නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට ගද්‍ය පාඨ නිවැරදි ව උච්චාරණය කරයි.
- ගාථාවන්හි වෘත්තය හා යතිය පිළිබඳ සැලැකිලිමත් ව ගායනා කරයි.
- නිර්දිෂ්ට ගද්‍ය හා පද්‍ය පාඨ මතකයෙන් කියයි.
- ගද්‍ය හා පද්‍ය කොටස් සම්ප්‍රදායානුකූල ව සජ්ඣායනා කරයි.
- නිර්දිෂ්ට ගද්‍ය පද්‍ය පාඨ නිවැරදි පද බෙදීම් සහිත ව ලියා දක්වයි.
- නිවැරදි අක්ෂර වින්‍යාසය සහිත ව ගද්‍ය පද්‍ය පාඨ ලියා දක්වයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය යටතේ, දී ඇති උපදෙස් අනුගමනය කරමින් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත් කර ගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- නමස්කාර ගාථා දේවාරාධනය, දෙවියන්ට පින්දීමේ ගාථා යනාදිය සාම්ප්‍රදායික රිද්මානුකූල ව ගායනා කළ යුතු බව
- පිරිත් සූත්‍රාදිය සම්ප්‍රදායානුකූල ව සජ්ඣායනා කළ යුතු බව
- සුවිශේෂී ගාථා පාඨ වනපොත් කළ යුතු බව
- නිර්දිෂ්ට ගද්‍ය හා පද්‍ය කොටස් හඬනගා කියවිය යුතු බව
- අල්පප්‍රාණ මහාප්‍රාණ නිවැරදි ව භාවිත කළ යුතු බව
- නිර්දිෂ්ට ගද්‍ය පද්‍ය පාඨ නිවැරදි පද බෙදීම් සහිත ව ලියා දැක්විය යුතු බව
- නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට පද්‍ය පාඨ, වෘත්තය හා යතිය පිළිබඳ සැලකිලිමත් වෙමින් ගායනා කළ යුතු බව
- සුවිශේෂී ගද්‍ය පද්‍ය පාඨ වනපොත් කළ යතු බව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- සම්ප්‍රදායානුකූල ව ගායනා කළ නමස්කාර ගාථා ආදිය ඇතුළත් CD තැටියක් ශ්‍රවණය කිරීමට සැලස්වීම
- ඒ අනුව ගාථා සජ්ඣායනයට සිසුන් යොමු කිරීම
- සූත්‍ර හා පිරිත් (පරිත්ත, සුත්ත) ගණ සජ්ඣායනා කිරීම
- විවිධ සම්ප්‍රදායන් අනුගමනය කිරීමට සිසුන් යොමු කිරීම

- ගද්‍ය හා පද්‍ය කොටස් හඬනගා කියවීමට සැලැස්වීම
- අර්ථයට හානි නොවන පරිදි ගද්‍ය පද්‍ය කොටස් ලිවීමට හා සජ්ඣායනයට සිසුන් යොමු කිරීම
- උපයෝගීතාවෙන් යුතු ගද්‍ය පද්‍ය කොටස් වනපොත් කිරීමට සිසුන් යොමු කිරීම
- ගාථා ගායනයේ දී වෘත්තය හා යතිය පිළිබඳ අවධානය යොමු කිරීම
- නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට ගද්‍ය පද්‍ය කොටස් හඬනගා කියවීම

**තක්සේරුව හා ඇගයීම**

- උපයෝගීතාවෙන් යුතු ගද්‍ය පද්‍ය කොටස් මතකයෙන් කියයි; ලියයි.
- නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට ගද්‍ය පද්‍ය කොටස් හඬනගා කියවයි.
- දෝෂ රහිත ව ලේඛන කාර්යයේ යෙදෙයි.
- සූත්‍ර හා පිරිත් ගණ සජ්ඣායනය කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- CD/ කැසට් පට
- නිර්දිෂ්ට ගද්‍ය පද්‍ය පාඨ

## 14. ඒකකය - චුල්ලවග්ගය (වත්තක්ඛන්ධක)

**නිපුණතාව**

4.0 නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට ගද්‍ය පද්‍ය පාඨ පරිවර්තනය කිරීමේ කුසලතාව ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම්**

4. 1 අන්වය හා ක්‍රියාකාරක පද සම්බන්ධතාව නිවැරදි ව සකස් කිරීමේ පරිචය ලබයි.
4. 2 පාලි උද්ධෘත සඳහා පදගතාර්ථ සපයයි.
4. 3 පාලි උද්ධෘත පාඨ මාධ්‍ය භාෂාවට පරිවර්තනය කරයි.
4. 4 මාධ්‍ය භාෂාගත ඡේද රීතියට අනුව පාලියට පරිවර්තනය කරයි.

**කාලච්ඡේද** 12යි

**ඉගෙනුම් පල**

- චුල්ලවග්ගපාළිය පිළිබඳ හැඳින්වීමක් කරයි.
- උපජ්ඣාය හා සද්ධිවිහාරික වත් යනු කවරේ දැයි පැහැදිලි කරයි.
- උපජ්ඣාය හා සද්ධිවිහාරික වත්හි ශාසනික, සංස්කෘතික හා සාමාජික වැදගත්කම පැහැදිලි කරයි.
- උපජ්ඣාය සද්ධිවිහාරිකවත්ත සඳහන් පාඨවල සන්ධි පද විසන්ධි කරයි.
- උපජ්ඣාය සද්ධිවිහාරිකවත්ත සඳහන් පාඨවල සමාස පද අසමාස කරයි.
- උපජ්ඣාය සද්ධිවිහාරික වත් ඇතුළත් පාඨ අවධානයෙන් කියවමින් සුදුසු පරිදි අන්වය සකස් කරයි.
- උපජ්ඣාය සද්ධිවිහාරික වත් ඇතුළත් පාලි පාඨවල සමස්තය තේරුම් ගෙන මාධ්‍ය භාෂාගත රීතීන්ට අනුව පරිවර්තන කාර්යයේ යෙදෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් ඃ**

යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය යටතේ, දී ඇති උපදෙස් අනුගමනය කරමින් විෂය කරුණු ආවරණයවන පරිදි පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත් කර ගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය ඃ**

- චුල්ලවග්ගපාළිය පිළිබඳ හැඳින්වීමක් කළ යුතු බව
- උපජ්ඣාය හා සද්ධිවිහාරික වත් යනු මොනවා දැයි පැහැදිලි කළ යුතු බව
- උපජ්ඣාය හා සද්ධිවිහාරික වත්හි ශාසනික, සංස්කෘතික හා සාමාජික වැදගත්කම පැහැදිලි කළ යුතු බව
- උපජ්ඣාය සද්ධිවිහාරික වත් දැක්වෙන පාඨවල සන්ධි පද විසන්ධි කළ යුතු බව
- උපජ්ඣාය සද්ධිවිහාරික වත් දැක්වෙන පාඨවල සමාස පද අසමාස කළ යුතු බව
- උපජ්ඣාය සද්ධිවිහාරික වත් ඇතුළත් පාඨ අවධානයෙන් කියවමින් සුදුසු පරිදි අන්වය සකස් කළ යුතු බව
- උපජ්ඣාය සද්ධිවිහාරික වත්හි සමස්තය තේරුම් ගෙන මාධ්‍ය භාෂාගත රීතීන්ට අනුව පරිවර්තන කාර්යයේ යෙදිය යුතු බව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය ඃ**

- චුල්ලවග්ගපාළිය පිළිබඳ හැඳින්වීමක් කිරීම
- උපජ්ඣාය හා සද්ධිවිහාරික වත් යනු කවරේ දැයි පැහැදිලි කිරීම
- උපජ්ඣාය හා සද්ධිවිහාරික වත් ශාසනික, සංස්කෘතික හා සාමාජික වශයෙන් වැදගත් වන ආකාරය කෙටියෙන් පැහැදිලි කිරීම
- උපජ්ඣාය සද්ධිවිහාරික වත් ඇතුළත් පාඨවල සන්ධි පද විසන්ධි කිරීම
- උපජ්ඣාය සද්ධිවිහාරික වත් දැක්වෙන පාඨවල සමාස පද අසමාස කිරීම
- උපජ්ඣාය සද්ධිවිහාරික වත් ඇතුළත් පාඨ අවධානයෙන් කියවමින් සුදුසු පරිදි අන්වය සකස් කිරීම
- උපජ්ඣාය සද්ධිවිහාරික වත්හි සමස්තය තේරුම් ගෙන මාධ්‍ය භාෂාගත රීතීන්ට අනුව පරිවර්තන කාර්යයේ යෙදීම

**තක්සේරුව හා ඇගයීම ඃ**

- චුල්ලවග්ගපාළිය පිළිබඳ හැඳින්වීමක් කරයි.
- උපජ්ඣාය හා සද්ධිවිහාරික වත් යනු කවරේ දැයි පැහැදිලි කරයි.
- උපජ්ඣාය හා සද්ධිවිහාරික වත්හි සමස්තය තේරුම් ගෙන මාධ්‍ය භාෂාගත රීතීන්ට අනුව පරිවර්තනය කරයි.
- තෝරාගත් පද සඳහා ව්‍යාකරණ විභාග කරයි.
- උපජ්ඣාය හා සද්ධිවිහාරික වත් ශාසනික, සංස්කෘතික, හා සාමාජික වශයෙන් වැදගත් වන ආකාරය පිළිබඳ කථාවක් පවත්වයි.
- වාචෝද්ගත කළ අත්‍යවශ්‍ය පාඨ මතකයෙන් කියයි, ලියා දක්වයි.

**ගුණාත්මක යෙදවුම් ඃ**

- චුල්ලවග්ගපාළි - වත්තක්ඛන්ධක

**වැඩි දුර ගවේෂණය**

- චුල්ලවග්ගපාළි, බුද්ධ ජයන්ති ත්‍රිපිටක පුනර් මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 2005.

## 15. ඒකකය - අපදානපාළි (වක්කලිත්ථේරාපදාන)

**නිපුණතාව**

4.0 නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට ගද්‍ය පද්‍ය පාඨ පරිවර්තනය කිරීමේ කුසලතාව ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම්**

4. 1 අන්වය හා ක්‍රියාකාරක පද සම්බන්ධතාව නිවැරදි ව සකස් කිරීමේ පරිචය ලබයි.
4. 2 පාලි උද්ධෘත සඳහා පදගතාර්ථ සපයයි.
4. 3 පාලි උද්ධෘත පාඨ මාධ්‍ය භාෂාවට පරිවර්තනය කරයි.
4. 4 මාධ්‍ය භාෂාගත ඡේද රීතියට අනුව පාලියට පරිවර්තනය කරයි.

**කාලච්ඡේද** 12යි

**ඉගෙනුම් පල**

- අපදානපාළිය පිළිබඳ හැඳින්වීමක් කරයි.
- වක්කලි ථේරාපදානය සිය බසින් සරලව පැහැදිලි කරයි.
- වක්කලි ථේරාපදානයට අයත් වග්ගය, ගාථා ගණන ආදිය සහිතව එහි අන්තර්ගතය දක්වයි.
- වක්කලි ථේරාපදානයේ දක්වෙන සන්ධි පද විසන්ධි කරයි.
- වක්කලි ථේරාපදානයේ දක්වෙන සමාස පද අසමාස කරයි.
- වක්කලි ථේරාපදානය අවධානයෙන් කියවමින් සුදුසු පරිදි අන්වය සකස් කරයි.
- වක්කලි ථේරාපදානයෙහි සමස්තය තේරුම් ගෙන මාධ්‍ය භාෂාගත රීතීන්ට අනුව පදගතාර්ථ ලියා දක්වයි.
- වක්කලි ථේරාපදාන ගාථා වාචෝද්ගත කරයි.
- වාචෝද්ගත කළ ගාථා නිවැරදි අක්ෂර වින්‍යාසය හා පද බෙදීම් සහිතව ලියා දක්වයි.
- තෝරාගත් පද සඳහා ව්‍යාකරණ විභාග දක්වයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස් ඃ**

යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය යටතේ දී ඇති උපදෙස් අනුගමනය කරමින් විෂය කරුණු ආවරණයවන පරිදි පාඩම අවසානයේදී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත්කර ගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය ඃ**

- අපදානපාළිය පිළිබඳ හැඳින්වීමක් කළ යුතු බව
- වක්කලි ථේරාපදානය සිය බසින් සරළව පැහැදිලි කළ යුතු බව
- වක්කලි ථේරාපදානයට අයත් වග්ගය, ගාථා ගණන ආදිය සහිතව එහි අන්තර්ගතය දැක්විය යුතු බව
- වක්කලි ථේරාපදානයේ දක්වෙන සන්ධිපද විසන්ධි කළ යුතු බව
- වක්කලි ථේරාපදානයේ දක්වෙන සමාස පද අසමාස කළ යුතු බව
- වක්කලි ථේරාපදානය අවධානයෙන් කියවමින් සුදුසු පරිදි අන්වය සකස් කළ යුතු බව
- වක්කලි ථේරාපදානයෙහි සමස්තය තේරුම් ගෙන මාධ්‍ය භාෂාගත රීතීන්ට අනුව පදගතාර්ථ ලියා දැක්විය යුතු බව
- වක්කලි ථේරාපදාන ගාථා වාචෝද්ගත කළ යුතු බව
- වාචෝද්ගත කළ ගාථා නිවැරදි අක්ෂර වින්‍යාසය හා පද බෙදීම් සහිතව ලියා දැක්විය යුතු බව
- තෝරාගත් පද සඳහා ව්‍යාකරණ විභාග දැක්විය යුතු බව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය ඃ**

- අපදාන පාලිය පිළිබඳ හැඳින්වීමක් කිරීම
- වක්කලි ථේරාපදානය සිය බසින් සරලලව පැහැදිලි කිරීම
- වක්කලි ථේරාපදානයට අයත් වග්ගය, ගාථා ගණන ආදිය සහිතව එහි අන්තර්ගතය දැක්වීම
- වක්කලි ථේරාපදානයේ දක්වෙන සන්ධිපද විසන්ධි කිරීම
- වක්කලි ථේරාපදානයේ දක්වෙන සමාස පද අසමාස කිරීම

- වක්කලි ථේරාපදානය අවධානයෙන් කියවමින් සුදුසු පරිදි අන්වය සකස් කිරීම
- වක්කලි ථේරාපදානයෙහි සමස්තය තේරුම් ගෙන මාධ්‍ය භාෂාගත රීතීන්ට අනුව පදගතාර්ථ ලියා දැක්වීම
- වක්කලි ථේරාපදාන ගාථා වාචෝද්ගත කරවීම
  වාචෝද්ගත කළ ගාථා නිවැරදි අක්ෂර වින්‍යාසය හා පද බෙදීම් සහිතව ලියවීම
- තෝරාගත් පද සඳහා ව්‍යාකරණ විභාග දැක්වීම

**තක්සේරුව හා ඇගයීම ඃ**

- අපදානපාළිය පිළිබඳ හැඳින්වීමක් කරයි.
- වක්කලි ථේරාපදානය සිය බසින් සරලව ලියා දක්වයි.
- වක්කලි ථේරාපදානයට අයත් වග්ගය, ගාථා ගණන ආදිය සහිතව එහි අන්තර්ගතය විස්තර කරයි.
- වක්කලි ථේරාපදානයේ දැක්වෙන සන්ධිපද විසන්ධි කරයි.
- වක්කලි ථේරාපදානයේ දැක්වෙන සමාස පද අසමාස කරයි.
- වක්කලි ථේරාපදානය අවධානයෙන් කියවමින් සුදුසු පරිදි අන්වය සකස් කරයි.
- වක්කලි ථේරාපදානයේ සමස්තය තේරුම් ගෙන මාධ්‍ය භාෂාගත රීතීන්ට අනුව පදගතාර්ථ ලියා දක්වයි.
- වක්කලි ථේරාපදාන ගාථා වාචෝද්ගත මතකයෙන් කියයි.
- වාචෝද්ගත කළ ගාථා නිවැරදි අක්ෂර වින්‍යාසය හා පද බෙදීම් සහිතව ලියා දක්වයි.
- තෝරාගත් පද සඳහා ව්‍යාකරණ විභාග දක්වයි.
- වක්කලි ථේරාපදානයෙන් ගත හැකි ආදර්ශ යන මැයෙන් බිත්ති පුවත්පතට ලිපියක් සකසයි.

**ගුණාත්මක යෙදවුම්**

- අපදානපාළිය

**වැඩි දුර ගවේෂණය**

- අපදානපාළි, බුද්ධ ජයන්ති ත්‍රිපිටක පුනර් මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය, 2005.

# 16. ඒකකය - මහාවංසය

**නිපුණතාව**

4.0 නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට ගද්‍ය පද්‍ය පාඨ පරිවර්තනය කිරීමේ කුසලතාව ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම්**

4. 1 අන්වය හා ක්‍රියාකාරක පද සම්බන්ධතාව නිවැරදි ව සකස් කිරීමේ පරිචය ලබයි.
4. 2 පාලි උද්ධෘත සඳහා පදගතාර්ථ සපයයි.
4. 3 පාලි උද්ධෘත පාඨ මාධ්‍ය භාෂාවට පරිවර්තනය කරයි.
4. 4 මාධ්‍ය භාෂාගත ඡේද රීතියට අනුව පාලියට පරිවර්තනය කරයි.

**කාලච්ඡේද** 12යි

**ඉගෙනුම් පල**

- වංසකථා සාහිත්‍යය පිළිබඳ හැඳින්වීමක් කරයි.
- වංසකථාවලියේ මහාවංසයට හිමි වන ස්ථානය පිළිබඳ හැඳින්වීමක් කරයි.
- දේවානම්පියතිස්ස රජතුමා පිළිබඳ තොරතුරු දැක්වෙන වෙනත් පරිච්ඡේද නම් කරයි.
- 'දෙවානම්පියතිස්සාභිසෙකො' නම් 11 වන පරිච්ඡේදයට අයත් ගාථා ගණන ආදිය සහිතව එහි අන්තර්ගතය දක්වයි.
- මහාවංසය 11 පරිච්ඡේදයේ දැක්වෙන සන්ධි පද විසන්ධි කරයි.
- මහාවංසය 11 පරිච්ඡේදයේ දැක්වෙන සමාස පද අසමාස කරයි.
- මහාවංසයේ 11 වන පරිච්ඡේදය අවධානයෙන් කියවමින් අන්වය සකස් කරයි.
- නිර්දිෂ්ට පරිච්ඡේදයේ සමස්තය තේරුම් ගෙන මාධ්‍ය භාෂාගත රීතීන්ට අනුව පදගතාර්ථ ලියා දක්වයි.
- ගාථාවල ඇති සියලු ක්‍රියා පද වර්ග කර දක්වයි.
- තෝරා ගත් පද සඳහා ව්‍යාකරණ විභාග දක්වයි.
- වංසකථා අධ්‍යයනයේ වටිනාකම හා 'දේවානම්පියතිස්ස රජුගේ සේවය' යන මාතෘකා යටතේ පුවත්පතකට ලිපි සකසයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය යටතේ, දී ඇති උපදෙස් අනුගමනය කරමින් විෂය කරුණු ආවරණයවන පරිදි පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත්කර ගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- වංසකථා සාහිත්‍යය පිළිබඳ හැඳින්වීමක් කළ යුතු බව
- වංසකථාවලියේ මහාවංසයට හිමි වන ස්ථානය පිළිබඳ හැඳින්වීමක් කළ යුතු බව
- දේවානම්පියතිස්ස රජතුමා පිළිබඳ තොරතුරු දැක්වෙන වෙනත් පරිච්ඡේද නම් කළ යුතු බව
- 'දෙවානම්පියතිස්සාභිසෙකො' නම් 11 වන පරිච්ඡේදයට අයත් ගාථා ගණන ආදිය සහිතව එහි අන්තර්ගතය දැක්විය යුතු බව
- මහාවංසය 11 පරිච්ඡේදයේ දැක්වෙන සන්ධි පද විසන්ධි කර දැක්විය යුතු බව
- මහාවංසය 11 පරිච්ඡේදයේ දැක්වෙන සමාස පද අසමාස කර දැක්විය යුතු බව
- මහාවංසයේ 11 වන පරිච්ඡේදය අවධානයෙන් කියවමින් අන්වය සකස් කළ යුතු බව
- නිර්දිෂ්ට පරිච්ඡේදයේ සමස්තය තේරුම් ගෙන මාධ්‍ය භාෂාගත රීතීන්ට අනුව පදගතාර්ථ ලියා දැක්විය යුතු බව
- ගාථාවල ඇති සියලු ක්‍රියා පද වර්ග කර දැක්විය යුතු බව
- තෝරා ගත් පද සඳහා ව්‍යාකරණ විභාග දැක්විය යුතු බව
- 'වංසකථා අධ්‍යයනයේ වටිනාකම' හා 'දේවානම්පියතිස්ස රජුගේ සේවය' යන මාතෘකා යටතේ පුවත්පතකට ලිපි සැකසීමට අවශ්‍ය උපදෙස් ලබා දිය යුතු බව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- වංසකථා සාහිත්‍යය පිළිබඳ හැඳින්වීමක් කිරීම
- වංසකථාවලියේ මහාවංසයට හිමි වන ස්ථානය පිළිබඳ හැඳින්වීමක් කිරීම
- දේවානම්පියතිස්ස රජතුමා පිළිබඳ තොරතුරු දක්වෙන වෙනත් පරිච්ඡේද නම් කිරීම
- 'දෙවානම්පියතිස්සාභිසෙකො' නම් 11 වන පරිච්ඡේදයට අයත් ගාථා ගණන ආදිය සහිත ව එහි අන්තර්ගතය දැක්වීම
- මහාවංසය 11 පරිච්ඡේදයේ දක්වෙන සන්ධි පද විසන්ධි කර දක්වීම
- මහාවංසය 11 පරිච්ඡේදයේ දක්වෙන සමාස පද අසමාස කර දක්වීම
- මහාවංසයේ 11 වන පරිච්ඡේදය අවධානයෙන් කියවමින් අන්වය සකස් කිරීම
- නිර්දිෂ්ට පරිච්ඡේදයේ සමස්තය තේරුම් ගෙන මාධ්‍ය භාෂාගත රීතීන්ට අනුව පදගතාර්ථ ලියා දක්වීම
- ගාථාවල ඇති සියලු ක්‍රියා පද වර්ග කර දක්වීම
- තෝරා ගත් පද සඳහා ව්‍යාකරණ විභාග දක්වීම
- වංසකථා අධ්‍යයනයේ වටිනාකම හා 'දේවානම්පියතිස්ස රජුගේ සේවය' යන මාතෘකාව යටතේ පුවත්පතකට ලිපියක් සැකසීමට අවශ්‍ය උපදෙස් ලබා දීම

**තක්සේරුව හා ඇගයීම**

- වංසකථා සාහිත්‍යය පිළිබඳ හැඳින්වීමක් කරයි.
- වංසකථාවලියේ මහාවංසයට හිමි වන ස්ථානය පිළිබඳ හැඳින්වීමක් කරයි.
- දේවානම්පියතිස්ස රජතුමා පිළිබඳ තොරතුරු දක්වෙන වෙනත් පරිච්ඡේද නම් කරයි.
- 'දෙවානම්පියතිස්සාභිසෙකො' නම් 11 වන පරිච්ඡේදයට අයත් ගාථා ගණන ආදිය සහිත ව එහි අන්තර්ගතය දක්වයි.
- මහාවංසයේ 11 වන පරිච්ඡේදය අවධානයෙන් කියවමින් අන්වය සකස් කරයි.
- නිර්දිෂ්ට පරිච්ඡේදයේ සමස්තය තේරුම් ගෙන මාධ්‍ය භාෂාගත රීතීන්ට අනුව පදගතාර්ථ ලියා දක්වයි.
- තෝරා ගත් පද සඳහා ව්‍යාකරණ විභාග දක්වයි.
- වංසකථා අධ්‍යයනයේ වටිනාකම හා 'දේවානම්පියතිස්ස රජුගේ සේවය' යන මාතෘකාව යටතේ පුවත්පතකට ලිපියක් සකසයි.

**ගුණාත්මක යෙදවුම්**

- මහාවංසය, ගුණපාල සේනාධීර පරි.: ජාතික පුස්තකාලය හා ප්‍රලේඛන සේවා මණ්ඩලය, කොළඹ, 2005.

**වැඩි දුර ගවේෂණය**

- පාලි සාහිත්‍යය, බුද්ධදත්ත නා හිමි, පොල්වත්තේ.: රත්න පොත් ප්‍රකාශකයෝ, කොළඹ, 2012.

## 17. ඒකකය - අනිර්දිෂ්ට පරිවර්තන

**නිපුණතාව**

4.0 නිර්දිෂ්ට හා අනිර්දිෂ්ට ගද්‍ය පද්‍ය පාඨ පරිවර්තනය කිරීමේ කුසලතාව ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම්**

4. 1 අන්වය හා ක්‍රියාකාරක පද සම්බන්ධතාව නිවැරදි ව සකස් කිරීමේ කුසලතාව ප්‍රදර්ශනය කරයි.
4. 2 පාලි උද්ධෘත සඳහා පදගතාර්ථ සපයයි.
4. 3 පාලි උද්ධෘත පාඨ මාධ්‍ය භාෂාවට පරිවර්තනය කරයි.
4. 4 මාධ්‍ය භාෂාගත ඡේද පාලි රීතියට අනුව පරිවර්තනය කරයි.

**කාලච්ඡේද** 17යි

**ඉගෙනුම් පල**

- අනිර්දිෂ්ට පරිවර්තනය පිළිබඳ හැඳින්වීමක් කරයි.
- අනිර්දිෂ්ට පරිවර්තනයක දී සැලකිලිමත් විය යුතු කරුණු පිළිබඳ හැඳින්වීමක් කරයි.
- අනිර්දිෂ්ට ගද්‍ය පද්‍ය පාඨයන්හි සුදුසු පරිදි අන්වය සකසයි.
- අන්වය සකස් කිරීමේ දී විශේෂණ පද විශේෂ්‍ය පදයට මුලින් යොදයි.
- අදාළ පරිවර්තනය සිදු කිරීමේ දී උක්තාඛ්‍යාත පද, ඒකවචන බහුවචන භේදය, පුරුෂ භේදය, කාල භේදය, විභක්ති භේදය, නාම වරනැගීමේ විශේෂතා ආදිය පිළිබඳ සැලැකිලිමත් වෙයි.
- ගද්‍ය පරිවර්තනයට වඩා පද්‍ය පරිවර්තනයේ දී අන්වය සැකසීමේ දී සැලකිලිමත් වෙයි.
- සමස්තය තේරුම් ගෙන මාධ්‍ය භාෂාගත රීතීන්ට අනුව පදගතාර්ථ ලියා දක්වයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය යටතෙ, දී ඇති උපදෙස් අනුගමනය කරමින් විෂය කරුණු ආවරණයවන පරිදි පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත්කර ගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- අනිර්දිෂ්ට පරිවර්තනය පිළිබඳ හැඳින්වීමක් කළ යුතු බව
- අනිර්දිෂ්ට පරිවර්තනයක දී සැලකිලිමත් විය යුතු කරුණු පිළිබඳ හැඳින්වීමක් කළ යුතු බව
- අනිර්දිෂ්ට ගද්‍ය පද්‍ය පාඨයන්හි සුදුසු පරිදි අන්වය සැකසිය යුතු බව
- අන්වය සකස් කිරීමේදී විශේෂණ පද විශේෂ්‍ය පදයට මුලින් යෙදිය යුතු බව
- අදාළ පරිවර්තනය සිදු කිරීමේ දී උක්තාඛ්‍යාත පද, ඒකවචන බහුවචන භේදය, පුරුෂ භේදය, කාල භේදය, විභක්ති භේදය, නාම වරනැගීමේ විශේෂතා ආදිය පිළිබඳ සැලැකිලිමත් විය යුතු බව
- ගද්‍ය පරිවර්තනයට වඩා පද්‍ය පරිවර්තනයේ දී අන්වය සැකසීමේ දී සැලකිලිමත් විය යුතු බව
- සමස්තය තේරුම් ගෙන මාධ්‍ය භාෂාගත රීතීන්ට අනුව පදගතාර්ථ ලියා දැක්විය යුතු බව
- සමස්තාර්ථය තේරුම් ගැනීමට වාර කිහිපයක් කියවිය යුතු බව (මතුපිටින් කියවීම, ක්‍රියාකාරක පද සම්බන්ධය තේරුම් ගනිමින් කියවීම, දුෂ්කර පද ලකුණු කරගනිමින් කියවීම)
- සන්ධි පද විසන්ධි කර ගැනීම හා සමාස පද අසමාස කර ගැනීම පරිවර්තනය පහසු කරවන බව
- නිර්දිෂ්ට ග්‍රන්ථයන්හි අට්ඨකථා කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම වඩාත් යෝග්‍ය බව
- අභ්‍යාස දීම මෙන් ම නිවැරදි ව නිරීක්ෂණය කොට වැරදි නිවැරදි කළ යුතු බව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- අනිර්දිෂ්ට පරිවර්තනය පිළිබඳ හැඳින්වීමක් කිරීම
- අනිර්දිෂ්ට පරිවර්තනයක දී සැලකිලිමත් විය යුතු කරුණු පිළිබඳ හැඳින්වීමක් කිරීම
- අනිර්දිෂ්ට ගද්‍ය පද්‍ය පාඨ පුවරුවක ලියා සුදුසු පරිදි අන්වය සකස් කරවීම
- අන්වය සකස් කිරීමේ දී විශේෂණ පද විශේෂ්‍ය පදයට මුලින් යෙදවීම

- අදාළ පරිවර්තනය සිදු කිරීමේ දී උක්තාඛ්‍යාත පද, ඒකවචන බහුවචන භේදය, පුරුෂ භේදය, කාල භේදය, විභක්ති භේදය, නාම වරනැගීමේ විශේෂතා ආදිය පිළිබඳ අවධානය යොමු කරවීම
- ගද්‍ය පරිවර්තනයට වඩා පද්‍ය පරිවර්තනයේ දී අන්වය සැකසීමේ දී වඩාත්ම අවධානය යොමු කිරීම
- සමස්තය තේරුම් ගෙන මාධ්‍ය භාෂාගත රීතීන්ට අනුව පදගතාර්ථ ලියා දැක්වීම
- සමස්තාර්ථය තේරුම් ගැනීමට වාර කිහිපයක් කියවීමට යොමු කිරීම (මතුපිටින් කියවීම, ක්‍රියාකාරක පද සම්බන්ධය තේරුම් ගනිමින් කියවීම, දුෂ්කර පද ලකුණු කරගනිමින් කියවීම)
- සන්ධිපද විසන්ධිකර ගැනීම හා සමාස පද අසමාස කර ගැනීමෙන් පරිවර්තනය පහසු කරවීම
- මෙහි දී නිර්දිෂ්ට ග්‍රන්ථයන්හි අට්ඨකථා කෙරෙහි වැඩි අවධානයක් යොමු කිරීම
- අභ්‍යාස මැනවින් නිරීක්ෂණය කොට වැරදි නිවැරදි කිරීම

**තක්සේරුව හා ඇගයීම**

- අනිර්දිෂ්ට පරිවර්තනය පිළිබඳ හැඳින්වීමක් කරයි.
- අනිර්දිෂ්ට පරිවර්තනයක දී සැලකිලිමත් විය යුතු කරුණු ගෙන හැර දක්වයි.
- අනිර්දිෂ්ට ගද්‍ය පද්‍ය පාඨයන්හි සුදුසු පරිදි අන්වය සකසයි.
- අන්වය සකස් කිරීමේ දී විශේෂණ පද විශේෂ්‍ය පදයට මුලින් යොදයි.
- අදාළ පරිවර්තනය සිදු කිරීමේ දී උක්තාඛ්‍යාත පද, ඒකවචන බහුවචන භේදය, පුරුෂ භේදය, කාල භේදය, විභක්ති භේදය, නාම වරනැගීමේ විශේෂතා ආදිය පිළිබඳ සැලැකිලිමත් වෙයි.
- ගද්‍ය පරිවර්තනයට වඩා පද්‍ය පරිවර්තනයේ දී අන්වය සැකසීමේ දී සැලකිලිමත් වෙයි.
- සමස්තය තේරුම් ගෙන මාධ්‍ය භාෂාගත රීතීන්ට අනුව පදගතාර්ථ ලියා දක්වයි.
- පරිවර්තනයේ අදහස සිය බසින් ලියා දක්වයි, ඊට ගැළපෙන මාතෘකාවක් යෝජනා කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- ධම්මපදට්ඨකථා (පණ්ඩිතවග්ග), රතනසාර හිමි, කහවේ.: හේවාවිතාරණ මුද්‍රණය, 1989/1991.

**වැඩි දුර ගවේෂණය**

- පාලි සංග්‍රහය, කරුණාරත්න, අශෝක.: ගුණසේන, කොළඹ, 1964.

## 18. ඒකකය - අර්ථාවබෝධය

**නිපුණතාව**

5.0 පාලි ගද්‍ය පද්‍ය පාඨ කියවා අර්ථය අවබෝධ කර ගනියි.

**නිපුණතා මට්ටම**

5. 1 පාලි ගද්‍ය පද්‍ය පාඨ කියවා අසන ලද ප්‍රශ්නවලට මාධ්‍ය භාෂාවෙන් පිළිතුරු සපයයි.
5. 2 පාලි උද්ධෘත කියවා ඒවායේ සාරාංශය මාධ්‍ය භාෂාවෙන් දක්වයි.

**කාලච්ඡේද** 25 යි

**ඉගෙනුම් පල**

- පාලි ගද්‍ය හෝ පද්‍ය පාඨයක් කියවා ගැනීමට සමත් වෙයි.
- එම පාඨයේ අදහස වටහා ගනියි.
- එහි ඇති සන්ධි, සමාස, තද්ධිත ආදී සංකීර්ණ පද විශ්ලේෂණය කර ගනියි.
- භාෂා ශෛලිය සෙසු පාලි ග්‍රන්ථවල භාෂා ශෛලිය සමග සංසන්දනය කරයි.
- කාව්‍ය ලක්ෂණ හඳුන්වා දෙයි.
- අදාළ ඡේදයක් ආශ්‍රයෙන් අසන ප්‍රශ්නවලට පිළිතුරු දෙයි.
- පාලි පාඨ ස්මරණයෙන් කියයි.
- අදාළ ඡේදයේ ධ්වනිතාර්ථ මාධ්‍ය භාෂාවෙන් ඉදිරිපත් කරයි.
- ඡේදයක් කියවා එහි සාරාංශය ලියා දක්වයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය යටතේ, දී ඇති උපදෙස් අනුගමනය කරමින් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත් කරගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- පාලි ගද්‍ය හෝ පද්‍ය පාඨයක් කියවා ගත යුතු බව
- එම පාඨයේ අදහස වටහා ගත යුතු බව
- එහි ඇති සන්ධි සමාස තද්ධිත ආදී සංකීර්ණ පද විශ්ලේෂණය කර ගත යුතු බව
- භාෂා ශෛලිය සෙසු පාලි ග්‍රන්ථවල භාෂා ශෛලිය සමග සංසන්දනය කළ යුතු බව
- කාව්‍ය ලක්ෂණ හඳුන්වා දිය යුතු බව
- අදාළ ඡේදයක් ආශ්‍රයෙන් අසන ප්‍රශ්නවලට පිළිතුරු සැපයිය යුතු බව
- පාලි පාඨ ස්මරණයෙන් කියවිය යුතු බව
- අදාළ ඡේදයේ ධ්වනිතාර්ථ මාධ්‍ය භාෂාවෙන් ඉදිරිපත් කළ යුතු බව
- ඡේදයක් කියවා එහි සාරාංශය ලියා දැක්විය යුතු බව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- පාලි ගද්‍ය හෝ පද්‍ය පාඨයක් කියවීමට සැලැස්වීම
- එම පාඨයේ අදහස පැහැදිලි කිරීම
- එහි ඇති සන්ධි සමාස තද්ධිත ආදී සංකීර්ණ පද විශ්ලේෂණය කර දැක්වීම
- භාෂා ශෛලිය සෙසු පාලි ග්‍රන්ථවල භාෂා ශෛලිය සමග සංසන්දනය කිරීම
- කාව්‍ය ලක්ෂණ හඳුන්වා දීම
- අදාළ ඡේදයක් ආශ්‍රයෙන් අසන ප්‍රශ්නවලට පිළිතුරු සැපයීම
- පාලි පාඨ ස්මරණයෙන් කියවීම
- අදාළ ඡේදයේ ධ්වනිතාර්ථ මාධ්‍ය භාෂාවෙන් ඉදිරිපත් කිරීම
- ඡේදයක් කියවා එහි සාරාංශය ලියා දැක්වීම

**තක්සේරුව හා ඇගයීම**

- පාලි ගද්‍ය හෝ පද්‍ය පාඨ නිවැරදිව කියවයි.

- එම පාඨයේ සරල අදහස ප්‍රකාශ කරයි.
- එහි ඇති සන්ධි, සමාස, තද්ධිත ආදි  සංකීර්ණ පද විශ්ලේෂණය කර දක්වයි.
- භාෂා ශෛලිය සෙසු පාලි ග්‍රන්ථවල භාෂා ශෛලිය සමග සංසන්දනය කොට දක්වයි.
- කාව්‍ය ලක්ෂණ හඳුන්වා දෙයි.
- අදාළ ඡේදයක් ආශ්‍රයෙන් අසන ප්‍රශ්නවලට පිළිතුරු දෙයි.
- පාලි පාඨ ස්මරණයෙන් කියයි.
- අදාළ ඡේදයේ ධ්වනිතාර්ථ මාධ්‍ය භාෂාවෙන් ඉදිරිපත් කරයි.
- ඡේදයක් කියවා එහි සාරාංශය ලියා දක්වයි.

**ගුණාත්මක යෙදවුම්**

- 13 වසරට නියමිත පාඨ ග්‍රන්ථ

# 19. ඒකකය - හරධර්ම චරිතායනය

**නිපුණතාව**

6.0 පාලි භාෂා සාහිත්‍යයෙහි අන්තර්ගත සාරධර්ම චර්යාවෙන් ප්‍රදර්ශනය කරයි.

**නිපුණතා මට්ටම**

6.1 පාලි සාහිත්‍යාගත සාරධර්ම හැඳිනගෙන ඒවා චර්යාවෙන් ප්‍රකට කරයි.
6. 2 සාරධර්ම සමාජගත කිරීමට කටයුතු කරයි.

**කාලච්ඡේද** 15යි

**ඉගෙනුම් පල**

- සාරධර්ම හඳුනාගෙන නිර්දිෂ්ට කෘතිවල එන සාරධර්ම ලැයිස්තු ගත කරයි.
- යුතුකම් හා වගකීම් අවබෝධ කොට ගෙන ක්‍රියාත්මක කරයි.
- යහපත් සමාජ සම්බන්ධතා ගොඩනගා ගෙන පවත්වා ගෙන යයි.
- යුතුකම් වගකීම් හා අයිතිවාසිකම් සාම්ප්‍රදායික ව නිර්වචනය කරයි.
- සදාචාර සම්පන්න සමාජයක් ගොඩනගා ගැනීමට අවශ්‍ය ජීවන රටාවක් සකසා ගනියි.
- පුද්ගල හා සමාජ පරිහානියට තුඩු දෙන හැසිරීම් රටාවන්ගෙන් වළකියි.
- ආර්ය ගුණ අගයමින් ධනාත්මක චරිත ලක්ෂණ ප්‍රකට කරයි.
- සමාජ හිතකාමී ව ජීවත් වෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය යටතේ, දී ඇති උපදෙස් අනුගමනය කරමින් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත් කරගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

**පාඩමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- නිර්දිෂ්ට කෘතිවල එන සාරධර්ම හඳුනා ගත යුතු බව
- ගුරු ශිෂ්‍ය යුතුකම් හා වගකීම් මහාක්ඛන්ධකය ඇසුරින් උපුටා දැක්විය යුතු බව
- යහපත් සමාජ සම්බන්ධතා ගොඩනගා ගත යුතු බව
- යුතුකම් වගකීම් හා අයිතිවාසිකම් නිර්දිෂ්ට කෘතිවලින් උපුටා දැක්විය යුතු බව
- සදාචාර සම්පන්න සමාජයක් ගොඩනගා ගැනීමට සාරධර්ම ප්‍රගුණ කළ යුතු බව
- වැරදි ජීවන රටා සමාජ පරිහානියට හේතු වන බව
- ආර්ය ගුණ චරිතායනය කර ධනාත්මක සිතුවිලි ගොඩනගා ගත යුතු බව
- සමාජ හිතකාමී ව ජීවත්වීමට නිර්දිෂ්ට කෘතිවල එන සාරධර්ම යොදා ගත යුතු බව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- සාරධර්ම යනු මොනවා දැයි හඳුන්වා දීම
- නිර්දිෂ්ට කෘතිවල එන සාරධර්ම උපුටා දැක්වීම
- ගුරු ශිෂ්‍ය යුතුකම් හා වගකීම් මහාක්ඛන්ධකය ඇසුරින් උපුටා දැක්වීම
- යහපත් සමාජ සම්බන්ධතා ගොඩනගා ගත යුතු ආකාරය පැහැදිලි කිරීම
- යුතුකම්, වගකීම් හා අයිතිවාසිකම් ඉටු වන සමාජයක ඇති සාමකාමී හා ක්‍රියාශීලී බව පෙන්වා දීම

- සදාචාර සම්පන්න සමාජයක් ගොඩනගා ගැනීමට සාරධර්ම උපයෝගී වන බව පෙන්වා දීම
- ආර්ය ගුණයන්හි වටිනාකම පෙන්වා දීම
- නිර්දිෂ්ට කෘති මගින් සමාජ සම්බන්ධතා ගොඩ නැගෙන අයුරු පෙන්වා දීම

**තක්සේරුව හා ඇගයීම**

- සාරධර්ම හඳුන්වයි
- නිර්දිෂ්ට කෘතිවල එන සාරධර්ම උපුටා දක්වයි.
- සමාජය සාමකාමී කිරීමට සාරධර්ම හේතු වන බව පෙන්වා දෙයි.
- උපජ්ඣාය හා සද්ධිවිහාරික වත් ගෙනහැර දක්වයි.
- මහාවංසය ඇසුරින් සමාජ සංවිධාන ගොඩනැගෙන ආකාරය පෙන්වා දෙයි.
- සාරධර්ම චර්යාවෙන් ප්‍රකට කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- 13 ශ්‍රේණියට නියමිත පාලි පාඨ ග්‍රන්ථ

**වැඩි දුර ගවේෂණය**

- සදාචාර සමාජයක් සඳහා චරිතායන අධ්‍යාපනය, අතුකෝරාල, දායාරෝහණ, ශික්ෂාමන්දිර, 2001.

## 20. ඒකකය - රස වින්දනය

**නිපුණතාව**

7.0 පාලි සාහිත්‍ය රසාස්වාදයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම**

7.1 ගද්‍ය පද්‍ය පාඨ කියවා රස විඳියි.

**කාලච්ඡේද** 07යි

**ඉගෙනුම් පල**

- නිර්දිෂ්ට සාහිත්‍ය කොටස්වල අර්ථ අවබෝධ කර ගනියි.
- කාව්‍යමය ප්‍රකාශන හඳුනාගෙන ප්‍රකාශ කරයි.
- සාහිත්‍යමය කොටස් සහිත ගද්‍ය පද්‍ය පාඨ කියවා රස විඳියි.
- සාහිත්‍යමය ප්‍රකාශන ඇතුළත් කොටස් එක් රැස් කරයි.
- පාලි සාහිත්‍යයේ ඇති සුවිශේෂත්වය අගය කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය යටතේ, දී ඇති උපදෙස් අනුගමනය කරමින් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත් කරගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- පාලි භාෂාවේ උසස් රස වින්දනයකින් යුතු සාහිත්‍යමය කොටස් ඇති බව
- පාලි සාහිත්‍යය තුළ හරධර්ම බහුල ව ඇතුළත් වී ඇති බව
- සාහිත්‍ය රස වින්දනය සාර්ථක ජීවිතයකට ඉවහල් වන බව
- සුවිශේෂ ගද්‍ය, පද්‍ය සාහිත්‍යමය කොටස් උපුටා දැක්විය යුතු බව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- නිර්දිෂ්ට කෘතිවල සාහිත්‍යාත්මක කොටස් උපුටා දැක්වීම
- හරධර්ම ඉස්මතු කිරීම
- සාහිත්‍ය රස මතුකොට දැක්වීම
- රස භාව සංකල්පය පැහැදිලි කිරීම
- සාහිත්‍යාත්මක ගද්‍ය පද්‍ය කොටස් රස විඳීම

**තක්සේරුව හා ඇගයීම**

- සාහිත්‍යාත්මක කොටස් උපුටා දක්වයි.
- උපමා, රූපක ආදි අලංකාර පෙන්වා දෙයි.
- රසභාව සංකල්පය කෙටියෙන් පැහැදිලි කරයි.
- සාහිත්‍යාත්මක ගද්‍ය පද්‍ය කොටස් රස විඳියි.

**ගුණාත්මක යෙදවුම්**

- නිර්දිෂ්ට පාඨ ග්‍රන්ථ
- සෞන්දර්ය පිළිබඳ බෞද්ධ ආකල්පය, පියරතන හිමි වැගම.: තරංජි ප්‍රින්ට්ස්, මහරගම, 2010.

**වැඩි දුර ගවේෂණය**

- සුබෝධාලංකාරය, ලංකානන්ද හිමි, ලබුගම.: විද්‍යාශේඛර මුද්‍රණාලය, හොරණ, 1937.

## 21. ඒකකය - කාව්‍යෝක්ති

**නිපුණතාව**

7.0 පාලි සාහිත්‍ය රසාස්වාදයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම**

7.2 ගද්‍ය පද්‍ය පාඨයන්හි අන්තර්ගත කාව්‍යෝක්ති පිළිබඳ ඇගයීමක යෙදෙයි.

**කාලච්ඡේද** 07යි

**ඉගෙනුම් පල**

- නිර්දිෂ්ට සාහිත්‍ය කොටස්වල කාව්‍යෝක්ති හඳුනා ගනියි.
- එම කාව්‍යෝක්ති ප්‍රකාශ කරයි.
- සාහිත්‍යමය ලක්ෂණ ලියා දක්වයි.
- ආස්වාදජනක ජීවිතයක් ගොඩ නගා ගැනීමට කාව්‍යෝක්ති උපයෝගී කර ගනියි.
- ලබාගත් දැනුම උපයෝගී කරගෙන කාව්‍යෝක්ති අගය කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය යටතේ, දී ඇති උපදෙස් අනුගමනය කරමින් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත් කරගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- උසස් රසවින්දනයක් සඳහා කාව්‍යෝක්ති වැදගත් බව
- කාව්‍යෝක්ති තුළ හරධර්ම බහුල ව ඇතුළත් වී ඇති බව
- කාව්‍යෝක්ති රස වින්දනය සාර්ථක ජීවිතයකට ඉවහල් වන බව
- ගද්‍ය, පද්‍ය කාව්‍යෝක්ති කොටස් උපුටා දැක්විය යුතු බව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- නිර්දිෂ්ට කෘතිවල සාහිත්‍යාත්මක කොටස් උපුටා දැක්වීම
- හරධර්ම පෙන්වා දීම
- රසවින්දනය, සාර්ථක ජීවිතයකට හේතු වන බව පෙන්වා දීම
- ගද්‍ය පද්‍ය කොටස් රස විඳීම

**තක්සේරුව හා ඇගයීම**

- සාහිත්‍යාත්මක ගද්‍ය පද්‍ය කොටස් උපුටා දක්වයි.
- හරධර්ම නම් කරයි.
- කාව්‍යෝක්ති උපුටා දක්වයි.
- කාව්‍යෝක්ති භාවිතය මගින් නිර්මාණයක සාහිත්‍යමය අගය වැඩි කරන බව ප්‍රකාශ කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- සෞන්දර්යය පිළිබඳ බෞද්ධ ආකල්පය, පියරතන හිමි වැගම.: තරංජී ප්‍රින්ට්ස්, මහරගම, 2010.

**වැඩිදුර ගවේෂණය**

- සුබෝධාලංකාරය, ලංකානන්ද හිමි, ලබුගම.: විද්‍යාශේඛර මුද්‍රණාලය, හොරණ, 1937.

## 22. ඒකකය - සාහිත්‍යාත්මක වාක්‍ය රචනය

**නිපුණතාව**

7.0 පාලි සාහිත්‍ය රසාස්වාදයේ යෙදෙයි.

**නිපුණතා මට්ටම**

7.3 සාහිත්‍යාත්මක ඡේද හා වාක්‍ය පාලියෙන් ලියා දක්වයි.

**කාලච්ඡේද** 11යි

**ඉගෙනුම් පල**

- නිර්දිෂ්ට ග්‍රන්ථවල එන සාහිත්‍යමය කොටස් හඳුනා ගනියි.
- සාහිත්‍යමය ප්‍රකාශන උපුටා ලියා දක්වයි.
- සාහිත්‍ය රසාස්වාදයේ යෙදෙයි.
- සාහිත්‍යමය රචනාවන්හි නිරත වෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය යටතේ, දී ඇති උපදෙස් අනුගමනය කරමින් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත් කරගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- වාක්‍ය රචනයේ දී සාහිත්‍යමය කොටස් එක් කිරීම වැදගත් බව
- නිර්දිෂ්ට කොටස්වල සාහිත්‍යමය කොටස් උපුටා දැක්විය යුතු බව
- සරල වාක්‍ය නිර්මාණය කළ යුතු බව
- උපමා, රූපක ආදි අලංකාර එක් කොට වාක්‍ය අලංකාර කළ යුතු බව
- සාහිත්‍යාත්මක සරල ඡේද නිර්මාණය කළ යුතු බව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- නිර්දිෂ්ට කෘතිවල සාහිත්‍යාත්මක කොටස් උපුටා දැක්වීම
- ගද්‍ය පද්‍ය පාඨවල ඇති කාව්‍යාත්මක ලක්ෂණ උපුටා දැක්වීම
- සරල වාක්‍ය නිර්මාණය කිරීම
- අලංකාර යොදා වාක්‍ය නිර්මාණය කිරීම
- සාහිත්‍යාත්මක සරල ඡේද නිර්මාණය කිරීම

**තක්සේරුව හා ඇගයීම**

- සාහිත්‍යාත්මක කොටස් උපුටා දක්වයි.
- කාව්‍යෝක්ති ලියා දක්වයි.
- සරල වාක්‍ය නිර්මාණය කරයි.
- අලංකාර යොදා වාක්‍ය සරසයි.
- සරල ඡේද ලියා දක්වයි.

**ගුණාත්මක යෙදවුම්**

- සෞන්දර්ය පිළිබඳ බෞද්ධ ආකල්පය, පියරතන හිමි වැගම.: තරංජී ප්‍රින්ට්ස්, මහරගම, 2010.

**වැඩි දුර ගවේෂණය**

- සුබෝධාලංකාරය, ලංකානන්ද හිමි, ලබුගම.: විද්‍යාශේඛර මුද්‍රණාලය, හොරණ, 1937.

# 23. ඒකකය - බෞද්ධ සංස්කෘතිය

**නිපුණතාව**

8.0 පාලි භාෂා සාහිත්‍යාගත බෞද්ධ සංස්කෘතිය වටහාගෙන ක්‍රියා කරයි.

**නිපුණතා මට්ටම**

8. 1 බෞද්ධ සංකල්පයන්හි සංස්කෘතික වැදගත්කම හදාරයි.
8. 2පාලි සාහිත්‍යාගත බෞද්ධ සංකල්ප වෙනත් සංකල්ප හා තුලනය කරයි.

**කාලච්ඡේද** 55 යි

**ඉගෙනුම් පල**

- පාලි සාහිත්‍යාගත බෞද්ධ සංකල්ප හඳුන්වයි.
- බෞද්ධ සංස්කෘතික වටිනාකමක් සහිත සංකල්ප හඳුනා ගැනීම සඳහා පාලි සාහිත්‍ය කෘති අධ්‍යයනය කරයි.
- නිර්දිෂ්ට කෘතීන්හි සංස්කෘතික වටිනාකම හඳුනා ගෙන ඒ අනුව ක්‍රියා කරයි.
- බෞද්ධ සංකල්ප වෙනත් ඉගැන්වීම් සමග තුලනාත්මක අධ්‍යයනයකට ප්‍රවේශ වෙයි.
- උපජ්ඣාය හා සද්ධිවිහාරික වත්, වක්කලී ථේරාපදාන, මහාවංසය 11 පරිච්ඡේදය යන තැන්වල දැක්වෙන බෞද්ධ සංස්කෘතිකාංග ලැයිස්තුගත කරයි.
- ආගමාලය හා ජාතිකාභිමානය චරිතයෙන් ප්‍රකට කරයි.
- ආගමික, දේශපාලනික හා සංස්කෘතික කටයුතුවල දී සංයමයෙන් ක්‍රියා කරයි.
- බෞද්ධ සංකල්පයන්හි සංස්කෘතික වැදගත්කම වටහා ගෙන ක්‍රියා කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය යටතේ, දී ඇති උපදෙස් අනුගමනය කරමින් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත් කරගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

**පාඩමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- නිර්දිෂ්ට ග්‍රන්ථවල බෞද්ධ සංකල්ප හඳුනා ගත යුතු බව
- බෞද්ධ සංස්කෘතික වටිනාකමක් සහිත බෞද්ධ සංකල්ප හඳුනා ගත යුතු බව
- නිර්දිෂ්ට කෘතිවල බෞද්ධ සංස්කෘතිකාංග ලැයිස්තුගත කළ යුතු බව
- බෞද්ධ සංකල්ප වෙනත් සංකල්ප සමග තුලනය කළ යුතු බව
- ආගමාලය හා ජාතිකාභිමානය චරිතයෙන් ප්‍රකට කිරීමට අවශ්‍ය ගුණාංග එක්රැස් කළ යුතු බව
- සාමාජික කටයුතු කිරීමේ දී සංස්කෘතික ගුණාංගයන්හි ඇති වැදගත්කම මතු කොට දැක්විය යුතු බව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- නිර්දිෂ්ට ග්‍රන්ථයන්හි කථා සාරය ගෙනහැර දැක්වීම
- ඒ ඒ ග්‍රන්ථවල බෞද්ධ සංකල්ප උපුටා දැක්වීම
- එම සංකල්පවල ඇති බෞද්ධ සංස්කෘතිකාංග මතුකර පෙන්වා දීම
- සංස්කෘතික වටිනාකම් පිළිබඳ රචනාමය ප්‍රශ්න සඳහා පිළිතුරු ලියවීම
- ආගමාලය හා ජාතිකත්වය ආදියට අදාළ වන කොටස් නිර්දිෂ්ට කෘතිවලින් උපුටා දැක්වීම
- ඒ ඒ ගද්‍ය පද්‍ය කොටස්වල ඇති සංස්කෘතිකාංග උපුටා දැක්වීමට සිසුන් යොමු කිරීම

**තක්සේරුව හා ඇගයීම**

- පාලි සාහිත්‍යාගත බෞද්ධ සංකල්ප හඳුන්වයි.
- බෞද්ධ සංකල්පවලින් බෞද්ධ සංස්කෘතිකාංග උපුටා දක්වයි.
- නිර්දිෂ්ට කෘතිවල එන සංස්කෘතිකාංග උපුටා දක්වයි.
- බෞද්ධ සංකල්ප වෙනත් ආගමික සංකල්ප හා සසඳයි. ආගමික කටයුතුවල දී බෞද්ධ සංස්කෘතිකාංග යොදා ගනියි.

**ගුණාත්මක යෙදවුම්**

- 13 ශ්‍රේණියට නියමිත පාලි පාඨ ග්‍රන්ථ

**වැඩි දුර ගවේෂණය**

- හෙළ හැදියාව, විමලවංස හිමි බද්දේගම.: සමයවර්ධන, කොළඹ, 1996.
- පාලි සාහිත්‍යයේ ඉතිහාසය, පරි; පඤ්ඤාකිත්ති හිමි, හිරිපිටියේ.: ගොඩගේ, කොළඹ, 2003.

## 24. ඒකකය - වංසකථා

**නිපුණතාව**

9.0 පාලි වංසකථා හා ප්‍රකරණ සාහිත්‍යයේ ව්‍යුහය පිළිබඳ අවබෝධය ලබා ගැනීම සඳහා පාලි සාහිත්‍ය ග්‍රන්ථ පරිශීලනය කරයි.

**නිපුණතා මට්ටම**

9.1 පාලි වංසකථා ග්‍රන්ථවල සංඥාදි පංචකය පිළිබඳ අවබෝධය ලබා ගැනීමට කියවයි.

**කාලච්ඡේද** 15 යි

**ඉගෙනුම් පල**

- "වංසකථා" හඳුන්වයි.
- වංසකථාවන්හි පොදු ලක්‍ෂණ පෙන්වා දෙයි.
- වංසකථා නම් වශයෙන් ලියා දක්වයි.
- ඒ ඒ වංසකථාවේ වස්තු විෂය පැහැදිලි කරයි.
- එක් එක් වංසකථාවක් පිළිබඳ හැඳින්වීමක් කරයි.
- වංසකථා ග්‍රන්ථයන්හි සංඥාදි පඤ්චකය ලියා දක්වයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය යටතේ, දී ඇති උපදෙස් අනුගමනය කරමින් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත් කරගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- වංසකථා යනු මොනවාදැයි දැන ගත යුතු බව
- වංසකථාවන්හි පොදු ලක්‍ෂණ හඳුනාගත යුතු බව
- වංසකථා නම් වශයෙන් ලියා දැක්විය යුතු බව
- ඒ ඒ වංසකථාවේ වස්තු විෂය පැහැදිලි කළ යුතු බව
- වංසකථා පිළිබඳව හැඳින්වීමක් කළ යුතු බව
- වංසකථා ග්‍රන්ථයන්හි සංඥාදි පංචකය ලියා දැක්විය යුතු බව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- "වංස" යන්න පැහැදිලි කරමින් වංසකථා හැඳින්වීම
- පාලි වංසකථාවල පොදු ලක්‍ෂණ පෙන්වා දීම
- දීපවංස, මහාවංස ආදි වශයෙන් වංසකථා නම් කිරීම
- වංසකථාවල වස්තු විෂය පැහැදිලි කර දීම
- ඒ ඒ වංසකථාව පිළිබඳ කෙටි හැඳින්වීමක් කිරීම
- වංසකථා ග්‍රන්ථයන්හි සංඥාදි පංචකය ලියවීම

**තක්සේරුව හා ඇගයීම්**

- වංසකථා නම් කරයි
- වංසකථා යනු කවරේ දැයි හඳුන්වා දෙයි
- වංසකථාවන්හි සංඥාදි පඤ්චකය ලියයි
- වංසකථාවන්හි පොදු ලක්‍ෂණ ලියා දක්වයි

**ගුණාත්මක යෙදවුම්**

- පාලි සාහිත්‍යය (8 පරිච්ඡේදය), බුද්ධදත්ත නාහිමි, පොල්වත්තේ.ඃ රත්න පොත් ප්‍රකාශකයෝ, කොළඹ, 2012.

**වැඩි දුර ගවේෂණය**

- අදාළ වංසකථාවන්හි ප්‍රස්තාවනා

# 25. ඒකකය - බුද්ධචරිත කාව්‍යය

**නිපුණතාව**

9.0 පාලි වංසකථා හා ප්‍රකරණ සාහිත්‍යයේ ව්‍යුහය පිළිබඳ අවබෝධය ලබා ගැනීම සඳහා පාලි සාහිත්‍ය ග්‍රන්ථ පරිශීලනය කරයි.

**නිපුණතා මට්ටම**

9.2 පාලි ප්‍රකරණ සාහිත්‍යය හඳුනා ගැනීම සඳහා කියවයි.

**කාලච්ඡේද 10 යි**

**ඉගෙනුම් පල**

- පාලි ප්‍රකරණ (බුද්ධචරිත කාව්‍ය) සාහිත්‍යය හඳුන්වයි.
- ප්‍රකරණ සාහිත්‍යයෙහි ලා ගැනෙන කෘති නම් කරයි.
- ජිනාලංකාරය, ජිනචරිතය, ජිනවංසදීපය, සමන්තකූටවණ්ණනා යන කෘතිවල සංඥාදි පඤ්චකය ලියා දක්වයි
- ඒ ඒ කෘතියේ වස්තු විෂය හඳුන්වයි.
- වංසකථා හා ප්‍රකරණයන්හි වෙනස පෙන්වා දෙයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය යටතේ, දී ඇති උපදෙස් අනුගමනය කරමින් විෂය කරුණු ආවරණය වන පරිදී පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත් කරගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- ප්‍රකරණ සාහිත්‍යය නමින් සාහිත්‍යාංගයක් ඇති බව
- ජිනාලංකාරය, ජිනචරිතය, සමන්තකූටවණ්ණනා, ජිනවංසදීප, ප්‍රකරණ සාහිත්‍යයෙහි ලා සැලකෙන බව
- ප්‍රකරණ සාහිත්‍යයෙන් ලියැවී ඇත්තේ බුද්ධචරිත කාව්‍ය බව
- අදාළ කෘතීන්හි සංඥාදි පඤ්චකය දැක්විය යුතු බව
- වස්තු විෂය සැකෙවින් හැඳින්විය යුතු බව
- අදාළ කෘතීන්හි බුද්ධචරිතය වර්ණනා කොට ඇති බව

**යොජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- ප්‍රකරණ සාහිත්‍යය හඳුන්වා දීම
- ප්‍රකරණ සාහිත්‍යයට අයත් කෘති නම් කිරීම
- ඒ ඒ කෘතීන්හි සංඥාදි පඤ්චකය පෙන්වා දීම
- වස්තු විෂය පිළිබඳ පැහැදිලි කර දෙමින් බුද්ධචරිතය වර්ණනා කෙරෙන අයුරු පෙන්වා දීම

**තක්සේරුව හා ඇගයීම**

- ප්‍රකරණ සාහිත්‍යය පිළිබඳ හැඳින්වීමක් කරයි.
- ප්‍රකරණ සාහිත්‍යයට අයත් කෘති නම් කරයි.
- අදාළ කෘතියේ සංඥාදි පඤ්චකය ලියා දක්වයි.
- අදාළ කෘතිවල වස්තු විෂය පැහැදිලි කරයි.
- බුද්ධචරිතය වර්ණිත ව ඇති අයුරු පෙන්වා දෙයි.

**ගුණාත්මක යෙදවුම්**

- පාලි සාහිත්‍යය (9 පරිච්ඡේදය), බුද්ධදත්ත නාහිමි, පොල්වත්තේ.: රත්න පොත් ප්‍රකාශකයෝ, කොළඹ, 2012.

**වැඩි දුර ගවේෂණය**

- ඒ ඒ කෘතීන්හි ප්‍රස්තාවනා

## 26. ඒකකය - ධර්මාර්ථ විවරණය

**නිපුණතාව**

10.0 අර්ථ විවරණ හැකියාව වර්ධනය කරයි.

**නිපුණතා මට්ටම**

10. 1 නිර්දිෂ්ට කෘතිවල ඇතුළත් සුවිශේෂ පදවල ධර්මාර්ථ විවරණය කරයි.

**කාලච්ඡේද** 10 යි

**ඉගෙනුම් පල**

- උද්ධෘත ඡේද හා ගාථා පාඨ නිවැරදි උච්චාරණය සහිත ව කියවයි.
- උක්තාඛ්‍යාත සම්බන්ධය අනුව අන්වය සකසා ගනියි.
- වාච්‍යාර්ථ හා ධ්වනිතාර්ථ පැහැදිලි කරයි.
- ව්‍යාකරණ ලක්ෂණ හා උපමා රූපක ආදි අලංකාර පෙන්වා දෙයි.
- සරලාර්ථ ලියා දක්වයි.
- දුරවබෝධ පද හඳුනාගනියි.
- ධර්මමය කරුණු උපුටා දක්වයි.
- සුවිශේෂ පද අටුවා නයින් පැහැදිලි කරයි.
- වැරදි අර්ථකථනවලට පිළිතුරු සපයයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය යටතේ, දී ඇති උපදෙස් අනුගමනය කරමින් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත් කරගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- ගද්‍ය පද්‍ය පාඨ නිවැරදි ව කියවිය යුතු බව
- උක්තාඛ්‍යාත සම්බන්ධය ගළපා ඒ අනුව අන්වය සැකසිය යුතු බව
- වාච්‍යාර්ථ හා ධ්වනිතාර්ථ පැහැදිලි කර ගත යුතු බව
- ව්‍යාකරණ ලක්ෂණ හා උපමා රූපක ආදි අලංකාර අදාළ පාඨ මගින් පෙන්වා දිය යුතු බව
- ඡේද හා පාඨ මාධ්‍ය භාෂාවෙන් ලියා දැක්විය යුතු බව
- දුෂ්කර හා දුරවබෝධ ධර්මමය කරුණු ඇතුළත් පද එක්රැස් කළ යුතු බව
- සුවිශේෂ පදවලට අටුවා නයින් අර්ථ දැක්විය යුතු බව
- ධර්මමය කරුණු නිවැරදි ව අර්ථ කථනය කළ යුතු බව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- ඡේද හා ගාථා පාඨ උපුටා ගෙන නිවැරදි උච්චාරණය කිරීම
- උක්තාඛ්‍යාත සම්බන්ධය පැහැදිලි කර අන්වය සකස් කිරීම
- වාච්‍යාර්ථ හා ධ්වනිතාර්ථ පැහැදිලි කිරීම
- ව්‍යාකරණ ලක්ෂණ හා උපමා රූපක ආදි අලංකාර පෙන්වා දීම
- ඡේද හා පාඨ මාධ්‍ය භාෂාවට නැගීම
- දුරවබෝධ හා ධර්මමය කරුණු ඇතුළත් පද පැහැදිලි කිරීම
- සුවිශේෂ පද අටුවා නයින් පැහැදිලි කිරීම
- වැරදි අර්ථ කථන නිවැරදි කිරීම

**තක්සේරුව හා ඇගයීම**

- ඡේද හා ගාථා නිවැරදි ව කියවයි.
- උක්තාඛ්‍යාත සම්බන්ධය අනුව අන්වය සකසා ගනියි.
- පදයන්හි වාච්‍යාර්ථ හා ධ්වනිතාර්ථ පැහැදිලි කරයි.

- පාලි පාඨවල ව්‍යාකරණ ලක්ෂණ සහ උපමා රූපක ආදි අලංකාර පෙන්වා දෙයි.
- ඡේද හා පාඨ මාධ්‍ය භාෂාවෙන් ලියයි.
- ධර්මමය කරුණු උපුටා අර්ථ ගන්වයි.
- ධර්මමය කරුණු අටුවා නයින් විස්තර කරයි.
- වැරදි අර්ථකථන පෙන්වා දී නිවැරදි කරයි.

**ගුණාත්මක යෙදවුම්**

- 13 වසරට නියමිත ගද්‍ය පද්‍ය පාඨ

**වැඩි දුර ගවේෂණය**

- නිර්දිෂ්ට පාඨයන්ට අදාළ අටුවා ග්‍රන්ථ

## 27. ඒකකය - ව්‍යාකරණ විවරණය

**නිපුණතාව**

10.0 අර්ථ විවරණ හැකියාව වර්ධනය කරයි.

**නිපුණතා මට්ටම**

10. 2 නිර්දිෂ්ට කෘතිවල උද්ධෘතයන්හි ව්‍යාකරණ විභාග (පද විග්‍රහ) කර දක්වයි.

**කාලච්ඡේද** 10 යි

**ඉගෙනුම් පල**

- නිර්දිෂ්ට කෘති නිවැරදි ව කියවයි.
- ගද්‍ය පද්‍ය කොටස් උක්තාඛ්‍යාත සම්බන්ධය අනුව ලියා දක්වයි.
- සන්ධි පද විසන්ධි කොට උපුටා අර්ථ ගන්වයි.
- සමාස පද අසමාස කොට ලියා සමාසය නම් කරයි.
- තද්ධිත පදවල නාමය හා ප්‍රත්‍යය වෙන් කොට ලියා තද්ධිත ප්‍රභේදය නම් කරයි.
- කිතක පද හඳුනාගෙන ප්‍රභේදය නම් කරයි.
- ආඛ්‍යාත උපුටා දක්වා ආඛ්‍යාතය නම් කරයි.
- නිපාත උපසර්ග උපුටා දක්වයි.
- විශේෂ ප්‍රයෝග හඳුනාගෙන අර්ථ ගන්වයි.
- පූර්වක්‍රියා, තුමන්තක්‍රියා හා ප්‍රයෝජ්‍යක්‍රියා උපුටා දක්වයි.
- නාම හා සර්වනාම යෙදී ඇති අයුරු පෙන්වා දෙයි.
- අංකිත පදවල ව්‍යාකරණ ප්‍රවර්ග නම් කරයි.

**පාඩම් සැලසුම් සඳහා උපදෙස්**

යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය යටතේ, දී ඇති උපදෙස් අනුගමනය කරමින් විෂය කරුණු ආවරණය වන පරිදි පාඩම අවසානයේ දී ශිෂ්‍යයා ඉගෙනුම් පල අත්පත් කරගන්නා ආකාරයට පාඩම් සැලසුම් සකසා ගන්න.

**නිපුණතා මට්ටමට අදාළ විෂය කරුණුවල සංක්ෂිප්තය**

- නිර්දිෂ්ට කෘති ශබ්ද නගා නිවැරදි ව කියවිය යුතු බව
- ගද්‍ය පද්‍ය කොටස් උක්තාඛ්‍යාත සම්බන්ධය අනුව ගළපමින් ලියා දැක්විය යුතු බව
- සන්ධි ප්‍රභේදය හා අර්ථය වටහා ගැනීමට සන්ධිපද උපුටා විසන්ධි කොට දැක්විය යුතු බව
- සමාසපද අසමාස කොට ලියා සමාස ප්‍රභේදය නම් කොට අර්ථ ගැන්විය යුතු බව
- තද්ධිත පදවල නාමය හා ප්‍රත්‍යය වෙන් කොට ලියා අර්ථ ගැන්විය යුතු බව
- කිතක පද හඳුනාගෙන අර්ථ ලියා දැක්විය යුතු බව
- ආඛ්‍යාත උපුටා දක්වා ආඛ්‍යාතය නම් කළ යුතු බව
- නිපාත හා උපසර්ග උපුටා දක්වා අර්ථ ගැන්විය යුතු බව
- විශේෂ ප්‍රයෝග හඳුනාගෙන අර්ථ ගැන්විය යුතු බව
- පූර්ව ක්‍රියා, තුමන්ත ක්‍රියා හා ප්‍රයෝජ්‍ය ක්‍රියාවන්ට මාධ්‍ය භාෂාවෙන් අර්ථ දැක්විය යුතු බව
- නාම හා සර්ව නාමවලට අර්ථ ගැන්විය යුතු බව
- අංකිත පදවල ව්‍යාකරණ ප්‍රවර්ග නම් කළ යුතු බව

**යෝජිත ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රමය**

- නිර්දිෂ්ට කෘති අර්ථයට හානි නොවන ලෙස කියවීම
- උක්තාඛ්‍යාත සම්බන්ධය අනුව ගද්‍ය පද්‍ය කොටස් ලියා දැක්වීම
- සන්ධිපද විසන්ධි කොට අර්ථ ගැන්වීම
- සමාසපද අසමාස කොට ලියා සමාසය නම් කර අර්ථ දක්වීම
- තද්ධිත පදවල නාමය හා ප්‍රත්‍යය වෙන් කොට ලියා තද්ධිත ප්‍රභේදය නම් කිරීම

- කිතක පද හඳුන්වා ප්‍රභේදය නම් කිරීම
- ආඛ්‍යාත උපුටා දක්වා ආඛ්‍යාතය නම් කිරීම
- නිපාත උපසර්ග උපුටා දක්වා අර්ථ ලිවීම
- විශේෂ ප්‍රයෝග හඳුන්වා අර්ථ ගැන්වීම
- පූර්ව ක්‍රියා, තුමන්ත ක්‍රියා හා ප්‍රයෝජ්‍ය ක්‍රියා උපුටා දක්වා අර්ථ ගැන්වීම
- නාම හා සර්වනාම යෙදී ඇති අයුරු පෙන්වා දීම
- අංකිත පදවල ව්‍යාකරණ ප්‍රවර්ග නම් කිරීම

**තක්සේරුව හා ඇගයීම**

- නිර්දිෂ්ට කෘති නිවැරදි ව කියවයි.
- ගද්‍ය පද්‍ය කොටස්වල උක්තාඛ්‍යාත සම්බන්ධය ගළපයි.
- ව්‍යාකරණ ප්‍රවර්ග උපුටා දක්වයි.
- ව්‍යාකරණ ප්‍රවර්ග පද විග්‍රහ කරයි.
- ගද්‍ය පද්‍ය කොටස් මාධ්‍ය භාෂාවට නගයි.

**ගුණාත්මක යෙදවුම්**

- 13 වසරට නියමිත ගද්‍ය පද්‍ය පාඨ

**වැඩිදුර ගවේෂණය**

- පාලි ව්‍යාකරණ විවරණය, සිරිනිවාස හිමි, මයිලැවේ.: සමයවර්ධන, කොළඹ, 1966.

# පාසල පදනම් කරගත් තක්සේරුකරණය

# පාසල පදනම් කරගත් තක්සේරුකරණය - හැඳින්වීම

නිපුණතා පාදක විෂයමාලාව හඳුන්වාදීමේ දී ඔබ අතට පත් කොට මෙතෙක් ඔබ පරිශීලනය කළ ගුරු මාර්ගෝපදේශ සංග්‍රහය තුළින් පාසල පදනම් කරගත් තක්සේරුකරණය පිළිබඳ මේ වන විට ඔබ මනා වැටහීමක් ලබා තිබිය යුතු ය. ඔබගේ පහසුව සඳහා මෙම ගුරු මාර්ගෝපදේශයේ ද එම විස්තර පහත දක්වා ඇත.

ඉගෙනුම, ඉගැන්වීම සහ ඇගයීම අධ්‍යාපන ක්‍රියාවලියේ වැදගත් සංරචක තුනක් බවත් ඉගෙනුමෙහි සහ ඉගැන්වීමෙහි ප්‍රගතිය දැනගැනීම පිණිස ඇගයීම යොදාගත යුතු බවත් සෑම ගුරුවරයකු විසින් ම දත යුතු පැහැදිලි කරුණකි. ඒවා අන්‍යෝන්‍ය බලපෑමෙන් යුතු ව ක්‍රියා කරන බවත් එසේ ම එකිනෙකෙහි සංවර්ධනය කෙරෙහි එම සංරචක බලපාන බවත් ගුරුවරු දනිති. සන්තතික (නිරන්තරයෙන් සිදු වන) ඇගයීම් මූල ධර්ම අනුව ඇගයීම සිදු විය යුත්තේ ඉගෙනීම හා ඉගැන්වීම කෙරෙන අතරතුර දී ය. මෙය ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ආරම්භයේ දී හෝ මැද දී හෝ අග දී හෝ යන ඕනෑ ම අවස්ථාවක දී සිදු විය හැකි ය. එලෙස තම සිසුන්ගේ ඉගෙනුම් ප්‍රගතිය ඇගයීමට අපේක්ෂා කරන ගුරුවරයකු ඉගෙනුම ඉගැන්වීම සහ ඇගයීම පිළිබඳ සංවිධානාත්මක සැලැස්මක් යොදාගත යුතු වෙයි.

පාසල පදනම් කරගත් ඇගයීම් වැඩපිළිවෙළ හුදු විභාග ක්‍රමයක් හෝ පරීක්ෂණ පැවැත්වීමක් නොවේ. එය හඳුන්වනු ලබන්නේ සිසුන්ගේ ඉගෙනීමත් ගුරුවරුන්ගේ ඉගැන්වීමත් වැඩි දියුණු කිරීම සඳහා යොදාගනු ලබන මැදිහත් වීමක් වශයෙනි. මෙය සිසුන්ට සමීප ව සිටිමින් ඔවුන්ගේ ප්‍රබලතා සහ දුබලතා හඳුනාගෙන ඒවාට පිළියම් යොදමින් සිසුන්ගේ උපරිම වර්ධනය ළඟා කරගැනීමට යොදාගත හැකි වැඩ පිළිවෙළකි.

ඉගෙනුම්-ඉගැන්වීම් ක්‍රියාකාරකම් තුළින් අනාවරණ ක්‍රියාවලියට සිසුන් යොමු කෙරෙන අතර, ගුරුවරයා සිසුන් අතර ගැවසෙමින් ඔවුන් ඉටු කරන කාර්යය නිරීක්ෂණය කරමින් මාර්ගෝපදේශකත්වය සපයමින් කටයුතු කිරීම පාසල පදනම් කරගත් ඇගයීම් වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමේ දී අපේක්ෂා කෙරේ. මෙහි දී ශිෂ්‍යයා නිරතුරු ව ඇගයීමට ලක් විය යුතු අතර ශිෂ්‍ය හැකියා සංවර්ධනය අපේක්ෂිත අන්දමින් සිදු වන්නේ දැයි ගුරුවරයා විසින් තහවුරු කරනු ලැබිය යුතු වෙයි.

ඉගෙනීම සහ ඉගැන්වීම මගින් සිදුවිය යුත්තේ සිසුනට නිසි අත්දැකීම් ලබා දෙමින් ඒවා සිසුන් විසින් නිසි පරිදි අත්පත් කරගෙන තිබේ දැයි තහවුරු කරගැනීම ය. ඒ සඳහා නිසි මාර්ගෝපදේශය සැපයීම ය. ඇගයීමේ (තක්සේරු කිරීමේ) යෙදී සිටින ගුරුවරුන්ට තම සිසුන් සඳහා දෙයාකාරයක මාර්ගෝප-දේශකත්වය ලබාදිය හැකි ය. එම මාර්ගෝපදේශ පොදුවේ හැඳින්වෙන්නේ ප්‍රතිපෝෂණය (Feed Back) හා ඉදිරි පෝෂණයය (Feed Forward) යනුවෙනි. සිසුන්ගේ ප්‍රබලතා හා දුබලතා අනාවරණය කොටගෙන ඒවා වැඩි දියුණු කිරීම ඉදිරි පෝෂණයෙන් අපේක්ෂිත ගුරු කාර්යය වෙයි.

ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලියේ සාර්ථකත්වය සඳහා පාඨමාලාවේ අරමුණු අතුරෙන් කවර අරමුණු කවර මට්ටමින් සාක්ෂාත් වූයේ දැයි හඳුනාගැනීම අවශ්‍ය වෙයි. ඇගයීම් වැඩ පිළිවෙළ ඔස්සේ සිසුන් ළඟා කරගත් ප්‍රවීණතා මට්ටම් නිශ්චය කිරීම මේ අනුව ගුරුවරුන්ගෙන් බලාපොරොත්තු වන අතර සිසුන් හා සන්නිවේදනය කිරීමට ගුරුවරුන් යොමු විය යුතු ය. මෙ සඳහා යොදාගත හැකි හොඳ ම ක්‍රමය වන්නේ පාසල පදනම් කරගත් ඇගයීම් ක්‍රමය යි.

යථෝක්ත අරමුණ සහිත ව ක්‍රියා කරන ගුරුවරුන් විසින් තම ඉගැන්වීම් ක්‍රියාවලියත් සිසුන්ගේ ඉගෙනුම් ක්‍රියාවලියත් කාර්යක්ෂම කිරීම පිණිස වඩාත් හොඳ කාර්යක්ෂමතාවෙන් යුක්ත ඉගෙනුම් ඉගැන්වීම් සහ ඇගයීම් ක්‍රම යොදාගත යුතු වෙයි. මේ සම්බන්ධයෙන් සිසුන්ට හා ගුරුවරුන්ට යොදාගත හැකි ප්‍රවේශ පිළිබඳ ප්‍රභේද කිහිපයක් මතු දැක්වෙයි. මේවා බොහෝ කලක සිට ගුරුවරුන් වෙත විභාග දෙපාර්තමේන්තුව විසින් ද ජාතික අධ්‍යාපන ආයතනය විසින් ද තොරතුරු සම්පාදනය කරන ලද ක්‍රමවේද වෙයි. එහෙයින් ඒවා සම්බන්ධයෙන් පාසල් පද්ධතියේ ගුරුවරුන් හොඳින් දැනුවත් වී ඇතැයි අපේක්ෂා කෙරේ.

1. පැවරුම්
2. ව්‍යාපෘති
3. සමීක්ෂණ
4. ගවේෂණ
5. නිරීක්ෂණ
6. ප්‍රදර්ශන / ඉදිරිපත් කිරීම
7. ක්ෂේත්‍ර චාරිකා
8. කෙටි ලිඛිත පරීක්ෂණ
9. ව්‍යුහගත රචනා
10. විවෘත ග්‍රන්ථ පරීක්ෂණ
11. නිර්මාණාත්මක ක්‍රියාකාරකම්
12. ශ්‍රවණ පරීක්ෂණ
13. ප්‍රායෝගික ක්‍රියාකාරකම්
14. කථනය
15. ස්වනිර්මාණ
16. කණ්ඩායම් ක්‍රියාකාරකම්
17. සංකල්ප සිතියම
18. ද්විත්ව සටහන් ජර්නල
19. බිත්ති පුවත්පත්
20. ප්‍රශ්න විචාරාත්මක වැඩ සටහන්
21. ප්‍රශ්න හා පිළිතුරු පොත්
22. විවාද
23. සාකච්ඡා මණ්ඩල
24. සම්මන්ත්‍රණ
25. ක්ෂණික කථා
26. භූමිකා රංගන

හඳුන්වා දී ඇති මෙම ඉගෙනුම්, ඉගැන්වීම් ක්‍රම සෑම එකක් ම සෑම විෂයක් සම්බන්ධයෙන් සෑම විෂය ඒකකයකට ම යොදාගත යුතු යැයි අපේක්ෂා නොකෙරෙයි. තම විෂයයට, විෂය ඒකකයට ගැළපෙන ප්‍රභේදයක් තෝරාගැනීමට ගුරුවරුන් දැනුවත් විය යුතු ය; වග බලාගත යුතු ය. එහි දී පහත වගුවෙහි දැක්වෙන ආකාරයට උචිත නිර්ණායක පදනම් කරගෙන ඇගයීම් ආධාරක සකස් කොට ඇගයීම් කාර්යය සිදු කළ යුතු වේ.

## ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ප්‍රවර්ධනය කිරීමේ නිදර්ශක ආධාරකය

1. පාසල් වාරය :- පළමු වාරය
2. ආධාරක අංකය. :- 01
3. ආවරණය කෙරෙන නිපුණතා මට්ටම්. :- 1,1 1.2 1.3
4. ආවරණය කෙරෙන විෂය සන්ධාරය. :-
   - පාලි ව්‍යාකරණ
5. ආධාරකයේ ස්වභාවය :- ප්‍රශ්න හ පිළිතුරු පොත්
6. ආධාරකයේ අරමුණු :-
   - පාලි ව්‍යාකරණය පිළිබඳ ක්‍රමානුකූල දැනුමක් ලබා ගැනීම
   - ඒ ඒ ව්‍යාකරණාංග පිළිබඳ සරල අවබෝධයක් ලබාදීම
   - පදයක් දුටු සැණින් එය කවර ව්‍යාකරණාංගයකට, ව්‍යාකරණාංගවලට අයත් දැයි කීමට හැකි පිරිසක් බිහි කිරීම
   - ව්‍යාකරණානුකූල ව අර්ථ ගැන්වීමට පෙළඹවීම
   - කේවල හෝ කණ්ඩායම් වශයෙන් තොරතුරු රැස්කිරීම
   - දත්ත සමූහයක් නිර්මාණාත්මකව ඉදිරිපත් කිරීම
   - අන්‍යෝන්‍ය සහයෝගයෙන් කටයුතු කිරීමට පෙළඹවීම
   - කිසියම් වූ එක් ඉලක්කයක් ඉටු කර ගැනීමට සිසුන් යොමු කිරීම
7. ආධාරකය ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස්.

**ගුරු උපදෙස්** :-

- එක් එක් ශිෂ්‍යයාට හෝ සිසුන් කණ්ඩායම් කර ව්‍යාකරණ මාතෘකා එක බැගින් ලබා දෙන්න.
- ඒ ඒ මාතෘකාවට අදාළ තොරතුරු ලබා ගත හැකි පොත්, ලිපි ලේඛන සපයා දෙන්න.
- තොරතුරු පිළිවෙළට එක්රැස් කොට තබා ගැනීමට උපදෙස් දෙන්න.
- ඒ ඒ ව්‍යාකරණාංගය ආවරණය වන පරිදි ප්‍රශ්න 10 බැගින් ලබා දෙන්න.
- එම ප්‍රශ්නවලට සිසුන් ගෙන් ලිඛිත පිළිතුරු ලබා ගන්න.

**සිසු උපදෙස්** :-

- තමාට පහසු ව්‍යාකරණාංගයක් ගුරුවරයා වෙතින් ලබා ගන්න.
- ගුරුවරයා විසින් දෙන ලද ප්‍රශ්නවලට රැස්කර ගත් තොරතුරුවලින් පිළිතුරු සපයන්න.
- ඒ ඒ ප්‍රශ්න යටින් පිළිතුරු සපයමින් ප්‍රශ්න 10 ම පිළිතුරු සපයා ප්‍රශ්න හා පිළිතුරු පොතක් සකසා ඉදිරිපත් කරන්න.

| නිර්ණායකය<br><br>සිසුන්ගේ නම් | මාතෘකාවට අදාළ බව | කරුණුවල නිවැරදි බව | ලිපි පිළිවෙළ සැකසීම | දත්තවල ප්‍රමාණාත්මක බව | නිර්මාණාත්මක බව | එකතුව |
|---|---|---|---|---|---|---|
| 1<br><br>2<br><br>3 | | | | | | |

**ලකුණු පරාසය**

- ඉතා හොඳයි 04
- හොඳයි 03
- මධ්‍යස්ථයි 02
- සංවර්ධනය විය යුතුයි 01

මුලින් ලකුණු 20ක් ප්‍රදානය කොට දෙවනු ව එය 2න් බෙදා අවසාන ලකුණු සටහන් කළ යුතු ය. ශිෂ්‍යයා ලබාගත් ලකුණු ඔත්තේ සංඛ්‍යාවක් නම් 2න් බෙදූ විට ඉතිරියක් වන නිසා එය ධනාත්මක අගයකින් පූර්ණ සංඛ්‍යාවකට වටයන්න. මේ ලකුණු ඇසුරෙන් ශිෂ්‍ය නිපුණතා මට්ටම තීරණය කෙරේ.

9-10 - විශිෂ්ට නිපුණතා මට්ටම
8 - ඉහළ මට්ටමේ නිපුණතාව
6-7 - සම්මාන මට්ටමේ නිපුණතා
4-5 - ආසන්න මට්ටමේ නිපුණතාව
3 - නිපුණතාවට ළඟා නොවූ

මේ නිදර්ශන ආධාරකයක් පමණි. ගුරුවරයාට ස්වාධීනව නිදර්ශක ආධාරක සැලසුම් සකස් කර ගත හැකි ය.